# සිංහල

## ගුරු මාර්ගෝපදේශය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

මූලික පිරිවෙණ

3

ශ්‍රේණිය

මුද්‍රණය සහ බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

සිංහල - 3 ශ්‍රේණිය, මූලික පිරිවෙණ
ගුරු මාර්ගෝපදේශය
2019/S/03/පිරි/TG/5-3/1700

ISBN 978-955-25-0495-2
P01
2010394
TG PIRI: SINHALA - GR 3
Rs. 130.00

# සිංහල

## මූලික පිරිවෙණ

# ගුරු මාර්ගෝපදේශය

# 3 ශ්‍රේණිය

(2019 සිට ක්‍රියාත්මක වේ)

**පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**
**අධ්‍යාපන අමාත්‍යාංශය**
**ශ්‍රී ලංකාව**


**පිරිවෙන් අධ්‍යාපන ඒකකය**
**සිංහල භාෂා දෙපාර්තමේන්තුව**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**ශ්‍රී ලංකාව**

වෙබ් අඩවිය: www.nie.lk
විද්‍යුත් ලිපිනය: info@nie.lk

වෙබ් අඩවිය: www.pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය: : pirivena@moe.gov.lk

මුද්‍රණය හා බෙදාහැරීම – අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සිංහල**
මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය
3 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය : 2019
(C) ජාතික අධ්‍යාපන ආයතනය
(C) පිරිවෙන් අධ්‍යාපන ශාඛාව අධ්‍යාපන අමාත්‍යාංශය

ISBN 978-955-25-0495-2

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය: www.pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය : pirivena@moe.gov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය: www.nie.lk
විද්‍යුත් ලිපිනය: info@nie.lk

මුද්‍රණය: එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්
නො. 49, ජයන්ත වීරසේකර මාවත,
කොළඹ 10.

# ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය

පිරිවෙන් තුළ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සවිබල ගන්වමු. අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාවේ මූලිකත්වයෙන් සහ ජාතික අධ්‍යාපන ආයතනයේ තාක්ෂණික සහයෝගයෙන් මූලික පිරිවෙන් 1-5 ශ්‍රේණි සඳහා ප්‍රථම වතාවට ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම සම්බන්ධ ව අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සතුටට පත්වෙමි.

ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සඵලදායි බව උදෙසා පෙළ පොත් සහ විෂය නිර්දේශ මෙන් ම ගුරු මාර්ගෝපදේශවලින් ද සැලසෙනුයේ ඉතා වැදගත් පිටුබලයකි. මෑතකාලීන ව මෙරට අධ්‍යාපන පද්ධතියෙහි ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම වෙනුවෙන් සංවර්ධනාත්මක තීන්දු තීරණ රැසක් ක්‍රියාවට නංවා ඇති අතර, පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනයට ද එහි දී විශේෂ අවධානය යොමු කර ඇති බව සතුටින් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙන ඇති මෑතකාලීන ක්‍රියාමාර්ග අතරට එක්වන තවත් සුවිශේෂ පියවරක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමේ වැඩපිළිවෙළ හැඳින්විය හැකි අතර, මූලික පිරිවෙන් අධ්‍යාපන විෂය නිර්දේශවලට ඇතුළත් ව ඇති සෑම විෂයයක් ම ආවරණය කරමින් සකස් කර ඇති ගුරු මාර්ගෝපදේශ සියල්ල පිරිවෙන් සිසුන්ගේ ඉගෙනුම් කාර්ය සාධනය ඉහළ නංවා ලීම උදෙසා සැබෑ මෙහෙවරක් වනු ඇති බව ද මගේ විශ්වාසය යි.

මෙම සද්කාර්යය වෙනුවෙන් දායක වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යක්ෂතුමා සහ නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද, කෘතවේදී ස්තුතිය පිරිනමමි.

**අකිල විරාජ් කාරියවසම්**

අධ්‍යාපන අමාත්‍ය

# අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදායය සුරකිමින් ත්‍රිවිධ ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ථේරවාදී භික්ෂු සමාජයේ මනා පැවැත්මට උර දිය හැකි ධර්මධර හා විනයධර භික්ෂු පිරිසක් හා ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි ආධ්‍යාත්මික සංවර්ධනයකින් හෙබි පුරවැසියන් පිරිසක් බිහි කර ගැනීම පිරිවෙන් අධ්‍යාපනයේ අපේක්ෂිත ය. අනාගත ලෝක ප්‍රජාවේ යහපැවැත්ම සඳහා වූ ආදර්ශවත් පුරවැසියන් පිරිසක් බිහි කිරීමේ වගකීමෙන් අපට මිදිය නොහැකි ය.

කාලීන ව වෙනස් වන ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ තාක්ෂණික ක්‍රමශිල්පයන් හා විවිධ කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයන් අනුගමනය කරමින් පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව බලාත්මක කළ යුතුය. මානව හා භෞතික සම්පත් මනාව උපයෝජනය කර ගැනීමටත් විෂයමාලාව හා පන්ති කාමර කළමනාකරණය ඇතුළු  කළමනාකරණ ක්‍රියාවලිය වගකීමෙන් හා වගවීමෙන් යුක්ත ව හසුරුවාලීම ගුරුභූමිකාවට ආදර්ශයකි.

කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි විශ්වීය පුරවැසියකු නිර්මාණය කිරීමේ  අභියෝගයට ශක්තිමත් ව මුහුණ දීමට මෙම ගුරු මාර්ගෝපදේශය, ඔබට මහඟු පිටිවහලක් වනු ඇත.

ශිෂ්‍ය ප්‍රජාවේ විවිධත්වය හඳුනා ගෙන වඩාත් උචිත ක්‍රමශිල්පයන් යොදා ගනිමින් ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය ජාතික අධ්‍යාපන අරමුණු, පරමාර්ථ හා සුවිශේෂ ව පිරිවෙන් අභිමතාර්ථ සාධනයට සියලු ම පිරිවෙන් ගුරු ප්‍රජාව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

**එම්. එන්. රණසිංහ**
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තුතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නොවී නව ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳ ව යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ව ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සංග්‍රහය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත.  ක්‍රියාකාරකම් පදනම් කරගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙමගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂයමාලාවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත්දායකයන්ටත් මාගේ ස්තුතිය පිරිනැමේ.

**ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය.

# පෙරවදන

පිරිවෙණ ශ්‍රී ලාංකේය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණී තලය තුළ ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසු කර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වෙත අවිච්ඡින්න ව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දැ හිතකාමී ජන සමාජයක් පිරිවෙණ මගින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේ සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙණ මගින් සිදු වූ මෙහෙය අනුපමේයය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂා කර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදක වන විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කර වීම හා මූලික පිරිවෙන සඳහා පෙළ පොත් 54ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මගින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදක වන විෂයමාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදු වන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක් ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තුතිය පිරිනමමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල.
2019.04.10.

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකේය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහිවීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමු ව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුව යි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එක ම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනයයි. එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ 'පිරිවෙණ'ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ සෘජු දායකත්වයක් නො තිබිණි.

පිරිවෙන් අංශයක්/දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකිදැයි නිතර අප පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගරු අධ්‍යාපන ඇමතිතුමන්, 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන්, එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශිර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස් වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ 2017-03-16 දිනැති 412.5/12 IM No.5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යවලට දායක වීමට ජාතික අධ්‍යාපන ආයතනයට සෘජු ව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුද්ද, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කර ගනිමින් පිරිවෙන් පන්ති කාමරයෙහි අවදිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙන්වල ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් තම පන්ති කාමරය තුළ ශිෂ්‍ය මිත්‍රභාවයෙන් හා ප්‍රබෝධාත්මක ව කටයුතු කරමින් ඉහළ සාධනයක් කරා පිරිවෙන් අධ්‍යාපනය නංවාලීමට උත්සුක වන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය.

## පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය

මහින්දාගමනයෙන් පසු ලක්දිව ශාසන ප්‍රතිෂ්ඨාපන කාර්යයේ දී මහා අරිට්ඨ තෙරුන් විසින් මහා මහින්ද තෙරුන් මුලසුන තබා ථූපාරාම විහාරයේ ධර්ම මණ්ඩපයේ දී මත්තාභය තෙරුන් ප්‍රමුඛ 500ක් සංඝයා වහන්සේට විනය ඉගැන්වීමේ රාජ්‍ය මහෝත්සවයෙන් ලක්දිව පාරිවේණික අධ්‍යාපනය ආරම්භ කෙරිණ. එවක් පටන් විවිධ අවධීන්හි උන්නතියට හා අවනතියට ලක්වෙමින් ලක්වැසි ගිහි පැවිදි සුවහස් සංඛ්‍යාත ප්‍රජාවට පිරිවෙන් අධ්‍යාපනයෙන් වූ සේවාව මහාර්ඝ ය. පිරිවෙණ මගින් සාරධර්ම අධ්‍යාපනය කේන්ද්‍ර කර ගත් සමය හා සමයාන්තර ඥාණයත්, සම්භාව්‍ය හා නූතන භාෂාවනුත්, ශිල්ප කලා ඥාණයත්, ජ්‍යෝතිර්විද්‍යා වාස්තුවිද්‍යා ඥාණයත් ආදි ඥාණ සම්භාරයත්, කාලීන අධ්‍යාපනය අනුව පුද්ගල පෞරුෂයට අවශ්‍ය සියලු සාධකයනුත් සම්පාදිත කෙරේ.

21 වන සියවසේ අධ්‍යපන ක්ෂේත්‍රය නිපුණතා පාදක ක්‍රමයට නැඹුරු විය. පිරිවෙන් අධ්‍යාපනයට නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය ආගන්තුක නොවුණ ද පිළිගත් ක්‍රමශිල්ප ඔස්සේ පිරිවෙණට අවශ්‍ය විෂය නිර්දේශ හා පෙළ පොත් සම්පාදනය කෙරිණ. එමගින් ශිෂ්‍ය නිපුණතා මට්ටම අනුක්‍රමයෙන් වර්ධනය වන ශිෂ්‍ය මිතුරු පාඨමාලාවක් පිරිවෙන්වලට ඉදිරිපත් කෙරිණි.

ගුරුභවතුන්ට අවශ්‍ය පාඩම් සැලසුම් කිරීම සහ මිනුම් ඇගයුම් ක්‍රම හා තක්සේරුකරණය සඳහා අවශ්‍ය ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කර දීම පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසයේ පළමු වරට සිදුකරන්නට ලැබීම පිළිබඳ අනතිමානී ආනන්දයක් ලබමි. පංතිකාමරය තුළ වඩාත් ඵලදායී ගුරුවරයකු වීමට ගුරු මාර්ගෝපදේශයේ එන උපදෙස්, ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් යොදා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. පාරිවේණික ගිහි පැවිදි සිසුන්ට අවශ්‍ය මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගැනීමට ඔබට මේ ගුරු මාර්ගෝපදේශය මහෝපකාරී වනු ඇතැයි සිතමි.

මේ මහඟු කාර්යය යථාර්ථයක් බවට පත් කිරීමේ දී සහය වූ ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයටත්, පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ කාර්ය මණ්ඩලයටත්, උපදේශකත්වය, සම්බන්ධීකරණය, විෂය නියාමනය හා විවිධ අයුරින් සම්පත් දායකත්වය සැපයූ සියලු පාර්ශ්වයන්ටත්, මාගේ කෘතඥතාව පිරිනමමි.

**විජිත වෙලගෙදර**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

# ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

**උපදේශකත්වය හා අනුමැතිය :**

ජාතික අධ්‍යාපන ආයතනය සහ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව. අධ්‍යාපන අමාත්‍යාංශය.

**මෙහෙයවීම :**

ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය.

විජිත වෙලගෙදර
අධ්‍යක්ෂ
පිරිවෙන් ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය.

**අධීක්ෂණය :**

ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය.

එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම
අධ්‍යක්ෂ
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

**සම්බන්ධීකරණය :**

පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ඒකක ප්‍රධාන
පිරිවෙන් අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය.

පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය.

**විෂය නියාමනය :**

එම්. ජී. මුණසිංහ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

**විෂය විශේෂඥ උපදේශනය :**

ආචාර්ය පූජ්‍ය මොරකන්දේගොඩ අරියවංස හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
රුහුණ විශ්වවිද්‍යාලය
මාතර.

| | |
|---|---|
| **ලේඛක මණ්ඩලය :** | එම්. ජී. මුණසිංහ<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| | පූජ්‍ය තමාඩුවේ පුඤ්ඤානන්ද හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ<br>පිරිවෙන් ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය. |
| | ආර්. කේ. හීන්බණ්ඩා<br>විශ්‍රාමික ගුරු උපදේශක (පිරිවෙන්)<br>51, ප්‍රීතිකා මාවත<br>පිටිපන උතුර<br>හෝමාගම. |
| | කේ. ගුණරත්න<br>දිස්ත්‍රික් ගුරු උපදේශක<br>කෑ./මාව/ශ්‍රී විද්‍යා ශ්‍රී මහ පිරිවෙන<br>පරපේ, රඹුක්කන. |
| | එස්. ඕ. ප්‍රනාන්දු<br>විශ්‍රාමික අධ්‍යක්ෂ<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **භාෂා සංස්කරණය :** | එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම<br>අධ්‍යක්ෂ<br>සිංහල භාෂා දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයයතනය. |
| **පරිගණක වදන් :** | අනුලා නන්දනී රාජපක්ෂ<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **පිටකවර නිර්මාණය :** | |
| **විවිධ සහාය :** | පූජ්‍ය මාදෝවිට වජිරබුද්ධි හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>අධ්‍යාපන අමාත්‍යාංශය. |
| | පූජ්‍ය හල්වල ආනන්ද හිමි<br>මැදගොඩලන්ද පුරාණ විහාරය<br>අතුරුගිරිය. |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

මූලික පිරිවෙන් විෂයමාලාවේ සිංහල විෂයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථකව ඉටුකර ගැනීමට මග පෙන්වීම සඳහා මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත. ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සකස් කර තිබූ සිංහල විෂය නිර්දේශය හා පෙළ පොත මේ සඳහා පදනමක් ලෙස යොදා ගැනිණි. විෂය නිර්දේශයේ ඇතුළත් වූ නිපුණතා හා නිපුණතා මට්ටම් දැඩි වෙනසකට ලක් නොකොට ගුරු මාර්ගෝපදේශය සඳහා ක්‍රියාකාරකම් සකස් කෙරිණි. නිපුණතා මට්ටම් සාක්ෂාත් වන පරිදි ඉගෙනුම් පල අලුතින් සකස් කිරීමට සිදු විය. මෙහි දැක්වෙන ක්‍රියාකාරකම්වලින් මූලික පිරිවෙන් පන්තිවලට ඉගැන්වීම සඳහා පාඩම් සැලසුම් සකස් කර ගැනීමට උපදෙස් ලබා දී තිබේ. ඒ අනුව සිංහල විෂය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඵලදායීව සිදුකර ගැනීම සඳහා එම උපදෙස් අනුගමනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මීට පෙර පිරිවෙන් විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා ගුරු මාර්ගෝපදේශ නොතිබූ අතර පිරිවෙන් ගුරුවරු තම අභිමතය පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කළහ. එසේ වූ විට එක් එක් පිරිවෙන්වල විෂය ඉගැන්වීම එකිනෙකින් වෙනස් වීමත් සමාන ඉගෙනුම් අවස්ථා ශිෂ්‍යයන්ට නොලැබීයාමත් අනිවාර්යයෙන් ම සිදු වේ. එය විධිමත් අධ්‍යාපන ක්‍රියාවලියට මෙන්ම විධිමත් ඇගයීම් ක්‍රියාවලියට ද බාධාකාරී තත්ත්වයකි. එනිසා පිරිවෙන් විෂයමාලාවට ගුරු මාර්ගෝපදේශ සකස් කර දීමෙන් මෙකී තත්ත්වය අවම කිරීමට හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පිරිවෙන්වල මෙතෙක් පැවති සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද වෙනස් කිරීමට මෙමගින් උපදෙස් දෙනු නොලැබේ. පැරණි දේ සුරකිමින් නව ඉගෙනුම් ඉගැන්වීම් අවස්ථා සම්පාදනය කිරීම බලාපොරොත්තු වේ. ඒ සඳහා නව තාක්ෂණය යොදා ගැනීම හා කණ්ඩායම් ඉගෙනුම් ක්‍රම භාවිත කිරීම ආදි උපදෙස් මෙමගින් ලබා දී ඇත.

විධිමත් ඉගෙනුම් අවස්ථා සම්පාදනය කර ගැනීම සඳහා එක් එක් නිපුණතා සඳහා ක්‍රියාකාරකම් සන්තතියක් මෙහි ඇතුළත් වේ. එක් නිපුණතාවක් ඉටුකර ගැනිම සඳහා නිපුණතා මට්ටම් දෙකක් හෝ කිහිපයක් විෂය නිර්දේශයෙහි දක්වා ඇත. එක් නිපුණතා මට්ටමක් සඳහා අවම වශයෙන් එක් ක්‍රියාකාරකමක් හෝ මෙහි ඇතුළත් කර ඇත. එම ක්‍රියාකාරකම සකස් කර ඇත්තේ එහි සඳහන් ඉගෙනුම් පල ඉටුකර ගැනීමට හැකි වන පරිදි ය. ඔබ පාඩම් සැලසුම් සකස් කිරීමේ දී එම ඉගෙනුම් පලවලින් සුවිශේෂ ඉගෙනුම් පල කාලච්ඡේදයට හා ශිෂ්‍ය මට්ටමට ගැළපෙන පරිදි සකස් කර ගත යුතු ය. ඔබ විසින් සකස් කර ගත් ඉගෙනුම් පල ඉටු වන පරිදි පියවර කිහිපයකින් යුත් පාඩම් සැලසුමක් මේ අනුව සකස් කර ගත යුතු ය. ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ඔබ සතු නිර්මාණශීලීත්වයට එමගින් ඉඩ සලසා ඇත.

ඉගෙනුම් පල මැන බැලීම සඳහා තක්සේරුකරණ ක්‍රියාවලියක් පවත්වා ගෙන යාම අවධාරණය කෙරේ. ඒ සඳහා නිර්ණායක ද මෙහි දක්වා ඇත. ඔබ සකස් කරන ඉගෙනුම් පල මැනීම සඳහා ද ගැළපෙන නිර්ණායක සකස් කරගත යුතු වේ. සෑම ඉගෙනුම් අවස්ථාවක් ම ඉගෙනුම් පල, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් හා ඉගෙනුම් පල ඇගයීමේ නිර්ණායක යන සංරචක තුනකින් සමන්විත වේ. ඔබේ පාඩම් සැලසුම් ද එම සංරචක තුනෙන් යුක්ත වීම අනිවාර්ය වන අතර එම සංරචක තුනේ අන්‍යොන්‍ය සම්බන්ධය තිබීම ද අත්‍යවශ්‍ය වේ. විෂය කරුණු කියා දීම පමණක් ප්‍රමාණවත් නැත. ඉගෙනුම මැන බැලීම සඳහා තක්සේරුකරණ ක්‍රියාවලියක් තිබීම ද ඒ සඳහා නිර්ණායක තිබීම ද අත්‍යවශ්‍ය වේ.

ඉගෙනුම් පල, ක්‍රියාකාරකම්, තක්සේරුකරණ නිර්ණායක යන සංරචක තුනට අනුව ඔබේ නිර්මාණශීලි ඉගැන්වීම් රටාව සංවිධානය කර ගැනීමට මෙම ගුරු මාර්ගෝපදේශය ඔබට අත්වැලක් වනු ඇත. එය මැනවින් භාවිත කර ඉගැන්වීම් කාර්යය සාර්ථක කර ගැනීමට හැකි වේවා යන්න අපගේ ප්‍රාර්ථනය යි.

**පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන
පිරිවෙන් අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය.

# පටුන


ගුරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය iii

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය iv

අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය v

පෙරවදන vi

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය vii

පිරිවෙන් අධ්‍යක්ෂගේ පණිවිඩය viii

ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය ix-x

ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් xi-xii

3 ශ්‍රේණියේ සිංහල වාර නියමය xiv

ජාතික අරමුණු xv

මූලික නිපුණතා xvi-xvii

විෂය අධ්‍යයනයේ අරමුණු xviii

විෂය නිර්දේශය - 3 ශ්‍රේණිය xix-xxix

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්** xxx

**01.** අක්ෂර මාලාව 1
02. අක්ෂර මාලාව (අක්ෂර උත්පත්ති ස්ථාන) 3
03. ණ, න, ල, ළ භේදය 5
04. සන්ධි 7
05. සමාස 9
06. තද්ධිත හා කෘදන්ත 11
07. ලිංග භේදය 13
08. අව්‍යය පද 15
09. ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය හා නාම විභක්ති ප්‍රත්‍යය 17
10. වාක්‍ය නිර්මාණය (සරල වාක්‍ය හා සංකීර්ණ වාක්‍ය) 19
11. වාක්‍ය නිර්මාණය 22
12. සාම්ප්‍රදායික යෙදුම් 24
13. රචනා 26
14. විරාම ලක්ෂණ 29
15. සාරාංශය 30
16. ප්‍රායෝගික ලේඛන 33
17. උම්මග්ග ජාතකය (නිර්දිෂ්ට කෘති) 40
18. බුදුගුණ අලංකාරය (නිර්දිෂ්ට කෘති) 42
19. විෂය සමගාමී ක්‍රියාකාරකම් (විද්‍යුත් මාධ්‍ය වැඩ සටහන්වලට සවන්දීම) 44
20. විෂය සමගාමී ක්‍රියාකාරකම් (සාකච්ඡාවකට සවන්දීම) 48
21. විෂය සමගාමී ක්‍රියාකාරකම් (ප්‍රවෘත්ති ප්‍රකාශයකට සවන්දීම) 51
22. විෂය සමගාමී ක්‍රියාකාරකම් (උත්සව අවස්ථාවක කතාවක්) 54
23. සාහිත්‍ය රසාස්වාදය 56
24. වනකතා (නිර්දිෂ්ට කෘති) 58
25. විෂය සමගාමී ක්‍රියාකාරකම් (දේශාභිමානි ගී) 60

## මූලික පිරිවෙණ
## 3 ශ්‍රේණිය සිංහල
## වාර නියමය

| වාරය | පෙළ පොතේ පා. අං | ගු.මා. ශි. අංකය | ශි. ම. | විෂය අන්තර්ගතය පෙළ පොත සඳහා මාර්ගෝපදේශය – පෙළ (පාඩම්) | ක්‍රියාකාරකම් | කාලච්ඡේද |
|---|---|---|---|---|---|---|
| 1 | 01 | 01 | 1.1 | අක්ෂර මාලාව | අක්ෂර මාලාව | 03 |
| | | 02 | 1.2 | | අක්ෂර ප්‍රභේද | 04 |
| | | 03 | 1.3 | | ණ, න, ල, ළ භේදය | 05 |
| | 02 | 04 | 2.1 | | සන්ධි | 06 |
| | | 05 | 2.2 | සන්ධි, සමාස, තද්ධිත, කෘදන්ත | සමාස | 06 |
| | | 06 | 2.3 | ලිංග භේදය | තද්ධිත, කෘදන්ත | 05 |
| | | 07 | 2.4 | | ලිංග භේදය | 05 |
| | 06 | 08 | 2.5 | අව්‍යය පද | අව්‍යය පද | 05 |
| | 03 | 09 | 2.6 | | ආඛ්‍යාත විභක්ති හා නාම විභක්ති | 05 |
| | 07 | 10 | 2.7 | | වාක්‍ය නිර්මාණ | 05 |
| | 04, 05 | 11 | 2.8 | | නෛපාතික කෘදන්ත | 05 |
| 2 | 08 | 3.1 | | සාම්ප්‍රදායික යෙදුම් | සාම්ප්‍රදායික යෙදුම් | 05 |
| | 09 | 13 | 4.1 | රචනය | රචනා ලිවීම | 05 |
| | 13 | 14 | 4.2 | විරාම ලක්ෂණ | විරාම ලක්ෂණ | 03 |
| | 11 | 15 | 4.3 | සාරාංශය | සාරාංශය | 05 |
| | 12 | 16 | 5.1 | ප්‍රායෝගික ලේඛන | ලිපි ලිවීම | 05 |
| | | 17 | 6.1 | - | උම්මග්ග ජාතකය | 15 |
| | 10 | 18 | 6.2 | අර්ථාවබෝධය | බුදුගුණ අලංකාරය | 21 |
| 3 | | 19 | 7.1 | | විෂය සමගාමී ක්‍රියාකාරකම් | 04 |
| | | 20 | 7.2 | | විෂය සමගාමී ක්‍රියාකාරකම් | 04 |
| | | 21 | 7.3 | | ප්‍රවෘත්ති හා විස්තර ප්‍රකාශන (විෂය සමගාමී ක්‍රියාකාරකම්) | 04 |
| | | 22 | 8.1 | | උත්සව අවස්ථාවක කතාවක් | 04 |
| | 14 | 23 | 9.1 | රසාස්වාදය | | 10 |
| | | 24 | 10.1 | - | වනකතා | 15 |
| | | 25 | 10.2 | - | දේශාභිමානී ගී (විෂය සමගාමී ක්‍රියාකාරකම්) | 03 |

# ජාතික අරමුණු

සාමාන්‍ය අධ්‍යාපනය අත්‍යවශ්‍යයෙන්ම පහත දී ඇති ජාතික අරමුණු සාක්ෂාත් කරගැනීමට යොමු විය යුතුයි.

i. ජාතික ඒකාබද්ධතාව, ජාතික ඒකාග්‍රතාව සහ ජාතික සමගිය මුදුන්පත් කර ගැනීම.

ii. සමාජ සාධාරණත්වයේ පැතිරෙන රටාව තහවුරු කිරීම.

iii. තිරසාර ජීවන රටාවක පරිණාමය . මානව වර්ගයාගේ ඉතිහාසයේ ප්‍රථම වතාවට වාතය සහ ජලය පවා එසේම යැයි පිළිගත නොහැකි විටක වසර 2000 සහ ඉන් ඔබ්බට අවශ්‍ය වන තිරසාර ජීවන ශෛලියක්.

iv. රැකියා අවස්ථා උත්පාදනය . ඒ සමග ම ඒවා අභිමානවත්, අපේක්ෂා සපුරාලන, ස්වාර්ථ සාධන වීම.

v. ඉහත සැකිල්ල තුළ ජාතිය උදෙසා සිදු කෙරෙන වර්ධනය පිළිබඳ සමුච්චිත ව්‍යුහය වෙත යොමු වන මානව සම්පත් සංවර්ධනයේ දී සැමටම සහභාගී වීම සඳහා විවිධ හැකියාවන් ස්ථාපිත කිරීම.

vi. එකිනෙකා වෙනුවෙන් දැඩි සහ නොවෙනස් සැලකිල්ල පිළිබඳ අඛණ්ඩ හැඟීමක් ඇතිකර ආරක්ෂා කිරීම ජාතිය ගොඩනැගීමේ කටයුතුවල සක්‍රිය සහභාගීත්ව තහවුරු කළ යුතු වේ.

vii. මෙකල අප ජීවත් වන වේගයෙන් වෙනස්වන ආකාරයේ ලෝකයක් තුළ වෙනස් වීමට අනුවර්තන හැකියාව ඇති මූලික දේවල් වැඩිදියුණු කර සකස්කර ගැනීම අත්‍යවශ්‍යවේ. . වෙනස් වන අවස්ථාවන්ට අනුවර්තනය වීමට ඉගෙනීම . මෙය තමාගේ සහ අන් අයගේ අභිවෘද්ධිය සඳහා වෙනස් වීම මෙහෙය වීමට නිපුණතා සමග සම්බන්ධ කළ යුතුය.

viii. ආරක්ෂාව සහ ස්ථාවරත්වය පිළිබඳ හැඟීමක් ඇති කර ගනිමින් සංකීර්ණ සහ අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමට ඇති හැකියාව වැඩිදියුණු කර ගැනීම.

ix. ජාත්‍යන්තර ප්‍රජාව තුළ ගෞරවනීය ස්ථානයක් අත්පත්කර ගැනීමට සම්බන්ධවන්නා වූ නිපුණතා වර්ධනය කර ගැනීම.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සඳහා යෝජනා . ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව 2016

# මූලික නිපුණතා

අධ්‍යාපනය මගින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත.

i. සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම.

සංඛ්‍යා පිළිබඳ දැනුම: භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

ii. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

. නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය.

. කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා

. ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්.

. චිත්තවේගී බුද්ධිය

iii. පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

ජෛව පරිසරය : සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය . ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව.

iv. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම.

තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.

හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ.

වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම.

යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

v. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

vi. ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාව මගින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

vii. ''ඉගෙනීමට ඉගෙනුම්'' පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

## විෂය අධ්‍යයනයේ අරමුණු

01. ශ්‍රවණය, කථනය, කියවීම සහ ලිවීම යන චතුර්විධ භාෂා කුසලතා වර්ධනය කිරීම.

02. සිංහල භාෂාවේ ව්‍යාකරණය සහ භාෂා සම්ප්‍රදාය පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම.

03. භාෂාවේ වාච්‍යාර්ථ, ලක්ෂ්‍යාර්ථ, ව්‍යංග්‍යාර්ථ වටහා ගැනීම.

04. ප්‍රකාශනය, ව්‍යවහාරය හා අර්ථ ග්‍රහණ ශක්තිය වර්ධනය කරලීම.

05. අවබෝධය, විශ්ලේෂණය, සංස්ලේෂණය සහ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම.

06. සාහිත්‍ය පරිශීලනයෙන් නිර්මාණාත්මක ලේඛන ශෛලීය මූලධර්ම පිළිබඳ දැනුම අවබෝධය ලබා ගැනීම හා වාංමාලාව පෝෂණය කර ගැනීම.

07. විවිධ යුගවලට අයත් සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සාහිත්‍ය විචාර මූලධර්ම අවබෝධ කොටගෙන වින්දනාත්මක හා විචාරාත්මක කුසලතා වර්ධනය කර ගැනීම.

08. සාහිත්‍ය කෘති පරිශීලනයෙන් රසඥතාව වර්ධනය කර ගැනීම තුළින් ජීවිත පරිඥානය පුළුල් කර ගැනීම.

09. විශ්වවිශ්‍රැත සාහිත්‍යයික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි අවබෝධාත්මක පරිශීලනයට යොමු කිරීම.

10. සිංහල සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම පුළුල් කර ගනිමින් සමාජ සංස්කෘතික වටිනාකම් හඳුනා ගැනීම සඳහා පුරාතන සිංහල සාහිත්‍ය කෘති පරිශීලනයට හුරු කිරීම.

11 සිංහල භාෂාවෙන් නිරූපිත භාෂාමය අනන්‍යතාව සහ තදනුබද්ධ සංස්කෘතික අනන්‍යතාව හැදෑරීම.

12. සන්නිවේදන කාර්යය පහසුකරලීම සඳහා සාම්ප්‍රදායික භාෂා උපාංග නිවැරදි ව භාවිතයට හුරු කිරීම.

## විෂය නිර්දේශය
## 3 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01.නූතන සිංහල අක්ෂර මාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් භාවිත කරයි. | 1.1 නූතන සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන, විවිධ ප්‍රභේද යටතේ වර්ග කරයි. | • අක්ෂර මාලාව<br>• අක්ෂර ප්‍රභේදඃ වර්ගාක්ෂර ඝෝෂ-අඝෝෂ, අන්තඃස්ථාක්ෂර | • නූතන සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන නිවැරදි ව අනුපිළිවෙළින් ලියා දක්වයි.<br>• අක්ෂර මාලාව ස්වර ව්‍යංජන වශයෙන් වර්ග කර දක්වයි.<br>• ඝෝෂ-අඝෝෂ අක්ෂර හඳුනා ගෙන වගුගත කරයි.<br>• වර්ගාන්තාක්ෂර යන්න පැහැදිලි කරයි.<br>• අනතඃස්ථාක්ෂරවල උච්චාරණ ස්වභාවය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• සඤ්ඤකාක්ෂර හා ඌෂ්මාක්ෂර නිවැරදි ව ලියා දක්වයි.<br>• ලේඛන කාර්යයේ දී නූතන සිංහල අක්ෂර මාලාව නිවැරදි ව භාවිත කරයි. | 03 |
| | 1.2 අක්ෂර උත්පත්ති ස්ථාන හඳුනා ගෙන භාවිත කරයි. | සඤ්ඤකාක්ෂර, ඌෂ්මාක්ෂර, අක්ෂර උත්පත්ති ස්ථාන | • අකුරු නිවැරදි ව උච්චාරණය කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• අක්ෂර උත්පත්ති ස්ථාන පිළිබඳ අවබෝධයෙන් අකුරු උච්චාරණය කරයි.<br>• කණ්ඨජ, තාලුජ, දන්තජ ආදි වශයෙන් අක්ෂර වර්ග වෙන් වෙන් ව හඳුනා ගෙන කියවයි.<br>• අක්ෂර උත්පත්ති ස්ථාන හඳුනා ගෙන උදාහරණ දක්වයි. | 04 |

## විෂය නිර්දේශය
## 3 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.3 ණ, න, ල, ළ භේදය හඳුනා ගෙන නිවැරදි ව භාවිත කරයි. | • අක්ෂර වින්‍යාසය ණ, න, ල, ළ භේදය | • ලේඛනයේ දී නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිතයේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• ණ, න, ල, ළ භේදය හඳුනා ගෙන නිවැරදි ව ලේඛනයේ යෙදෙයි.<br>• ලිපිලේඛනවල අක්ෂර වින්‍යාසය නිවැරදි කරයි. | 05 |
| 2.0 ලේඛන කාර්යයන් ඉටුකර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනී. | 2.1 ලේඛනයේ දී නිවැරදි ව සාධනය කළ සන්ධි පද භාවිත කරයි. | • සන්ධි, සමාස, තද්ධිත, කෘදන්ත, ලිංග ආදි ව්‍යාකරණාංග පිළිබඳ ව මූලික අවබෝධය | • සන්ධි කිරීම යනු කුමක් දැ'යි පැහැදිලි කරයි.<br>• සන්ධි විධි හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• භාෂාවේ ශබ්ද මූලික කොට ගෙන සන්ධි කාර්ය සිදු වන බව විස්තර කරයි.<br>• පද සන්ධි කිරීමෙන් උච්චාරණ පහසුව ඇති වන අයුරු පැහැදිලි කරයි.<br>• ලේඛන කාර්යයේ දී පද නිවැරදි ව සන්ධි කර ලියයි. | 06 |
| | 2.2 ලේඛනයේ දී නිවැරදි ව සාධනය කළ සමාස පද භාවිත කරයි. | | • සමාස යනු කුමක් දැ'යි හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• සමාස ප්‍රභේද හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• ලේඛනයේ දී ව්‍යක්ත ලෙස සමාස පද භාවිත කරයි. | 06 |

විෂය නිර්දේශය
3 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.3 ලේඛනයේ දී නිවැරදි ව සාධනය කළ තද්ධිත හා කෘදන්ත පද භාවිත කරයි. | | • තද්ධිත හා කෘදන්ත පද වෙන් වෙන් ව හඳුනා ගෙන විස්තර කරයි.<br>• තද්ධිත නාම නිපදවෙන ප්‍රත්‍යය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• කෘදන්ත ප්‍රභේද හැඳින ගෙන ප්‍රකාශ කරයි.<br>• තෙවැදෑරුම් කෘදන්ත පද භාවිතය පැහැදිලි කරයි.<br>• තද්ධිත හා කෘදන්ත නිවැරදි ව භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 05 |
| | 2.4 භාෂාවේ ලිංග භේදය පිළිබඳ ව ප්‍රමාණාත්මක ව පැහැදිලි කරයි. | | • භාෂාවේ ලිංග භේදය යනු කුමක් දැ'යි පැහැදිලි කරයි.<br>• සිදත් සඟරාවේ ලිංග වර්ගීකරණය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• ව්‍යවහාරික භාෂාවේ ලිංගත්‍රයයක් ඇති බව පැහැදිලි කරයි.<br>• ලිංගත්‍රයයේ නාම පද, නාම විභක්තිවල වරනැගෙන ආකාරය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• ස්ත්‍රී ලිංග නාම පද, නිපදවෙන ආකාරය හැඳින ගෙන පැහැදිලි කරයි.<br>• ලිංග භේදය පිළිබඳ අවබෝධයෙන් ලේඛන කාර්යයේ යෙදෙයි. | 05 |

**විෂය නිර්දේශය**
**3 ශ්‍රේණිය**

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.5 අව්‍යය පද නිවැරදි ව භාවිත කරයි | • අව්‍යය පද පිළිබඳ ව මූලික අවබෝධය<br>• අව්‍යය පද නිපාත, උපසර්ග පිළිබඳ ව අවබෝධය | • අව්‍යය පද යනු මොනවා ද'යි පැහැදිලි කරයි.<br>• අව්‍යය පද නිවැරදි ව නම් කරයි.<br>• වාක්‍යය ලිවීමේ දී අව්‍යය පද නිවැරදි ව භාවිත කරයි.<br>• අව්‍යය පදවලින් භාෂාවට ඇති ප්‍රයෝජන පැහැදිලි කරයි. | 05 |
| | 2.6 ලේඛනයේ දී ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය හා නාම විභක්ති ප්‍රත්‍යය නිවැරදි ව භාවිත කරයි. | • ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය හා නාම විභක්ති ප්‍රත්‍යය පිළිබඳ ව සාමාන්‍ය අවබෝධය | • ක්‍රියා පද සාධනය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• ක්‍රියා පද වරනැගීම හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• විභක්ති ප්‍රත්‍යය හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• නාම පද වර්ගීකරණ හැඳින ගෙන පැහැදිලි කරයි.<br>• විවිධ නාම පද විභක්තිවල වරනගයි. | 05 |
| | 2.7 සම්මත භාෂාරීතිවලට අනුව වාක්‍ය නිර්මාණය කරයි. | | • වාක්‍යයක මූලිකාංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• ව්‍යාකරණානුකූල ව වාක්‍ය ලිවීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• සරල වාක්‍ය හා සංකීර්ණ වාක්‍ය මොනවා ද'යි හඳුනා ගෙන විස්තර කරයි.<br>• උක්තානුක්ත පද, ලිංග භේදය, පුරුෂ භේදය හඳුනා ගෙන ලේඛන කාර්යයේ යෙදෙයි.<br>• ලේඛන කාර්යයේ දී සම්මත රීති අනුගමනය කරමින් ලියයි. | 05 |

**විෂය නිර්දේශය**
**3 ශ්‍රේණිය**

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.8 සම්මත රීතිවලට අනුව වාක්‍ය නිර්මාණය කරයි. | • **නේපාතික කෘදන්ත**<br>• **ආඛ්‍යාත පද**<br>ප්‍රයෝජ්‍ය, ප්‍රාර්ථනා ක්‍රියා පිළිබඳ ව මූලික අවබෝධය<br>• **නිපාත ක්‍රියාව**<br>ආවස්ථික ක්‍රියා (අසම්භාව්‍ය) පිළිබඳ ව මූලික අවබෝධය | • ක්‍රියා පද යනු කුමක් දැ'යි ප්‍රකාශ කරයි.<br>• ක්‍රියා පද වර්ග කර දක්වයි.<br>• ක්‍රියා පද සාධනය පැහැදිලි කරයි<br>• ප්‍රයෝජ්‍ය ක්‍රියා, ආශීර්වාද ක්‍රියා හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• නේපාතික කෘදන්ත හඳුනා ගෙන පවසයි.<br>• ලේඛන කාර්යයේ දී සම්මත රීති අනුගමනය කරමින් ලියයි. | 05 |
| 03 භාෂා ක්‍රියාකාරකම් මගින් වාංමාලාව පෝෂණය කර ගෙන භාෂා කාර්යයන්හි දී උචිත පරිදි භාවිත කරයි. | 3.1 සාම්ප්‍රදායික යෙදුම් භාෂා කාර්යයන් සඳහා අර්ථවත් ලෙස යොදා ගනියි. | • **සාම්ප්‍රදායික යෙදුම්**<br>ඉඟි වැකි, ප්‍රස්තාව පිරුළු, ආප්තෝපදේශ (මූලික අවබෝධය) | • සාම්ප්‍රදායික යෙදුම්වල ප්‍රභේද හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• සන්නිවේදනය කාර්යක්ෂම කර ගැනීම සඳහා සාම්ප්‍රදායික යෙදුම් පිටිවහලක් වන බව පැහැදිලි කරයි.<br>• රසවත් ව අදහස් ඉදිරිපත් කිරීමේ දී සාම්ප්‍රදායික යෙදුම් භාවිත කරයි.<br>• ලේඛන කාර්යයන්හි දී සාම්ප්‍රදායික යෙදුම් සුදුසු පරිදි භාවිත කරයි. | 05 |

**විෂය නිර්දේශය**
**3 ශ්‍රේණිය**

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 04 අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 4.1 උචිත පරිදි කරුණු සංවිධානය කරමින් අදහස් නිරවුල් ව ඉදිරිපත් කරයි. | • **රචනය** මාතෘකාවට අදාළ රචනා | • රචනාවක ආකෘතිය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• රචනාවක අංග පැහැදිලි කරයි.<br>• නිවැරදි භාෂාරීති අනුගමනය කරමින් රචනා ලියයි.<br>• රචනා ලිවීමේ දී ශිල්පීය දක්ෂතා භාවිත කරයි.<br>• නිර්මාණාත්මක ව රචනා ලියයි. | 05 |
| | 4.2 ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් ලියයි. | • **විරාම ලක්ෂණ** ඇල ඉර, දෙතිත, තිත්පෙළ | • විරාම ලක්ෂණ නිවැරදි ව හඳුනා ගෙන නම් කරයි.<br>• විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• ලේඛන කාර්යයේ දී විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කරයි. | 03 |

## විෂය නිර්දේශය
## 3 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච් ඡේද |
|---|---|---|---|---|
| | 4.3 පාඨයක අන්තර්ගතය හකුළුවා ව්‍යක්ත ලෙස ඉදිරිපත් කරයි. | • **සාරාංශය** සාරාංශකරණය පිළිබඳ ව රීති ඇසුරින් මූලික අධ්‍යයනය | • සාරාංශය යනු කුමක් ද'යි පැහැදිලි කරයි.<br>• සාරාංශකරණයේ රීති හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• අදහස් සංක්ෂිප්ත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.<br>• රීති අනුගමනය කරමින් ඡේද හා කොටස් අවබෝධයෙන් යුතු ව සාරාංශ කර ලියයි. | 05 |
| 05 ජීවන අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි. | 5.1 නිරවුල් ව හා සංක්ෂිප්ත ලෙස ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි. | • **ප්‍රායෝගික ලේඛන** රාජකාරි ලිපි, විදුලි පුවත්, ටෙලිමේල් | • රාජකාරි ලිපියක ආකෘතිය ඉදිරිපත් කරයි.<br>• ලිපි ලිවීමේ ශිල්පීය ප්‍රයෝග භාවිත කරයි.<br>• යෝග්‍ය ආකෘති භාවිත කරමින් ලිපි ලියයි.<br>• විදුලි ටෙලිමේල් පණිවිඩයක මූලිකාංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• විදුලි ටෙලිමේල් පණිවිඩයක ආකෘතිය පැහැදිලි කරයි.<br>• ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් ටෙලිමේල් ආකෘති සම්පූර්ණ කරයි. | 05 |

විෂය නිර්දේශය
3 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 06. ජීවන අද්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනී | **6.1** ගද්‍ය පාඨ කියවා අර්ථ පැහැදිලි කරයි. | • විෂය සමගාමී ක්‍රියාකාරකම් සහ නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් **උම්මග්ග ජාතකයේ මුල සිට පරිඛණ්ඩ කතා අවසානය දක්වා** | • නිර්දිෂ්ට පාඨ නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව කියවයි.<br>• නිශ්ශබ්ද ව කියවා එහි ව්‍යංග්‍යාර්ථ හා සමස්තාර්ථ ප්‍රකාශ කරයි.<br>• අවස්ථෝචිත ව විවිධ ශෛලීන්ට අනුව ගද්‍ය පාඨ කියවයි.<br>• උම්මග්ග ජාතකය කියවා රසාස්වාදයේ යෙදෙයි. | 12 |
| | 6.2 පද්‍ය පන්ති කියවා රස විඳියි. වනපොත් කරයි. | • **බුදුගුණ අලංකාරයේ මුල් පද්‍ය 50**<br>• අර්ථාවබෝධය- පද්‍ය ව්‍යංග්‍යාර්ථ සමස්තාර්ථ අවබෝධය | • නිවැරදි උච්චාරණය සහිත ව හඬ පාලනයෙන් යුතු ව කියවයි.<br>• නිශ්ශබ්ද ව කියවා එහි ව්‍යංග්‍යාර්ථ සහ සමස්තාර්ථ ප්‍රකාශ කරයි.<br>• බුදුගුණ අලංකාරයේ කවි කට පාඩමෙන් කියයි.<br>• බුදුගුණ අලංකාරයේ කවි කියවා රසාස්වාදයේ යෙදෙයි.<br>• අවස්ථෝචිත ව විවිධ ශෛලින්ට අනුව කවි ගායනා කරයි. | 21 |

**විෂය නිර්දේශය**
**3 ශ්‍රේණිය**

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 07. සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායී ලෙස යොදා ගනී. | 7.1 විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන්දීමේ පුරුද්ද මගින් භාෂා කාර්යයන් ප්‍රායෝගික ව ඉටු කර ගනී. | • විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන් | • ගුවන් විදුලි සාකච්ඡාවකට සවන් දී අදහස් ප්‍රකාශ කරයි.<br>• අවධානයෙන් යුතු ව සවන් දී වැදගත් කරුණු රැස් කර ගනියි.<br>• සාකච්ඡාවට සවන් දී විචාරාත්මක ව අදහස් ඉදිරිපත් කරයි.<br>• ගුවන් විදුලි සාකච්ඡාවලට සවන් දීමේ වැදගත්කම පැහැදිලි කරයි. | 04 |
| | 7.2 දේශන, සාකච්ඡා ආදියට සවන්දීමේ පුරුද්ද මගින් විචාරශීලී ව භාෂාව හසුරුවයි. | • විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරින් | • දේශන හා සාකච්ඡාවලට සවන් දී අදහස් ප්‍රකාශ කරයි.<br>• දේශන හා සාකච්ඡාවලට සවන් දී වැදගත් කරුණු ගොනු කර ගනියි.<br>• දේශන හා සාකච්ඡාවලට සවන් දී විචාරශීලී ව අදහස් ප්‍රකාශ කරයි.<br>• දේශන හා සාකච්ඡාවලට සවන් දීමේ වැදගත්කම පැහැදිලි කරයි. | 04 |

**විෂය නිර්දේශය**
**3 ශ්‍රේණිය**

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.3විවිධ ප්‍රවෘත්ති හා විස්තර ප්‍රකාශවලට සවන් දී වැදගත් කරුණු ඉදිරිපත් කරයි. | විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරින් | • විවිධ ප්‍රවෘත්ති ප්‍රකාශ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• ප්‍රවෘත්ති ප්‍රකාශයකට සාවධාන ව සවන් දී ප්‍රතිචාර දක්වයි.<br>• ප්‍රවෘත්ති ප්‍රකාශයක ඇතුළත් වැදගත් තොරතුරු මතකයෙන් ප්‍රකාශ කරයි.<br>• අසන ලද ප්‍රවෘත්තියේ මූලික අදහස පැහැදිලි කරයි. | 04 |
| 08. තම අදහස් අර්ථවත් ව හා තර්කානුකූල ව ඉදිරිපත් කිරීමට අවශ්‍ය ශක්‍යතා ප්‍රදර්ශනය කරයි. | 8.1 කරුණු සංවිධානය කර ගනිමින් නිවැරදි ව බස හසුරුවමින් කථනයේ යෙදෙයි. | • විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන් | • සබකෝලයෙන් තොර ව කතා කරයි.<br>• කරුණු සංවිධානය කරමින් අන්‍යයන්ගේ අවධානය දිනා ගනිමින් කතා කරයි.<br>• නිරවුල් ව හා නිවැරදි ව අදහස් ඉදිරිපත් කරයි.<br>• මාතෘකාවට අදාළ ව සංයමයෙන් කතා කරයි. | 04 |
| 09. සාහිත්‍ය රසාස්වාදයට හා විචාරයට අදාළ මූලික ඉගැන්වීම් අවබෝධයෙන් යුතු ව භාවිත කරයි. | 9.1රසාස්වාදයේ මූලධර්ම හඳුනා ගනිමින් ගද්‍ය හා පද්‍ය රසාස්වාදයේ යෙදෙයි. | • රසාස්වාදය පිළිබඳ සාමාන්‍ය අවබෝධය (මූලධර්මවලට අනුව) | • සාහිත්‍ය රසාස්වාදයේ මූලධර්ම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රසාස්වාදයේ යෙදෙයි. | 10 |

විෂය නිර්දේශය
3 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | | • ගද්‍ය හා පද්‍ය නිර්මාණ විචාර මූලධර්මවලට අනුව සවන් දී රසාස්වාදයේ යෙදෙයි.<br>• විවිධ මාතෘකා යටතේ සරල ගද්‍ය හා පද්‍ය නිර්මාණය කරයි. | |
| 10. භාෂා සාහිත්‍ය පරිශීලනයෙන් සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගෙන ජාතිකාභිමානය, දේශමාමකත්වය හා සහජීවනය ගොඩනගා ගැනීම සඳහා ක්‍රියා කරයි. | 10.1සංස්කෘතික හර පද්ධතීන් අගය කරමින් කියවයි. | • නිර්දිෂ්ට ග්‍රන්ථ සහ විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන්<br><br>**වන කතා**<br>මිතුරන්ගේ අගය, **බුදුගුණ අලංකාරයේ** මුල් පද්‍ය 50, **උම්මග්ග ජාතකයේ** මුල සිට පරිබණ්ඩ කතා අවසානය දක්වා | • නිර්දිෂ්ට සාහිත්‍ය කෘති කියවා සංස්කෘතික වටිනාකම් පැහැදිලි කරයි.<br>• වනකතා කෘතිය කියවා රස විඳියි.<br>• උසස් නිර්මාණ පරිශීලනයෙන් ගත හැකි ජීවිතාදර්ශ පැහැදිලි කරයි.<br>• සංස්කෘතික හර පද්ධතීන් ඇගයීමට ලක් කරමින් ඒවා චරිතායනය කරයි. | 15 |
| | 10.2දේශාභිමානී හැඟීම් දනවන නිර්මාණ පරිශීලනය කරයි. | විෂය සමගාමී ක්‍රියාකාරකම් | • දේශාභිමානී හැඟීම් දනවන අයුරින් තාලානුකූල ව ගීත ගායනා කරයි.<br>• ගීතයේ ඇති විශේෂ යෙදුම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• ගීතය රස විඳිමින් අදහස් ප්‍රකාශ කරයි.<br>• ගීතයෙන් ධ්වනිත වන දේශාභිමානී හැඟීම් අගය කරයි. | 03 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

# 1
## අක්ෂර මාලාව

**නිපුණතාව** : 01 නූතන සිංහල අක්ෂර මාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.1 නූතන සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන විවිධ ප්‍රභේද යටතේ වර්ග කරයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- නූතන සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන නිවැරදි ව අනුපිළිවෙළින් ලියා දක්වයි.
- අක්ෂර මාලාව ස්වර හා ව්‍යංජන වශයෙන් වර්ග කර දක්වයි.
- ඝෝෂ-අඝෝෂ අක්ෂර හඳුනා ගෙන වගුගත කරයි.
- වර්ගාන්තාක්ෂර යන්න පැහැදිලි කරයි.
- අනතඃස්ථාක්ෂරවල උච්චාරණ ස්වභාවය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- සඤ්ඤකාක්ෂර හා ඌෂ්මාක්ෂර නිවැරදි ව ලියා දක්වයි.
- ලේඛන කාර්යයේ දී නූතන සිංහල අක්ෂර මාලාව නිවැරදි ව භාවිත කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**
**පෙර සූදානම :**

- ප්‍රභේද සහිත ව නූතන සිංහල අක්ෂර මාලාව ලියන ලද පත්‍රිකාවක්

**ප්‍රවේශය**

- ''අ, ආ, ඇ, ඈ, ඉ, ඊ
  උ, ඌ, එ, ඒ. ඔ, ඕ
  කගජ ටඩණ තදන පබම
  යරලව සහළ අං''
  ගීතය සිසුන් සමග ගායනා කරන්න.

**පාඩම සංවර්ධනය**
**පියවර 01**

- නූතන සිංහල අක්ෂර මාලාව ලියූ පත්‍රිකාවක් ප්‍රදර්ශනය කර ශිෂ්‍යයන්ගේ පෙර දැනුම/මතකය අවදි කරන්න.

**පියවර 02**

- පහත සඳහන් කරුණු වෙත ශිෂ්‍ය අවධානය යොමු කරවන්න.
- අක්ෂර මාලාවේ ප්‍රධාන කොටස් දෙකකි.
  (ස්වර 18කි. ව්‍යංජන 42කි.)

**පියවර 03**

- පෙළ පොත ආශ්‍රයෙන් අඝෝෂාක්ෂර හා ඝෝෂාක්ෂර උච්චාරණයේ දී ස්වර තන්තුවල ක්‍රියාකාරිත්වය පැහැදිලි කරන්න.
  (අඝෝෂාක්ෂර 15කි. ඝෝෂාක්ෂර 45කි.)

**පියවර 04**

- වර්ගාක්ෂර පැහැදිලි කරන්න. (වර්ග 05කි.)
- අන්තඃස්ථාක්ෂර පැහැදිලි කරන්න. (ය, ර, ල, ව)

**පියවර 05**

- ඌෂ්මාක්ෂර පහදන්න. (ශ, ෂ, ස, හ, ෆ)

**පියවර 06**

- සඤ්ඤකාක්ෂර පැහැදිලි කරන්න. (ඟ, ඦ, ඬ, ඳ, ඹ)
- අක්ෂර මාලාව පිළිවෙළින් නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව සලසන්න.
- අක්ෂර මාලාව වනපොත් කරවන්න.

**පියවර 07**

- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කර ගන්න. එම නිර්ණායකවලට අදාළ ව ශිෂ්‍යයන් තක්සේරු කරන්න.

**පියවර 08**

- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ ශිෂ්‍යයන් ඇතොත් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්ප :**

- කෙතෙක් භාවිත කළත් ක්ෂය නොවන්නේ අක්ෂරයි.

**ගුණාත්මක යෙදවුම් :**

- **පෙළ පොත (1 පාඩම)**
- ප්‍රභේද සහිත ව අක්ෂර මාලාව ලියූ පත්‍රිකාවක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- අක්ෂර මාලාව නිවැරදි ව අනුපිළිවෙළින් ප්‍රකාශ කිරීම
- සිංහල අක්ෂර මාලාව නිවැරදි ව ලිවීම
- අක්ෂර මාලාව නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම ප්‍රකාශ කිරීම
- අක්ෂර මාලාවේ ප්‍රභේද වෙන්කර දැක්වීම
- ලේඛන කාර්යයේ දී නූතන සිංහල අක්ෂර මාලාව නිවැරදි ව භාවිත කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ**


- ⋆ සිංහල ලේඛන රීතිය (නව සංස්කරණය) 2015 - ජාතික අධ්‍යාපන ආයතනය
- ⋆ සිංහල හෝඩිය - ජේ. බී. දිසානායක
- ⋆ සිංහල අක්ෂර මාලාව ලිවීම සඳහා මාර්ගෝපදේශ - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

# 2
## අක්ෂර මාලාව (අක්ෂර උත්පත්ති ස්ථාන)

**නිපුණතාව** : 01 අක්ෂර මාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.2 අක්ෂර උත්පත්ති ස්ථාන හඳුනා ගෙන භාවිත කරයි.

**කාලච්ඡේද** : 04යි.

**ඉගෙනුම් පල :**

- අකුරු නිවැරදි ව උච්චාරණය කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- අක්ෂර උත්පත්ති ස්ථාන පිළිබඳ අවබෝධයෙන් අකුරු උච්චාරණය කරයි.
- කණ්ඨජ, තාලුජ, දන්තජ ආදි වශයෙන් අක්ෂර වර්ග වෙන් වෙන් ව හඳුනා ගෙන කියවයි.
- අක්ෂර උත්පත්ති ස්ථාන හඳුනා ගෙන උදාහරණ දක්වයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතිය රූපගත කොට නම් කරන ලද චිත්‍රයක් සකස් කර ගන්න.
- උච්චාරණ ඉන්ද්‍රියන්ට අනුව අක්ෂර වගුගත කරන්න.

**ප්‍රවේශය**

- නාසය ඇඟිලිවලින් තද කරගත් විට නාසික්‍ය අක්ෂර නිවැරදි ව උච්චාරණය නොවන බව පෙන්වන්න.
- තොල් ඇඟිලිවලින් තද කරගත් විට ඕෂ්ඨජ අක්ෂර නිවැරදි ව උච්චාරණය නොවන බව පෙන්වමින් පාඩමට ප්‍රවේශ වන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර 1**

- කණ්ඨජ අක්ෂර හඬ නගා උච්චාරණයට සලස්වන්න. උච්චාරණයේ දී ඉන්ද්‍රිය ක්‍රියාකාරිත්වය පැහැදිලි කරන්න.

**පියවර 2**

- තාලුජ, මූර්ධජ, දන්තජ, ඕෂ්ඨජ, නාසික්‍ය, කණ්ඨතාලුජ, කණ්ඨෞෂ්ඨජ, දන්තෞෂ්ඨජ අක්ෂර ද හඬ නගා උච්චාරණයට සලස්වා ඉන්ද්‍රියයන්හි ක්‍රියාකාරිත්වය පැහැදිලි කරන්න.

**මූලික වදන් හා සංකල්ප :**

- කණ්ඨයෙන් උපදින අකුරු කණ්ඨජාක්ෂරයි
  (අ, ආ, ඇ, ඈ, ක, ඛ, ග, ඝ, ඞ, ඟ, හ, (අඃ)
- තල්ලෙන් උපදින අකුරු තාලුජාක්ෂරයි
  (ඉ, ඊ, ච, ඡ, ජ, ඣ, ඤ, ඦ, ය, ශ)
- මුදුනින් උපදින අකුරු මූර්ධජාක්ෂරයි
  (ඍ, ඎ, ට, ඨ, ඩ, ඪ, ණ, ඬ, ර, ෂ, ළ)
- දත්වලින් උපදින අකුරු දන්තජාක්ෂරයි
  (ඏ, ඐ, ත, ථ, ද, ධ, න, ඳ, ල, ස)
- තොල්වලින් උපදින අකුරු ඕෂ්ඨජාක්ෂරයි
  (උ, ඌ, ප, ඵ, බ, භ, ම, ඹ)

- නාසයෙන් උපදින අකුරු නාසිකාක්ෂරයි)
  (ඞ, ඤ, ණ, න, ම (අ)ං)
- කණ්ඨයෙන් හා තල්ලෙන් උපදින අකුරු කණ්ඨතාලුජාක්ෂර යි. (එ, ඒ, ඓ)
- කණ්ඨයෙන් හා තොල්වලින් උපදින අකුරු කණ්ඨෞෂ්ඨජාක්ෂරයි.
  (ඔ, ඕ, ඖ)
- දත්වලින් හා තොල්වලින් උපදින අකුරු දන්තොෂ්ඨජාක්ෂරයි.
  (ව, ෆ)

**ගුණාත්මක යෙදවුම්**

- **පෙළ පොත (1 පාඩම)**
- උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතිය රූප සටහනක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- අක්ෂර නිවැරදි  ව උච්චාරණය කිරීම
- අක්ෂර උත්පත්ති ස්ථාන හඳුනා ගෙන ඉදිරිපත් කිරීම
- උච්චාරණ ඉන්ද්‍රියයන්ට අනුව අක්ෂර වර්ග කොට දැක්වීම
- කථනයේ දී අක්ෂර නිවැරදි ව උච්චාරණය කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ :**

- ⋆ සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්ලිව්. එස්. කරුණාතිලක
- ⋆ සිංහල ලේඛන රීතිය (නව සංස්කරණය) 2015 - ජාතික අධ්‍යාපන ආයතනය

# 3
## ණ, න, ල, ළ භේදය

**නිපුණතාව** : 01 අක්ෂර මාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.3 ණ, න, ල, ළ භේදය හඳුනා ගෙන නිවැරදි ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 05යි.

**ඉගෙනුම් පලː**
- ලේඛනයේ දී නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිතයේ වැදගත්කම පැහැදිලි කරයි.
- ණ, න, ල, ළ භේදය හඳුනා ගෙන නිවැරදි ව ලේඛනයේ යෙදෙයි.
- ලිපි ලේඛනවල අක්ෂර වින්‍යාසය නිවැරදි කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් ː**

**පෙර සූදානම**
- ණ, න, ල, ළ නිවැරදි ව යෙදුණු වචන ඇතුළත් වගුවක් පිළියෙල කර ගන්න.

**ප්‍රවේශය**
- ඇස **කණ** මිනිසා බත් **කන** සැටි බලන්න.
- වතුර **කළ** උකුලට ගත් **කල** ඡායාරූපය ගන්න.
- මෙම වාක්‍ය දෙකේ අක්ෂර වින්‍යාසය අනුව අදහස වෙනස් වන ආකාරය පහදමින් පාඩමට ප්‍රවේශ වන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර 1**
- ලේඛනයේ දී ණ, න, ල, ළ නිවැරදි ව භාවිත කිරීමේ අවශ්‍යතාව පහත සඳහන් කරුණු ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.
  - නිවැරදි අකුරු නිවැරදි පිළිවෙළට යෙදීම අක්ෂර වින්‍යාසය යි.
  - නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිතයෙන් භාෂාවේ අනන්‍යතාව සුරැකෙයි.
  - වැරදි අර්ථ මතුවීම වැළකෙයි.
  - ලේඛනයේ ව්‍යක්තභාවය සුරැකෙයි.

**පියවර 2**
- ණ, ළ, සහ න, ල අක්ෂර උත්පත්ති ස්ථාන හඳුන්වන්න.
  (මූර්ධජ, දන්තජ)

**පියවර 3**
- 'පිළි' යන්න මුලට යෙදෙන පදවල 'ළි' යෙදේ. (පිළිතුරු)
- 'ළ' අක්ෂර දෙකක් එක ළඟ නො යෙදේ.
- ල, ළ, එක්ව යෙදෙන තැන්වල පළමුවෙන් 'ළ' යෙදේ.
  (කළාලය)
- ණ, න, ල, ළ ඇතුළත් වචන සොයා වගුවක් පිළියෙල කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව සලසා දෙන්න.

**පියවර 4**
- ඇමුණුම අංක 1හි ඇති ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයන් නිරත කරවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **පෙළ පොත (1 පාඩම, 13  14 පිටු)**
- ඇමුණුම 1හි ඇති ක්‍රියාකාරකම

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නිරවද්‍ය ලේඛනය සඳහා අක්ෂර වින්‍යාසය පිළිබඳ දැනුම අවශ්‍ය බව පැහැදිලි කිරීම.
- අක්ෂර වින්‍යාසය පිළිබඳ රීති හඳුනා ගෙන ඉදිරිපත් කිරීම.
- ලේඛනයේ දී ණ, න, ල, ළ කාර භේදය පිළිබඳ සම්මත රීති අනුගමනය කිරීම.

**පරිශීලනීය ග්‍රන්ථ**

- ⋆ සිංහල ලේඛන රීතිය (නව සංස්කරණය)2015 - ජාතික අධ්‍යාපන ආයතනය
- ⋆ සිංහල අක්ෂර වින්‍යාස අකාරාදිය - සඳගෝමී කෝපරහේවා
- ⋆ 'ණ' කාර සම්මතය - - ජේ. බී. දිසානායක
- ⋆ 'ළ' කාර සම්මතය - ජේ. බී. දිසානායක

**ඇමුණුම 01**

පහත සඳහන් පදවල අක්ෂර වින්‍යාසය සදොස් නම් නිදොස් කර ලියන්න.

කන්ය්‍ජ
කන්ඩායම
අම්මන්ඩි
පිංසෙන්ඩු
බිංකුන්ඩා
ප්‍රතිභාපූර්ණ
ස්වර්නමය
අරුනෝදය
අමරණීය
ඌනපූරණ
ප්‍රතිසංස්කරණ
සාධාරන
ප්‍රාණවාචී
ලමැද
ලෙන්ගතු
ඊලග
අවමගුල්
ඇටසැකිලි
පෙනහළු
කෝලාහල
සෙංකෝළ
ඇසල පෙරහැර
වෙරලාසන්න
වේලුවනාරාමය
පිලිකා රෝහළ

# 4
# සන්ධි

**නිපුණතාව** : 02 ලේඛන කාර්යයන් ඉටුකර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනී.

**නිපුණතා මට්ටම** : 2.1 ලේඛනයේ දී නිවැරදි ව සාධනය කළ සන්ධි පද භාවිත කරයි.

**කාලච්ඡේද** : 05යි.

**ඉගෙනුම් පල :**

- සන්ධි යනු කුමක් දැ'යි පැහැදිලි කරයි.
- සන්ධි විධි හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- භාෂාවේ ශබ්ද මූලික කොට ගෙන සන්ධි කාර්ය සිදු වන බව විස්තර කරයි.
- පද සන්ධි කිරීමෙන් උච්චාරණ පහසුව ඇති වන අයුරු පැහැදිලි කරයි.
- ලේඛන කාර්යයේ දී පද නිවැරදි ව සන්ධි කර ලියයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**
- ඉතා පහසු සන්ධි පද කීපයක් විසන්ධි කොට දක්වන වගුවක් පිළියෙල කර ගැනීම.

**ප්‍රවේශය**
- පහත සඳහන් කවිය ගායනය කරමින් සිසුන්ට ලියා ගැනීමට සලස්වන්න.
- පෙරසර ලොප් පරසර ලොප් සර සඳය
  සරදෙස් අගම් පෙර රූ පර රූ සඳය
  ගතකුරුදෙස් ගතකුරු ලොප් නම් සඳය
  දෙරූ සඳයි මේ ලෙස දනු දස සඳය

**පාඩම සංවර්ධනය**

**පියවර 1**
- වචන අතර සිදු වන සන්ධි කාර්ය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- පද දෙකක්, ශබ්ද දෙකක් අතර සන්ධි කාර්යය සිදු වන බව පෙළ පොත ඇසුරු කර ගනිමින් පහදා දෙන්න.
- සන්ධි කාර්යයේ විවිධත්වය පහදන්න.
  (ලෝප, ආදේශ, ආගම, ද්විත්වරූප)

**පියවර 2**
- මුලින් දැක් වූ කවිය ද උපයෝගී කර ගනිමින් භාෂාවේ යෙදෙන සන්ධි නම් කරන්න.
- සන්ධි, කාර්යයන් අනුව වර්ග කරන්න.

**පියවර 3**
- පෙළ පොත ඇසුරු කර ගනිමින් සන්ධි විධි එකිනෙක පැහැදිලි කරන්න.
- භාෂාව අලංකාර කර ගැනීමට සන්ධි ප්‍රයෝජනවත් වන බව පහදන්න.
- පෙළ පොතේ ක්‍රියාකාරකම 2.13 රූප සටහන සැකසීමට යොමු කරවන්න.

**මූලික වදන් හා සංකල්ප :**

- භාෂාවේ ශබ්ද මූලික කොට ගෙන සන්ධි කාර්ය සිදු වේ.

**ගුණාත්මක යෙදවුම්**

- **පෙළ පොත (2 පාඩම, සන්ධි)**

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- සන්ධි යනු කුමක් දැ'යි හඳුනා ගෙන පැහැදිලි කිරීම
- සන්ධි විධි හඳුනා ගෙන ඉදිරිපත් කිරීම
- සන්ධි පද නිවැරදි ව විසන්ධි කරමින් අර්ථ දැක්වීම
- සන්ධි පද යොදා ගෙන ව්‍යක්ත ව හා විධිමත් ව භාෂාව භාවිත කිරීම

ඇමුණුම 1

- පෙළ පොතේ සන්ධි පාඩමේ ක්‍රියාකාරකම 2.13 රූප සටහන සැකසීමට යොමු කරවන්න.

**පරිශීලනීය ග්‍රන්ථ :**

- ⋆ සමකාලීන සිංහල ලේඛන ව්‍යාකරණය සන්ධි විග්‍රහය - ජේ. බී. දිසානායක
- ⋆ සවිස්තර සිංහල ව්‍යාකරණය - කළුකොඳයාවේ පඤ්ඤාසේකර හිමි

## 5
## සමාස

**නිපුණතාව** : **02** ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනී.

**නිපුණතා මට්ටම** : **2.2** ලේඛනයේ දී නිවැරදි ව සාධනය කළ සමාස පද භාවිත කරයි.

**කාලච්ඡේද** : 06යි.

**ඉගෙනුම් පල :**

- සමාස යනු කුමක් දැ'යි හඳුනා ගෙන පැහැදිලි කරයි.
- සමාස ප්‍රභේද හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ලේඛනයේ දී ව්‍යක්ත ලෙස සමාස පද භාවිත කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- බුදුබණ, සිවුරුරෙදි, හෙරණසික, දසබල, වත්පිළිවෙත්, තෙරුවන, පාසිවුරු මෙවැනි සමාස පද විග්‍රහ කෙරෙන වාක්‍ය සමග පිළියෙල කරගත් සටහනක්

**ප්‍රවේශය**

පහත සඳහන් ගීත ඛණ්ඩය ශිෂ්‍යයන් සමග ගායනය කරන්න.

**මින්දද** හීසර වැදී **සැලෙනහඳ**
නංවන **දුක්ගී** ඔබට ඇහෙනව ද
**චන්දනමල්** අතුරා ඇති යහනට
කන්ද කපා පායන් **රන්පුන්සඳ**

**පාඩම සංවර්ධනය**

ඉහත ගීත ඛණ්ඩයෙහි අර්ථය පිළිබඳ ශිෂ්‍යයන් දැනුවත් කරන්න. **තද කළු අකුරින් දැක්වෙන පද** කෙරෙහි විශේෂ අවධානය යොමු කරවන්න.

**පියවර 1**

- සමාස යනු පද අතර සිදු වන කාර්යයක් බව පහදන්න.
- භාෂාවේ සමාස වර්ග නම් කර ඒවා හඳුන්වා දෙන්න.

**පියවර 2**

- පෙළ පොත ඇසුරු කර ගනිමින් සමාස එකිනෙක පැහැදිලි කරන්න.
- සමාස විග්‍රහය පිළිබඳ අවධානය යොමු කොට නිවැරදි අවබෝධයට මග පාදන්න.

**පියවර 3**

- තක්සේරුකරණ නිර්ණායක කියවා අවබෝධ කර ගෙන එම නිර්ණායකවලට අදාළ ව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.

**පියවර 4**

- ඇමුණුම අංක 1 සහ 2හි ඇති ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**පියවර 5**

- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ ශිෂ්‍යන් ඇතොත් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්ප :**

- පද කීපයක් හකුළුවා තනි පදයක් ලෙස ප්‍රකාශ කිරීම සමාස නමි.

**ගුණාත්මක යෙදවුම් :**

- **පෙළ පොත (2 පාඩම - සමාස නාම)**
- ඇමුණුම 1 සහ 2හි ඇති ක්‍රියාකාරකම් වගු

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- සමාස යනු කුමක් ද'යි හඳුනා ගෙන පැහැදිලි කිරීම
- සමාස වර්ග නම් කිරීම
- සමාස වර්ගවලට අයත් විශේෂතා පැහැදිලි කිරීම
- සමාස පද යොදා ගනිමින් භාෂාව ව්‍යක්ත ව හා විධිමත් ව හැරසිරවීම (ඇමුණුම 1 හා 2 යොදා ගත හැකි ය.)

**පරිශීලනීය ග්‍රන්ථ**

- සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්ලිව්. එස්. කරුණාතිලක

ඇමුණුම 1

- පහත සඳහන් පද ඇසුරින් වගුව සම්පූර්ණ කරන්න.
  කිරිබත්, මවුපිය, ළමාගති, සුදන, ඉරහඳ, පොල්තෙල්, තිනෙත්, හෙරණසික මල්හිනාව, උපගුරු, මඳසුළඟ, දුදන

| **සමාස පදය** | **සමාස වීමට පෙර පද සමූහය (විග්‍රහ වාක්‍ය)** | **සමාස නාමය** |
|---|---|---|
| | | |

ඇමුණුම 2

1. අඹදඹනාරංකෙසෙල්දෙල් 2. දසමස 3. මිණිපහන 4. සුමධුර
5. මනරංජන 6. අතිරමණී 7. සුරම්‍ය 8. දූපුතුන් 9. නාරිලතා
10. පුන්පෝය

මේ සමාස පද භාවිත කරමින් වගුව සම්පූර්ණ කරන්න.

| **පදය** | **සමාස නාමය** |
|---|---|
| | |

# 6

## තද්ධිත හා කෘදන්ත

**නිපුණතාව** : 02. ලේඛන කාර්යයන් ඉටුකර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනී.

**නිපුණතා මට්ටම** : 2.3 ලේඛනයේ දී නිවැරදි ව සාධනය කළ තද්ධිත හා කෘදන්ත පද භාවිත කරයි.

**කාලච්ඡේද** : 05යි.

**ඉගෙනුම් පල :**

- තද්ධිත හා කෘදන්ත පද වෙන් වෙන් ව හඳුනා ගෙන විස්තර කරයි.
- තද්ධිත නාම නිපදවෙන ප්‍රත්‍යය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- කෘදන්ත ප්‍රභේද හැඳින ගෙන ප්‍රකාශ කරයි.
- තෙවැදෑරුම් කෘදන්ත පද භාවිතය පැහැදිලි කරයි.
- තද්ධිත හා කෘදන්ත නිවැරදි ව භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- තද්ධිත නාම හා කෘදන්ත නාම නිපදවෙන ආකාරය පිළිබඳ උදාහරණ ඇතුළත් වගු සටහනක් **ප්‍රවේශය**
    1. සිරිලක **ගැමි** පරිසරය සිත් ඇදගන්නා බව **පිටරැටියෝ** පවා පිළිගනිති.
    2. වෙසක් දින සෑම බෞද්ධ නිවසක් ම **ආලෝකවත්** වෙයි.
    3. වජිරා මනහර නැටුමක් **නටනු** අපි දුටුවෙමු.
    4. අපි **කැවුම්** කැවෙමු.

මෙවැනි වැකි කීපයක් ශිෂ්‍යයන්ට ලබා දී තද්ධිත හා කෘදන්ත නාම පදවලට ඉරි ගැසීමට මග සලස්වා පාඩම සංවර්ධනයේ දී එම පද අදාළ කර ගන්න.

**පාඩම සංවර්ධනය**

පියවර 1

- තද්ධිත හා කෘදන්ත නාම පද ලේඛනයේ දී අත්‍යවශ්‍ය සාධකයක් බව පෙන්වා දෙන්න.
- නාම ප්‍රකෘතියකට එකතු වන ප්‍රත්‍යයන්ගෙන් එහි අර්ථය වෙනස් වන බව උදාහරණ මගින් පහදන්න.
- ධාතු ප්‍රකෘතියකට එකතු වන ප්‍රත්‍යයන්ගෙන් එහි අර්ථය වෙනසකට ලක් වන අයුරු උදාහරණ මගින් පහදා දෙන්න.

පියවර 2

- පෙළ පොත ඇසුරු කර ගනිමින් තද්ධිත ප්‍රත්‍යය සහ ඒවා යෙදෙන අර්ථ උදාහරණ මගින් පෙන්වා දෙන්න.

පියවර 3

- කෘදන්ත නාම, අර්ථ ක්‍රියා නාම සහ භාව ක්‍රියා නාම යනුවෙන් වර්ග කෙරෙන බව උදාහරණ මගින් පහදන්න.
- අර්ථ ක්‍රියා කෘදන්ත වර්තමාන හා අතීත කෘදන්ත යනුවෙන් වර්ගීකරණය වන බව උදාහරණ මගින් පහදන්න.

පියවර 4

- යෙදෙන ආකාරය අනුව කෘදන්ත නාම තෙවැදෑරුම් වන බව පෙන්වා දෙන්න. (කෘදන්ත නාම, නාම විශේෂණ, අතීත කාල ක්‍රියා)

පියවර 5

* භාව කාරක කෘදන්ත ප්‍රත්‍යය කීපයක් ඇති බව උදාහරණ මගින් පහදන්න.
  (උම්, ඉලි, ඊම්, මන්)
* වර්තමාන හා අතීත කෘදන්ත උදාහරණ මගින් පැහැදිලි කරන්න.

පියවර 6

* ඇමුණුම අංක 2හි ඇති ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්ප :**

* නාමයක් හා අර්ථවත් ප්‍රත්‍යයක් එක් වීමෙන් තද්ධිත නාම සෑදේ.
* ධාතුවකට ප්‍රත්‍යයක් එක් වීමෙන් කෘදන්ත නාම නිපදවෙයි.

**ගුණාත්මක යෙදවුම් :**

* **පෙළ පොත (තද්ධිත හා කෘදන්ත)**
* ඇමුණුම් අංක 01 සහ එහි ඇති ක්‍රියාකාරකම්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

* තද්ධිත නාම යනු කුමක් දැ'යි හඳුනා ගෙන ප්‍රකාශ කිරීම
* විවිධ තද්ධිත නාම ප්‍රත්‍යය හා ඒවායෙහි අර්ථ හඳුනා ගෙන පැවසීම
* කෘදන්ත නාම යනු කුමක් දැ'යි හඳුනා ගෙන පැවසීම
* කෘදන්ත නාම ප්‍රභේද හඳුනා ගෙන ප්‍රකාශ කිරීම
* කෘදන්ත පද වර්ගීකරණය හඳුනා ගෙන පැවසීම
* තෙවැදෑරුම් කෘදන්ත පද භාවිතය විස්තර කිරීම
* භාවකාරක කෘදන්ත ප්‍රත්‍යය හඳුනා ගෙන විස්තර කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ :**

* සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්. එස්. කරුණාතිලක
* පද සාධනය - ජේ. බී. දිසානායක
* නාම පදය - ජේ. බී. දිසානායක

ඇමුණුම 1

* පහත සඳහන් නාම පද කවර නාම පද වර්ගයට අයත් දැ'යි සඳහන් කර වගුව සම්පූර්ණ කරන්න.
  සිරිමත්, බැලුම්, ගුණවත්, දැහැමියෙක්, ලියමන්, ප්‍රියතම, සිඟිති, කැවුම්, විදේශික, රත්නමය

| තද්ධිත නාම | කෘදන්ත නාම |
|---|---|
| | |

ඇමුණුම 2

**පහත සඳහන් කවියෙහි කෘදන්ත නාම පද තෝරා ලියන්න.**

දුම්බර කෙතට වැට බැඳලා රැකුම් බැලුම්
මහවැලි ගඟේ දිය ගලලා කෙතට ගිලුම්
පෙම්බර ලියන් කර ඔසවා බලන බැලුම්
තුන්පත් රටාවකි දුම්බර කෙතේ නෙළුම්

# 7

## ලිංග භේදය

**නිපුණතාව** : 02 ලේඛන කාර්යයන් ඉටුකර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනී.

**නිපුණතා මට්ටම** : 2.4 භාෂාවේ ලිංග භේදය යනු කුමක් දැ'යි පිළිබඳ ව ප්‍රමාණාත්මක ව පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 05යි.

**ඉගෙනුම් පල :**

- භාෂාවේ ලිංග භේදය යනු කුමක් දැ'යි පැහැදිලි කරයි.
- සිදත් සඟරාවේ ලිංග වර්ගීකරණය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ව්‍යවහාරික භාෂාවේ ලිංගත්‍රයයක් ඇති බව පැහැදිලි කරයි.
- ලිංගත්‍රයයේ නාම පද, නාම විභක්තිවල වරනැගෙන ආකාරය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ස්ත්‍රී ලිංග නාම පද නිපදවෙන ආකාරය හැඳින ගෙන පැහැදිලි කරයි.
- ලිංග භේදය පිළිබඳ අවබෝධයෙන් ලේඛන කාර්යයේ යෙදෙයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- ලිංග භේදය නිරූපණය වන උදාහරණ සහිත වගුවක්

**ප්‍රවේශය**

- 1. අම්මා බත් ................................
  2. තාත්තා කුඹුරේ වැඩ .........................
  3. ගෙඩිය ගසින් බිමට .............................

  සිසුන් ලවා ක්‍රියා පද සම්පූර්ණ කරවා ලිංග භේදය පිළිබඳ අවශ්‍යතාව පැහැදිලි කොට පාඩමට ප්‍රවේශ වන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර 1**

- ලේඛනයේ දී ලිංග භේදය වැදගත් වන බව පැහැදිලි කරන්න.
- භාෂාවේ ලිංගත්‍රයයක් දැකිය හැකි බව පහදා දෙන්න.

**පියවර 2**

- නාම පදයන්ගේ ලිංග භේදය පිළිබඳ ප්‍රභේද පැහැදිලි කරන්න.

**පියවර 3**

- නාම වරනැගීමේ දී සචේතනික ශබ්ද එක් අයුරකිනුත් අචේතනික ශබ්ද තවත් අයුරකිනුත් වරනැගෙන බව පහදන්න.

**පියවර 4**

- ස්ත්‍රී ලිංග නාම පද සැදෙන ආකාරය පෙළ පොත ඇසුරින් ඉදිරිපත් කරන්න.

**පියවර 5**

- ලිංග භේදය අනුව නාමපද වර්ග කර පෙන්වන්න.
- ලිංග භේදය අනුව ලේඛනයේ දී සමහර ආඛ්‍යාත පද වෙනස් වන අයුරු හඳුන්වා දෙන්න.
- ගුණනාම ලිංගත්‍රයයේ ම පොදුවේ යෙදෙන බව පහදන්න.

**පියවර 6**

- ලේඛනයේ දී ලිංග භේදය භාවිත කරමින් බස හැසිරවීමට මග පෙන්වන්න.

**පියවර 7**

- ඇමුණුම අංක 1 සහ 2හි ඇති ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්ප :**

- පුරුෂවාචී බවක් හැඟවෙන්නේ නම් පුරුෂ ලිංගයි.
- ස්ත්‍රීවාචී බවක් හැඟවෙන්නේ නම් ස්ත්‍රී ලිංගයි.
- අප්‍රාණවාචී බවක් හැඟවෙන්නේ නම් නපුංසක ලිංගයි.

**ගුණාත්මක යෙදවුම් :**

- **පෙළ පොත - 2 පාඩම**
- ඇමුණුම් අංක 1 සහ 2 ක්‍රියාකාරකම්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ව්‍යාකරණයේ ලිංග තුනක් භාවිත වන බව හඳුනා ගෙන ඉදිරිපත් කිරීම
- ලිංග වශයෙන් පද වෙන් කරන අයුරු පැහැදිලි කිරීම
- ස්ත්‍රී ලිංග පද සාධනය පැහැදිලි කිරීම
- ලිංග භේදය හඳුනා ගෙන නිවැරදි ව ලේඛන කාර්යයේ යෙදීම

ඇමුණුම 1

- ස්ත්‍රී ලිංග පද සෑදෙන ආකාරය පැහැදිලි කෙරෙන වගුවක් පිළියෙල කරන්න.

ඇමුණුම 2

**පහත සඳහන් පද යොදා වාක්‍ය නිර්මාණය කරන්න.**

1. රජතුමා
2. බිසව
3. කුරුල්ලා
4. ගොවියෝ
5. සිංහ ධේනුව
6. ගෙවල්
7. ලිපිකරුවා
8. පෑන
9. ගුරුතුමිය
10. පොත

පරිශීලනීය ග්‍රන්ථ :

- ⋆ සවිස්තර සිංහල ව්‍යාකරණය - කළුකොඳයාවේ පඤ්ඤාසේකර හිමි

# 8
## අව්‍යය පද

**නිපුණතාව** : 02 ලේඛන කාර්යයන් ඉටුකර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනී.

**නිපුණතා මට්ටම** : 2.5 අව්‍යය පද නිවැරදි ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 05යි.

**ඉගෙනුම් පල :**

- අව්‍යය පද යනු මොනවා ද'යි පැහැදිලි කරයි.
- අව්‍යය පද නිවැරදි ව නම් කරයි.
- වාක්‍ය ලිවීමේ දී අව්‍යය පද නිවැරදි ව භාවිත කරයි.
- අව්‍යය පදවලින් භාෂාවට ඇති ප්‍රයෝජන පැහැදිලි කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**
- නිපාත, උපසර්ග පද ඇතුළත් වගුවක් පිළියෙල කර ගන්න.

**ප්‍රවේශය**
- නාම පදවලින් නිපාත පද හා උපසර්ග පද වෙනස් වන අයුරු පැහැදිලි කරමින් පාඩමට ප්‍රවේශ වන්න.

  ව්‍යය - වෙනස්වීම (වර නැගීම) - නාම පද

  අව්‍යය - වෙනස් නොවීම (වර නැගීමට නොහැකි බව) අව්‍යය පද

## පාඩම සංවර්ධනය

**පියවර 01**
- විභක්තිවල වර නොනැගෙන පද අව්‍යය පද ලෙස පැහැදිලි කරන්න.
- අව්‍යය පද නිපාත සහ උපසර්ග වශයෙන් දෙයාකාර බව පහදන්න.

**පියවර 02**
- පෙළ පොත ඇසුරු කර ගනිමින් නිපාත පද විවිධ අර්ථ ප්‍රකාශ කරන බව පහදන්න.

**පියවර 03**
- උපසර්ග එක් වීමෙන් නාම පදයක් වෙනස්කම් කීපයකට භාජනය වන බව පවසන්න.
  1. අර්ථය තීව්‍ර කිරීම
  2. විරුද්ධාර්ථයක් ගෙන දීම
  3. අර්ථයට බාධා කිරීම

  නිපාත හා උපසර්ග දෙකේ වෙනස පහදා දෙන්න

**පියවර 04**
- ඇමුණුම් අංක 2 සහ 3හි ඇති ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්ප :**

- අව්‍යය පද යනු නිපාත පද හා උපසර්ග පදයි.

**ගුණාත්මක යෙදවුම් :**

- **පෙළ පොත - 6 පාඩම**
- ඇමුණුම් අංක 1, 2, 3, ක්‍රියාකාරකම්

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක**

ඇමුණුම 01 හා 02 යොදාගන්න.

- අව්‍යය පද හඳුනා ගෙන ඉදිරිපත් කිරීම
- නිපාත පදවල විවිධ අර්ථ ප්‍රකාශ කිරීම
- උපසර්ග එක්වීමෙන් සිදු වන වෙනස්කම් පැහැදිලි කිරීම
- ලේඛනයේ දී අව්‍යය පද නිවැරදි ව භාවිත කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ**

- සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්. එස්. කරුණාතිලක
- බසක මහිම - ජේ. බී. දිසානායක

ඇමුණුම 01

| **නිපාත පද** | **උපසර්ග පද** |
|---|---|
| | |

**ඇමුණුම 02**

පහත සඳහන් පදවලට උපසර්ග යොදමු

__ දන, __ සිනිඳු, __ බල, __ ගුණ

__ පිරිසිදු, __ කසළ, __ පිරි, __ සිරිත්

**ඇමුණුම 03**

පහත පද යොදා වැකිය බැගින් තනන්න

පිණිස, සමග, නිරතුරු, එවිට, නොහොත්, තෙක්, දක්වා, හෙවත්, සේ

# 9
## ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය හා නාම විභක්ති ප්‍රත්‍යය

**නිපුණතාව** : 02 ලේඛන කාර්යයන් ඉටුකර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනී.

**නිපුණතා මට්ටම** : 2.6 ලේඛනයේ දී ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය හා නාම විභක්ති ප්‍රත්‍යය නිවැරදි ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 05යි.

**ඉගෙනුම් පල :**

- ක්‍රියා පද සාධනය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ක්‍රියා පද වරනැගීම හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- විභක්ති ප්‍රත්‍යය හඳුනා ගෙන පැහැදිලි කරයි.
- නාම පද වර්ගීකරණය හඳුනා ගෙන පැහැදිලි කරයි.
- විවිධ නාම පද විභක්තිවල වරනගයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**
**පෙර සූදානම :**

- පෙළ පොත ඇසුරු කර ගනිමින් ආඛ්‍යාත හා නාම විභක්ති පිළිබඳ සටහනක් පිළියෙල කර ගැනීම

**ප්‍රවේශය**

| | |
|---|---|
| පෙර කම් කතු | කරණ |
| සපදන් අවදි | සබඳන |
| අදරය අලප් | යන |
| විබත් නවයක් පැවසු | පඬි දන |

**පාඩම සංවර්ධනය**
මෙම කවිය ශිෂ්‍යයන්ට ලියා ගැනීමට සලස්වා ගායනය කොට නාම විභක්ති ප්‍රත්‍යය හැඳින්වීමේ දී උපයෝගී කොට ගන්න.

**පියවර 1**

- ක්‍රියා පද හඳුන්වා දී ඒවායේ කාල භේදය, වචන භේදය, පුරුෂ භේදය හා කාරක භේදය ඇති බව පැහැදිලි කරන්න.

**පියවර 2**

- ශබ්ද ප්‍රකෘතියකට ප්‍රත්‍යය එකතු වීමෙන් නාම පද සෑදෙන බව උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

**පියවර 3**

- නාම පද වරනැගීමේ දී විභක්ති නවයක් දක්නට ලැබෙන බව ප්‍රවේශයේ දී භාවිත කළ කවිය උපයෝගී කර ගනිමින් පැහැදිලි කරන්න.

**පියවර 4**

- පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග හා නපුංසක ලිංග වශයෙන් නාම පද වරනැගෙන ආකාරය උදාහරණ මගින් පහදන්න.

**පියවර 5**

- ඇමුණුම අංක 1හි ඇති ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්ප :**

- ධාතු ප්‍රකෘතියකට ප්‍රත්‍යයක් එක්වීමෙන් සෑදෙන්නේ ක්‍රියාපදයි.
- ශබ්ද ප්‍රකෘතියකට ප්‍රත්‍යයක් එක්වීමෙන් සෑදෙන්නේ නාම පදයි.

**ගුණාත්මක යෙදවුම්**

- **පෙළ පොත - 03 පාඩම**
- ඇමුණුම් අංක 01 ක්‍රියාකාරකම

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- ආඛ්‍යාත පද හා නාම පද හඳුනා ගෙන ප්‍රකාශ කිරීම
- ආඛ්‍යාත පද හා නාම පද ඒ ඒ ප්‍රභේද අනුව වගුගත කිරීම
- ලේඛනයේ දී නාම පද හා ආඛ්‍යාත පද නිවැරදි ව භාවිත කිරීම
- විවිධ නාම පද විභක්තිවල වරනැගීම

**පරිශීලනීය ග්‍රන්ථ**

- ⋆ නාම පදය - ජේ. බී. දිසානායක
- ⋆ ක්‍රියා පදය - ජේ. බී. දිසානායක
- ⋆ සවිස්තර සිංහල ව්‍යාකරණය - කළුකොඳයාවේ පඤ්ඤාසේකර හිමි

ඇමුණුම 01

අම්මාගේ ගුණ මුහුදයි
ආදරයයි කරුණාවයි
ඇත මාගේ දුකට සැපට
ඈතක නොව ළඟ පාතම

ඉන්නට ඔබගේ පුතු වී
ඊ ළඟ බවයේදිත් මට
උපදින්නට හැකිවේ නම්
ඌරුව ලැබ එම් තුරුලට

එන්න මවුනි මා පසුපස
ඒකයි මගේ එකම පැතුම
ඔබ වේ නම් නිල් දියවර
ඕලු මලක් වන්නෙමි මම

"දිනුම් කණුව" - තිස්ස විමලධීර

- ඉහත කවිවල ඇති නාම පද හා ක්‍රියා පද වගුගත කරන්න.
- නාම පදවල විභක්ති නම් කරන්න.
- නාම පදවල ශබ්ද ප්‍රකෘති වෙන් කර දක්වන්න.

# 10

## වාක්‍ය නිර්මාණය (සරල වාක්‍ය හා සංකීර්ණ වාක්‍ය)

**නිපුණතාව** : 02 ලේඛන කාර්යයන් ඉටුකර ගැනීමේ දී ව්‍යාකරණය නිවැරදි ව යොදා ගනී.

**නිපුණතා මට්ටම** : 2.7 සම්මත භාෂාරීතිවලට අනුව වාක්‍ය නිර්මාණය කරයි.

**කාලච්ඡේද** : 05යි.

**ඉගෙනුම් පල :**

- වාක්‍යයක මූලිකාංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ව්‍යාකරණානුකූල ව වාක්‍ය ලිවීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- සරල වාක්‍ය හා සංකීර්ණ වාක්‍ය මොනවා දැ'යි හඳුනා ගෙන විස්තර කරයි.
- උක්තානුක්ත පද, ලිංග භේදය, පුරුෂ භේදය හඳුනා ගෙන ලේඛන කාර්යයේ යෙදෙයි.
- ලේඛන කාර්යයේ දී සම්මත රීති අනුගමනය කරමින් ලියයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- පෙළ පොතේ 7 වන පාඩමේ එන කරුණු පිළිබඳ අධ්‍යයනයක නිරත වන්න.
- වාක්‍ය කිහිපයක් ලියන ලද පත්‍රිකා සූදානම් කර ගන්න.

**ප්‍රවේශය**

- ''මා වවුලෝ පියාඹති'' වැනි කවියක් ගායනා කරමින් ප්‍රවේශ වී එහි ඇති ව්‍යාකරණ ලක්ෂණ පැහැදිලි කරන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර 1**

- උක්ත පදය, කර්ම පදය හා ක්‍රියා පදය පිළිබඳ සිසුන්ගේ අවධානය යොමු කරන්න.

**පියවර 2**

- සරල හා සංකීර්ණ වාක්‍ය අතර වෙනස පැහැදිලි කරන්න.

**පියවර 3**

- ඇමුණුම 1හි ඇති අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**පියවර 4**

- **පෙළ පොතේ 07 වන පාඩමේ** නියමිත ක්‍රියාකාරකම් කරවන්න.
- ඇමුණුම අංක 01හි ඇති ක්‍රියාකාරකම්හි ශිෂ්‍යයන් නිරත කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- **පෙළ පොත - 7 පාඩම**

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- වාක්‍යයක මූලිකාංග හඳුනා ගෙන ඉදිරිපත් කිරීම
- සරල වාක්‍ය හා සංකීර්ණ වාක්‍ය හඳුනා ගෙන විස්තර කිරීම
- සම්මත රීති අනුව වාක්‍ය නිර්මාණය කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ**

⋆ සිංහල ලේඛන රීතිය (නව සංස්කරණය) 2015 - ජාතික අධ්‍යාපන ආයතනය

ඇමුණුම 1

- උක්තය ඒක වචන නම් ආඛ්‍යාතය ද ඒක වචන විය යුතුයි.
  උක්තය බහු වචන නම් ආඛ්‍යාතය ද බහු වචන විය යුතුයි.

01. ගුරුවරයා පාඩම් ............................................................
    ගුරුවරු පාඩම් ............................................................

ii උපාසිකාව පන්සලේ සිල් ............................................................
   උපාසිකාවෝ පන්සලේ සිල් ............................................................

iii නුඹ ගෙයක් ............................................................
    නුඹලා ගෙයක් ............................................................

උක්තය ප්‍රථම පුරුෂ නම් ආඛ්‍යාතය ද ඊට අනුරූප විය යුතු ය.

i ඔහු ගෙයක් ............................................................
  ඔවුහු ගෙයක් ............................................................

iii ළමයා පන්තිය ............................................................
    ළමයි පන්තිය ............................................................

උක්තය මධ්‍යම පුරුෂ නම් ආඛ්‍යාතය ඊට අනුරූපී ව ගැළපිය යුතු ය.

i. තෝ ගමට ............................................................
ii. තොපි කුඹුර ............................................................
iii. නුඹලා පන්සල් ............................................................
iv. යුෂ්මත්හු කුඹුර ............................................................
v. නුඹ වාහනය ............................................................

උක්තය උත්තම පුරුෂ නම් ආඛ්‍යාතය ඊට අනුරූපී ව ගැළපිය යුතු ය.

i මම ගෙයක් ............................................................
  අපි ගෙයක් ............................................................

ii මම පන්තිය ............................................................
   අපි පන්තිය ............................................................

පහත සඳහන් වාක්‍ය සුදුසු ආඛ්‍යාත පද යොදා සම්පූර්න කරන්න.

**පහත සඳහන් වාක්‍ය සුදුසු ආඛ්‍යාත පද යොදා සම්පූර්ණ කරන්න.**
**ඇමුණුම 02**

i. බළලා මීයන් ............................................................
   බළල්ලු මීයන් ............................................................

ii. මල සවසට ............................................................
    මල් සවසට ............................................................

iii. පියුම්හු විකසිත ............................................................
     නදීහු පහළට ගලා ............................................................

iv. රිය පෙළ පාරේ ............................................................
    රළ පෙළ ගල්පරවල ............................................................

v. සොර මුළ මං ............................................................
   සිසු කැල පාසලට ............................................................

vi. නුඹ නිදුක් ............................................................
    නුඹලා නිදුක් ............................................................

vii. සමහරෙක් ............................................................
     ඇතැමෙක් ............................................................

# 11
## වාක්‍ය නිර්මාණය

**නිපුණතාව** : 02 ලේඛන කාර්යයන් ඉටුකර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනී.

**නිපුණතා මට්ටම** : 2.8 සම්මත රීතිවලට අනුව වාක්‍ය නිර්මාණය කරයි.

**කාලච්ඡේද** : 05යි.

**ඉගෙනුම් පල :**

- ක්‍රියා පද යනු කුමක් දැ'යි ප්‍රකාශ කරයි.
- ක්‍රියා පද වර්ග කර දක්වයි.
- ක්‍රියා පද සාධනය පැහැදිලි කරයි.
- ප්‍රයෝජ්‍ය ක්‍රියා, ආශීර්වාද ක්‍රියා හඳුනා ගෙන පැහැදිලි කරයි.
- නෛපාතික කෘදන්ත හඳුනා ගෙන පවසයි.
- ලේඛන කාර්යයේ දී සම්මත රීති අනුගමනය කරමින් ලියයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- **පෙළ පොතේ 7 වන පාඩමට** අදාළ ව අවසාන ක්‍රියා සහ අනවසාන ක්‍රියා ඇතුළත් වගුවක් පිළියෙල කර ගැනීම.

**ප්‍රවේශය**

ක්‍රියා පද කීපයක් සිසුන්ගෙන් වාචික ව ලබා ගෙන ඒවා ක්‍රියා පද ලෙස හඳුන්වමින් පාඩමට පිවිසෙන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර 1**

- ක්‍රියා පද යන්න සිසුන් සමග සාකච්ඡා කොට නිදසුන් කීපයක් ඇසුරින් එය තහවුරු කරන්න.
- ක්‍රියා පද කාල, පුරුෂ, වචන සහ කාරක වශයෙන් බෙදෙන බව පැහැදිලි කරන්න.

**පියවර 2**

- සකර්මක හා අකර්මක ලෙස ක්‍රියා පද දෙවැදෑරුම් වන බව උදාහරණ මගින් පහදන්න.

**පියවර 3**

- ක්‍රියා පදවල මූලික බෙදීම් දෙකක් ඇති බව පෙන්වා දෙන්න.
  1. අවසාන ක්‍රියා 2. අනවසාන ක්‍රියා

**පියවර 4**

- පෙළ පොත ඇසුරු කර ගනිමින් ප්‍රයෝජ්‍ය ක්‍රියා සහ ආශීර්වාද ක්‍රියා පැහැදිලි කරන්න.

**පියවර 5**

- පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා සහ අපර ක්‍රියා උදාහරණ දක්වමින් පෙළ පොත ඇසුරින් පහදන්න.
- ඇමුණුම අංක 1හි ඇති ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්ප :**

- කිරීමක්, වීමක් හෝ විඳීමක් හඟවන පද ක්‍රියා පද යි.

**ගුණාත්මක යෙදවුම්**

- **පෙළ පොත 4, 5 පාඩම**
- ඇමුණුම අංක 1හි ඇති ක්‍රියාකාරකම්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ඇමුණුම 01 භාවිත කළ හැකි ය.

- ක්‍රියා පද යනු කුමක් දැ'යි පැවසීම
- ක්‍රියා මූලය සොයා ගන්නා අයුරු පැහැදිලි කිරීම
- ධාතු ප්‍රකෘතිවල සකර්මක අකර්මක භේදය පැහැදිලි කිරීම
- අවසාන ක්‍රියා පද සහ අනවසාන ක්‍රියා පද අතර වෙනස පැහැදිලි කිරීම
- ක්‍රියා පද නිවැරදි ව යොදමින් ලේඛනයේ නිරතවීම

**පරිශීලනීය ග්‍රන්ථ**

- ⋆ බසක මහිම - ක්‍රියා පදය - ජේ. බී. දිසානායක
- ⋆ සවිස්තර සිංහල ව්‍යාකරණය - කළුකොඳයාවේ පඤ්ඤාසේකර හිමි

ඇමුණුම 01

කැලේ තිබෙන කොයි දේවත් රස වේවා
මලේ බඹරු මෙන් පිරිවර වැඩි වේවා
අව්වේ තිබෙන රැස්මාලා අඩු වේවා
ගව්වෙන් ගව්ව දිව මාලිග සෑදේවා

සිහිකර ඔබ ගැන
බවුන් වඩයි මන ...

සමනල මුදුනේ සිරිපද සිප සිප
උදා හිරක් පායයි ...

ඉහත උද්ධෘතවල ඇති ක්‍රියා පද තෝරා පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න

| ක්‍රියා පද | ක්‍රියා මූලය/ධාතු ප්‍රකෘතිය |
|---|---|
| | |

# 12
# සාම්ප්‍රදායික යෙදුම්

**නිපුණතාව** : 03 භාෂා ක්‍රියාකාරකම් මගින් වාංමාලාව පෝෂණය කර ගෙන භාෂා කාර්යයන්හි දී උචිත පරිදි භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 3.1 සාම්ප්‍රදායික යෙදුම් භාෂා කාර්යයන් සඳහා අර්ථවත් ලෙස යොදා ගනියි.

**කාලච්ඡේද** : 05යි.

**ඉගෙනුම් පල :**

- සාම්ප්‍රදායික යෙදුම්වල ප්‍රභේද හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- සන්නිවේදනය කාර්යක්ෂම කර ගැනීම සඳහා සාම්ප්‍රදායික යෙදුම් පිටිවහලක් වන බව පැහැදිලි කරයි.
- රසවත් ව අදහස් ඉදිරිපත් කිරීමේ දී සාම්ප්‍රදායික යෙදුම් භාවිත කරයි.
- ලේඛන කාර්යයන්හි දී සාම්ප්‍රදායික යෙදුම් සුදුසු පරිදි භාවිත කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**
- පෙළ පොතේ 8 වන පාඩමට අදාළ ව රූඪී හෙවත් **ඉඟි වැකි, ප්‍රස්තාව පිරුළු** හා **ආප්තෝපදේශ** වෙන් වෙන් ව උදාහරණ මගින් පැහැදිලි කිරීම සඳහා සූදානම් කර ගන්න.

**ප්‍රවේශය**
- '**අනූ නවයෙන් බේරුණා**' වැනි ඉඟි වැකියක් පවසමින් තමා පිරිවෙණට එන අතරතුර සිදු වූ හෝ තමා ඇසූ සිද්ධියක් හෝ පාදක කර ගනිමින් පාඩම සඳහා ප්‍රවේශයක් ලබා ගන්න. එවැනි වදන් ඉඟි වැකියක් බව පවසන්න.

**පාඩම සංවර්ධනය**
**පියවර 1**
- සාම්ප්‍රදායික යෙදුම් යනු මොනවා දැ'යි සිසුන්ගෙන් විමසන්න.
- ශිෂ්‍යයන්ගේ පිළිතුරු කෙරෙහි අවධානය යොමු කරමින් භාෂාවේ යෙදෙන සාම්ප්‍රදායික යෙදුම් එනම් **ඉඟි වැකි, ප්‍රස්තාව පිරුළු හා ආප්තෝපදේශ** වෙන් වෙන් ව හඳුන්වා දෙමින් සිසුන් සමග සාකච්ඡාවක නිරත වන්න.

**පියවර 2**
- සාම්ප්‍රදායික යෙදුම් අර්ථවත් ව භාවිත වන අවස්ථා සිසුන්ගෙන් විමසන්න.
  අනතුරු ව විවිධ නිර්මාණ ඇසුරින් ඒවා පැහැදිලි කරන්න. (පෙළ පොතේ 8වන පාඩම ද ඇසුරු කර ගනිමින්)
- අදහස් ප්‍රකාශ කිරීමේ දී සාම්ප්‍රදායික යෙදුම් අවස්ථෝචිත ව භාවිත කිරීමෙන් වඩාත් රසවත් අයුරින් යමක් ඉදිරිපත් කළ හැකි බවත්, ඒවා භාෂණයේ දී හා ලේඛනයේ දී යොදා ගැනීම අතිශය වැදගත් බවත් සිසුන්ට පහදා දෙන්න.

**පියවර 3**

- ඉඟි වැකි, ප්‍රස්තාව පිරුළු හා ආප්තෝපදේශ යොදා වාක්‍ය නිර්මාණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. (මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ද සිදු කළ හැකි ය.) සාම්ප්‍රදායික යෙදුම් සහිත ව ශිෂ්‍යයන් නිර්මාණය කළ වාක්‍ය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- ගුරුවරයා විසින් තක්සේරුකරණ නිර්ණායක කියවා මැනවින් අවබෝධ කර ගන්න. එම නිර්ණායකවලට අදාළ ව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් ඇතොත් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න. නැවතත් ක්‍රියාකාරකම්වල යොදවන්න.

**ඉඟි වැකි**

- වාච්‍යාර්ථය අබිබවමින් අදහස් ප්‍රකාශ කරන වැකි
- යම් කිසි අදහසක් රසවත් ව හා අර්ථවත් ව යෙදීම සඳහා භාවිත වැකි

**ප්‍රස්තාව පිරුළු**

- කතන්දරයක් ඇසුරින් ගොඩ නැඟුණු පිරුළු
- අවස්ථෝචිත ව කළ ප්‍රකාශ
- ජීවිතයට වැදගත් උපදෙස් ප්‍රකාශ කරන කියමන්

**ආප්තෝපදේශ**

- ජීවිතයට වැදගත් උපදෙස් ප්‍රකාශ කරන කියමන්
- වැඩිහිටියන්ගේ කියමන්

**ගුණාත්මක යෙදවුම්**

- පෙළ පොතේ 8 වන පාඩම
- ඉඟි වැකි, ප්‍රස්තාව පිරුළු, ආප්තෝපදේශවලට අදාළ උදාහරණ අන්තර්ගත කොට ගුරුවරයා විසින් සකස් කරන ලද පත්‍රිකා කීපයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- ඉඟි වැකි, ප්‍රස්තාව පිරුළු සහ ආප්තෝපදේශ වෙන් වෙන් ව හඳුනා ගෙන ඉදිරිපත් කිරීම
- සාම්ප්‍රදායික යෙදුම්වල අගය පැහැදිලි කිරීම
- රසවත් ව අදහස් ප්‍රකාශනයේ දී ඉඟි වැකි, ප්‍රස්තාව පිරුළු සහ ආප්තෝපදේශ භාවිත කිරීම
- ලේඛන කාර්යයේ දී සාම්ප්‍රදායික යෙදුම් සුදුසු පරිදි භාවිත කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ**


- ⋆ පිරුළු මිණි - - ටී. එස්. ධර්මබන්ධු
- ⋆ සිංහල ප්‍රස්තාව පිරුළු සාහිත්‍යය - - ප්‍රේමදාස ශ්‍රී අලවත්තගේ

# 13
## රචනා

**නිපුණතාව** : 04 අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 4.1 උචිත පරිදි කරුණු සංවිධානය කරමින් අදහස් නිරවුල් ව ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද** : 05යි.

**ඉගෙනුම් පල :**

- රචනාවක ආකෘතිය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- රචනාවක අංග පැහැදිලි කරයි.
- නිවැරදි භාෂාරීතී අනුගමනය කරමින් රචනා ලියයි.
- රචනා ලිවීමේ දී ශිල්පීය දක්ෂතා භාවිත කරයි.
- නිර්මාණාත්මක ව රචනා ලියයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- ආදර්ශ රචනා කීපයක් සූදානම් කර ගන්න.
- තමා විසින් සකස් කරනු ලැබූ රචනා මාතෘකා කීපයක්

**ප්‍රවේශය**

- රචනාවක් යනු කුමක් දැ'යි විමසමින් ප්‍රවේශ වන්න.
  ඇමුණුම අංක 1හි ඇති රචනාව සියලු ම ශිෂ්‍යයන්ට කියවීමට අවස්ථාව ලබා දෙන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර 1**

- ආදර්ශ රචනා කීපයක් ඇසුරින් රචනා ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පියවර 2**

- රචනා මාතෘකාවක් තෝරා ගැනීම
- මාතෘකා ඔස්සේ කරුණු රැස් කිරීම
- රචනා සැකිල්ලක් ගොඩ නැගීම
  - හැඳින්වීම
  - ආරම්භය
  - අන්තර්ගතය
  - අවසානය

**පියවර 3**

- රචනාවේ කඳ හෙවත් අන්තර්ගතය නිර්මාණාත්මක ලෙසින් තර්කානුකූල ව ඉදිරිපත් කිරීම පිළිබඳ දැනුවත් කරන්න.

**පියවර 4**

- භාෂාව නිවැරදි ව යොදා ගැනීම හා ඡේද වෙන් කරමින් ලිවීමට උපදෙස් දෙන්න.
- ව්‍යාකරණ රීති, අක්ෂර වින්‍යාසය, පද බෙදීම, විරාම ලක්ෂණ නිවැරදි ව යෙදීම, පැහැදිලි ව අත් අකුරු ලිවීම යන කරුණු පිළිබඳ ව දැනුවත් කරන්න.

**පියවර 5**

- සුදුසු මාතෘකා කීපයක් ලබා දී සිසුන් ලවා රචනා ලියවන්න.
  **(පෙළ පොතේ 09 පාඩම අදාළ කර ගන්න.)**

**පියවර 6**

- අපේක්ෂිත සාධන මට්ටමට ළඟා නොවූ ශිෂ්‍යයන් හඳුනා ගෙන සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක යොදවා නැවත රචනා ලියවන්න.

**මූලික වදන් හා සංකල්ප :**

- රචනා මාතෘකා පහත දැක්වෙන විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි තෝරා ගැනීම යෝග්‍ය ය.
- **අධ්‍යාපනය, සෞඛ්‍යය, සංවර්ධනය, සංස්කෘතිය, විද්‍යාත්මක තොරතුරු, ස්වභාව සෞන්දර්ය හා කාල්පනික මාතෘකා**

**ගුණාත්මක යෙදවුම්**

- **පෙළ පොත 9 පාඩම**
- විවිධ රචනා මාතෘකා
- සාර්ථක රචනා කිහිපයක් සිසුන්ට කියවීමට සැලැස්වීම
- පුවත්පත්, සඟරා

**පරිශීලනීය ග්‍රන්ථ**

- ⋆ සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය - පී. තේනබදු
- ⋆ ප්‍රබන්ධෝපදේශය - කුමාරතුංග මුනිදාස

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- සාර්ථක රචනාවක තිබිය යුතු ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කිරීම
- රචනා මාතෘකා හඳුනා ගෙන පැහැදිලි කිරීම
- රචනා සැකිල්ලක් ගොඩ නැගීම
- නිවැරදි භාෂා රීති අනුගමනය කරමින් රචනා ලිවීම
- ශිල්පීය දක්ෂතා භාවිත කරමින් මාතෘකානුකූල වාක්‍ය රචනා ලිවීම

ඇමුණුම - 1

**මා අවට පරිසරය**

දකුණු ආසියාවේ සුරංගනාව බඳු සිරිලංකා ද්වීපයේ ඉපදුණ මා හට උපතින් ම මනරම් ශෝභමාන පරිසරයක් හිමි විය. උත්තරීතර මවු පදවිය ලැබූ මා වැදූ මව මෙන් ම උත්තරීතර මවක් ඇත්නම් ඒ අවට පරිසරය යි. මවක තම දරුවාට කිරි පොවමින් ඇති දැඩි කරන්නා සේ පරිසරය තමාට එරෙන කිරි වන ජලය ලබා දී අප ඇති දැඩි කරයි. ආහාර, ඇඳුම් පැලඳුම්, නිවාස, වාතය ලබා දෙන පරිසරයට ගෞරව කළ යුතු ය. මා කුඩා කල සිට ඇති දැඩි වුණේ රුහුණුපුර පරිසරයේ ය.

උස් කඳු පන්ති නොතිබෙන ප්‍රදේශයේ කුඩා කඳුගැට දක්නට ලැබේ. එම කඳු ගැටවලින් ගලා හැලෙන දිය ඇලි නැතුවා ම නො වේ. රම්මල කන්දෙන් පටන් ගන්නා එක්තරා දිය ඇල්ලක් මා සිහින රාජධානියට රැගෙන යන්නට සමත් විය. එම දිය ඇල්ල දිවා කාලයේ දී නිසල ව ගලා බසින්නේ පුරුද්දට මෙනි. එම දිය ඇල්ලෙහි පහස ලබන මීන් යාළුවෝ ජලයෙන් ඉහළට නගිමින් රැඟුම් රඟති. හිරු එළිය නිසා ඔවුන්ගේ රක්ත වර්ණ උදර ප්‍රදේශය ගිනිගෙන දැවෙන්නා මෙනි. රාත්‍රියට සඳරැස් දහරින් වර්ණ ගැන්වෙන දිය ඇලි තොමෝ රිදී නයෙකු මෙන් ගලා බසින්නී ය. නුබ ගැබින් ගිලිහී වැටෙන චන්ද්‍ර රශ්මීන් පිඹ හළ රිදී සුණු රාශියක් මෙනි.

දිය ඇල්ලේ පෝෂක ප්‍රදේශය ලෙස නම් කර ඇති කන්දෙහි සහ අවට කඳු ප්‍රදේශයන්හි වැඩ වෙසෙන තුරු ලතාවන් මහා දැවැන්ත අන්දමින් අපි රුහුණු වැසියම්හ යි යනුවෙන් පවසතැයි මට සිතේ. මාර, බුරුත, කොහොඹ  වැනි දැවමය අතින් අනර්ඝ ශාකයන් අතර රසවත් පලතුරින් අප පිනවන පේර, ඉඳි, සියඹලා වැනි ශාකයෝ ද ඒ කඳු භූමියෙහි කොටස්කරුවෝ වෙති. පහත ප්‍රදේශවාසීන්ට දර, පලතුරු, දැව සපයන ඒ ශාකයෝ දර කැඩීමට යන වැසියන්ට සෙවණ සහ සිසිලස ලබා දෙති. ගැමියෝ ද විහඟුහු ද මෙම පාරිසරික කොටස්කරුවන් සමග සිතින් හා ගතින් බැඳී සිටිති.

කැලය දෙසට ගිය විට ශාක මත රැඳී සිටින සොඳුරු විහඟුන් දුටු විට මනසට ඉමහත් ප්‍රබෝධවත් බවක් දැනේ. කැලය මැදින් ගලා බසින සුපුරුදු දිය දහරාව කිරම ඔය නමින් ගම මැදින් ගලා බසියි.  දණ්ඩි, කොරලි, තිත්ත පැටවුන්ගේ රජ දහන වන කිරම ඔය නිරතුරුව ම මාළු බාන ගැමි කොලු කුරුට්ටන්ගෙන් පිරී පවතී.

ගමේ බොහෝ දෙනා රැස්වන ඇලපාත ළිඳ නිතර ම අවිවේකි තැනකි. එම අවිවේකී බවට රුකුල් සපයන්නේ ගැමි කාන්තාවන්ගේ කතා බහ සහ කැකිරි පැලෙන සිනාව යි. කිරම ඔය වෙළ දෙසට හරවන සොරොව්ව තුළින් ජලය මහ හඬින් වැටෙයි. එම ජල කඳ සමග වැටෙන විසිවෙන මාළුවන් අල්ලන්ට ගිජුලෙස බලා සිටින කැදර කොස්වහළිහිණියෝත් පිළිහුඩුවෝත් නිරතුරුව ම සොරොව්ව අසල ගී ගයති. මා අවට පරිසරයේ සුන්දර බව සිංහල වචන හැත්තෑ පහකට සීමා කිරීම අසීරු යැයි මට හැඟේ.

සිංහල අලුත් අවුරුදු දිනවල දී අප ගම් පියසේ පරිසරයට වසන්තය උදා වූවා වැනි ය. රතුපාටට කජු පුහුලන් කජු ගස්වල බරව පවතින අතර එරබදු  මල් රතු පාටින් දිලේ. ඒ කාලයට අවට පරිසරය මඟුල් ගෙයක් වැනි ය.

# 14
## විරාම ලක්ෂණ

**නිපුණතාව** : 04 අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : **4.2** ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් ලියයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- විරාම ලක්ෂණ නිවැරදි ව හඳුනා ගෙන නම් කරයි.
- විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- ලේඛන කාර්යයේ දී විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**
**පෙර සූදානම**

- **පෙළ පොතේ** 13 පාඩම කියවා අවශ්‍ය පැහැදිලි කිරීම් සඳහා සූදානම් වන්න.
- විරාම ලක්ෂණ යෙදූ වාක්‍ය කීපයක් ඇතුළත් ලේඛනයක් සකස් කර ගන්න.

**ප්‍රවේශය**

- විරාම ලක්ෂණවල වැදගත්කම විමසා කථාවකින් පාඩමට පිවිසෙන්න.
  උදා : "**මරන්න එපා නිදහස් කරන්න**" වැනි යෙදුමක් යොදා ගන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර** 1

- විරාම ලක්ෂණ පිළිබඳ ශිෂ්‍යයන්ගේ මතකය විමසන්න.
- **දෙතිත .. තිත්තුන ...**

**පියවර** 2

කෙටි ඉර - ඇල ඉර යන විරාම ලකුණු අදාළ පෙළ පොත උපයෝගි කර ගෙන උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

**පියවර** 3

- විවිධ විරාම ලක්ෂණ යෙදූ අභ්‍යාසවල නිරතවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- **පෙළ පොත** 13 **පාඩම**

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- විරාම ලක්ෂණ හඳුනා ගෙන පැහැදිලි කිරීම
- ලේඛනයේ දී විරාම ලක්ෂණ භාවිත කිරීමේ අගය ප්‍රකාශ කිරීම
- නිවැරදි අදහස් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කිරීම
- විරාම ලක්ෂණ උචිත පරිදි භාවිත කිරීම

**පරිශීලනීය ග්‍රන්ථ**

- ⋆ සිංහල ලේඛන රීතිය (නව සංස්කරණය) 2015 - ජාතික අධ්‍යාපන ආයතනය.

# 15

## සාරාංශය

**නිපුණතාව** : 04 අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 4.3 පාඨයක අන්තර්ගතය හකුළුවා ව්‍යක්ත ලෙස ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද** : 05යි.

**ඉගෙනුම් පල :**

- සාරාංශය යනු කුමක් ද'යි පැහැදිලි කරයි.
- සාරාංශකරණයේ රීති හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- අදහස් සංක්ෂිප්ත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.
- රීති අනුගමනය කරමින් ඡේද හා කොටස් අවබෝධයෙන් යුතු ව සාරාංශ කර ලියයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- පෙර දින ප්‍රවෘත්තියක් ප්‍රකාශ කිරීම සඳහා සූදානම් කර ගන්න.

**ප්‍රවේශය**

- එම ප්‍රවෘත්තිය ප්‍රකාශ කරමින් පාඩමට ප්‍රවේශ වන්න.

**පාඩම සංවර්ධනය**

පියවර 1

- සාරාංශය යනු කුමක් ද'යි සිසුන්ගෙන් විමසමින් සාරාංශකරණයේ වැදගත්කම පැහැදිලි කරන්න.

පියවර 2

- සාරාංශ ලිවීමේ සම්මත රීති පැහැදිලි කරන්න.

පියවර 3

- පෙළ පොතේ (11 පාඩම) කියවමින් එහි ඇති කරුණු සාකච්ඡා කරන්න.

පියවර 4

- සාරාංශ කිරීමේ දී කළ යුතු කාර්යයන් වෙන ම ද නොකළ යුතු කාර්යයන් වෙන ම ද සාකච්ඡා කරන්න.
- ලේඛනය අවබෝධයෙන් යුතු ව කිහිප වරක් කියවීමට අවස්ථාවක් ලබා දෙන්න.
- ලේඛනයේ වැදගත් කරුණු සටහන් කර ගැනීමට යොමු කරන්න.
- මුල් ලේඛනයේ අදහසට හානි නොවන අයුරින් ග්‍රහණය කරගත් අදහස අර්ථවත් ව සාරාංශ කිරීමට යොමු කරන්න.

පියවර 5

- දෙන ලද ඡේදයෙන් තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කිරීමට උපදෙස් දෙන්න.

**පියවර 6**

- ශිෂ්‍යයන් ඇමුණුම අංක 1හි ඇති සාරාංශකරණ අභ්‍යාසවල නිරත කරවන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ ශිෂ්‍යයන් හඳුනා ගෙන ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න. ඉන්පසු නැවතත් අභ්‍යාසවල නිරත කරවන්න.
  (ඇමුණුම 1 යොදාගත හැකි ය.)

**ගුණාත්මක යෙදවුම්**

- **පෙළ පොත 11 පාඩම**
- පොත්, පුවත්පත්, සඟරා ආදියෙන් උපුටා ගනු ලබන කොටස්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- සාරාංශකරණය යනු කුමක් ද'යි හඳුනා ගෙන ප්‍රකාශ කිරීම
- සාරාංශකරණයේ සම්මත රීති හඳුනා ගෙන ඉදිරිපත් කිරීම
- ලේඛනය කියවා වැදගත් කරුණු සටහන් කර ගැනීම
- සාරාංශකරණය සඳහා ශිල්පීය දැනුම භාවිත කිරීම
- සාරාංශකරණයේ යෙදීම.

**පරිශීලනීය ග්‍රන්ථ**

⋆ සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය - - පී. තේනබඳු

**ඇමුණුම 01 සාරාංශය**

සාරාංශ කරන්න

i. බුද්ධාගම ලංකාවට පැමිණීමට පෙර කවර හෝ අන්දමක චින්තාවලියක් මෙරට පැවතුණේ යැ'යි සිතීමට ඉඩක් නැත. චින්තාවලිය යනුවෙන් මා මෙහි අදහස් කරන්නේ කෙනෙකුගේ සිතුවිලිවලින් ඊළඟ පරම්පරාවේ අය ප්‍රයෝජන ගනිමින් තමා විසිනුදු ඊට අලුත් චින්තනයක් එක්කර ඊළඟ පරපුරට දීමෙන් ඇතිවන සම්ප්‍රදායීය චින්තන පරම්පරාව යි. මෙබඳු චින්තාවලියක් මුලින් ම මිහිඳු හිමියන් මෙහි ගෙන ආ බවට සාක්ෂ්‍ය ඇත්තේ එනම් බෞද්ධ චින්තාවලිය යි. ලාංකිකයන් මෙය එසේ ම පිළිගත්තා විනා එයට අලුතෙන් යමක් එක් කළ බවක් දැනගන්නට නැත.

සිංහල කතා කලාවේ විකාශනය
කේ. ජයතිලක

ii. පැවිද්දෙකු විසින් ලියන ලද පළමුවැනි පද්‍ය කාව්‍යය සඳකිඳුරුදා කව විය හැකි ය. පසුකාලයේ (සමහරවිට එකල පවා) පන්සල්වල නාට්‍ය ස්වරූපයෙන් ඉදිරිපත් කරන ලද්දකි සඳකිඳුරු ජාතකය. එසේ නම් නාට්‍ය මෙන් ම කාව්‍යය ද පළමුවෙන් ම පන්සලට වැදගත්තේ සඳකිඳුරු ජාතකය ඇසුරෙන් යැයි නිගමනය කළ හැකි වෙයි. සඳකිඳුරුදා කව අන් අතකින් සිංහල කාව්‍යය පෘථුලකරණයට එතරම් පිටිවහලක් නොවූ නමුත් රමණීය වාක් චිත්‍ර සහිත වර්ණනා රැසකින් යුක්ත වූවකි.

**ඇමුණුම 2**
සාරාංශකරණයේ දී සැලකිය යුතු කරුණු

1. ඡේදය පළමු වර සම්පූර්ණයෙන් කියවා මුඛ්‍ය අදහස් වටහා ගැනීම
2. දෙවන වර කියවීමේ දී මුඛ්‍ය අදහස ප්‍රකාශ වන වචන, වාක්‍ය, වාක්‍යාංශ යටින් ඉරි ඇඳ ගැනීම
3. තුන් වන වර කියවීමේ දී මුඛ්‍ය අදහසට අදාළ අනෙකුත් අදහස් ඇත්නම් ඒවාට අංක යොදා ගැනීම
4. ලකුණු කර ගත් වාක්‍ය ඛණ්ඩ කියවීම
5. උපමා, අලංකාර, නිර්වචන, පුනරුක්ති, විවරණ, නිදර්ශන කපා හැරීම
6. අදහස් පෙළ ගස්වා සකස් කර ගැනීම
7. භාවාර්ථය හඳුනා ගැනීම
8. ඡේදය පසෙකින් තබා අදහස් ගළපා මතකයෙන් සාරාංශය ලිවීම
9. ලියූ සාරාංශයෙන් මුල් ඡේදයේ අදහස ප්‍රකාශ වී ඇද්දැයි විමසීම
10. මුල් ඡේදයේ වචන වෙනුවට හැකිතාක් දුරට තමාගේ ම වචන අදාළ පරිදි යොදා ගැනීම
11. මුල් පාඨයේ ඡේද කිහිපයක් තිබුණත් සාරාංශය එක් ඡේදයක් වශයෙන් ලිවීම
12. සාරාංශයෙහි ද ඡේදයක තිබිය යුතු ලක්ෂණ ඇතුළත් වීම
13. මුල් ඡේදයෙන් බැහැර ව තම අදහස් ඇතුළත් නොකිරීම
14. ප්‍රකෘති කථන විකෘති කථනයෙන් ලිවීම
15. මුල් ඡේදයෙහි පද බෙදා ඇති ආකාරය අනුව සාරාංශයෙහි ද පද බෙදීම
16. කාලය කළමනාකරණය කර ගැනීම

# 16

## ප්‍රායෝගික ලේඛන

**නිපුණතාව** : 05 ජීවන අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 5.1 නිරවුල් ව හා සංක්ෂිප්ත ලෙස ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 05යි.

**ඉගෙනුම් පල :**

- රාජකාරි ලිපියක ආකෘතිය ඉදිරිපත් කරයි.
- ලිපි ලිවීමේ ශිල්පීය ප්‍රයෝග භාවිත කරයි.
- යෝග්‍ය ආකෘති භාවිත කරමින් ලිපි ලියයි.
- විදුලි ටෙලිමේල් පණිවිඩයක මූලිකාංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- විදුලි ටෙලිමේල් පණිවිඩයක ආකෘතිය පැහැදිලි කරයි.
- ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් ටෙලිමේල් ආකෘතිය සම්පූර්ණ කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- රාජකාරි ලිපියක් හා ටෙලිමේල් පණිවිඩයක් ප්‍රදර්ශනය කිරීමට සූදානම් කර ගන්න.

**ප්‍රවේශය**

- රාජකාරි ලිපියක් හා ටෙලිමේල් පණිවිඩයක් ප්‍රදර්ශනය කරමින් පාඩම සඳහා ප්‍රවේශ වන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර 1**

- සන්නිවේදන කාර්යය පහසු කරලීම සඳහා ලිපි ලිවීමේ වැදගත්කම ශිෂ්‍යයන් හා සාකච්ඡා කරන්න.
- ලිපි ලිවීමේ අරමුණු අනුව ලිපියේ ආකෘතිය වෙනස් බව ද ඒ අනුව ලිපි වර්ග කළ හැකි බව ද පැහැදිලි කරන්න.

**පියවර 2**

- රාජකාරි ලිපියක් පෙන්වා එහි ස්වභාවය පිළිබඳ ව අවබෝධ කර ගැනීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- රාජකාරි ලිපියක හා පෞද්ගලික ලිපියක ඇති වෙනස්කම් පෙළ පොතේ පාඩම ඇසුරින් ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- රාජකාරි ලිපි ලිවීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.

**පියවර 3**

- ඇමුණුම 1හි ඇති රාජකාරි ලිපි ආකෘති පිළිබඳ ව ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවීම සඳහා ප්‍රදර්ශනය කරන්න.
- ඒ ඇසුරින් රාජකාරි ලිපියක ඇතුළත් විය යුතු මූලිකාංග ශිෂ්‍යයන්ගෙන් විමසන්න.
    - යවන්නාගේ නම, තනතුර, ලිපිනය හා දිනය
    - ලබන්නාගේ තනතුර හා ලිපිනය
    - ආමන්ත්‍රණය
    - මාතෘකාව
    - කරුණු
    - අවසානය

- රාජකාරී ලිපි ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න
  - සංක්ෂිප්ත බව
  - ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය භාවිත කිරීම
  - පිළිවෙළ, පිරිසිදු බව හා ක්‍රමානුකූල බව
  - රජකාරි ලිපියේ මාතෘකාවෙන් අන්තර්ගතයේ මූලික අදහස පිළිබිඹු කිරීම
  - ඇමුණුම 1හි ඇති රාජකාරි ලිපියක ආකෘතිය සම්පූර්ණ කිරීමේ අභ්‍යාසයක නිරත කරවන්න
- ඇමුණුම 2හි ඇති තේමා අතරින් එකක් තෝරාගෙන රාජකාරි ලිපියක් ලිවීමට යොමු කරවන්න (සියලු ම සිසුන්ට තනි තනි ව පිළිතුරු ලිවීමට අවස්ථාව ලබා දෙන්න)

**පියවර 5**

**විදුලි පුවත්**

- ගුරුවරයා විසින් ටෙලිමේල් පණිවුඩයක් හෝ පෙළ පොතේ ඇති ආකෘති හෝ ප්‍රදර්ශනය කරමින් පාඩමට ප්‍රවේශ වන්න
- ටෙලිමේල් පණිවුඩයක ආකෘතිය පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න
- එහි ඇති මූලික කොටස් පිළිබඳ ව අවධානය යොමු කරවන්න

  **ලබන්නාගේ ලිපිනය**

  **දන්විය යුතු පණිවුඩය (ඉතා කෙටියෙන්)**

  **යවන්නාගේ නම**

  **යවන්නාගේ ලිපිනය**

**පියවර 6**

- ඇමුණුම 3හි ඇති ආකෘතිය මගින් ඉහත තොරතුරු පැහැදිලි කරන්න.
- ටෙලිමේල් පණිවිඩයක් යැවීමේ දී සැලකිලිමත් විය යුතු පහත සඳහන් කරුණු කෙරේ සිසුන්ගේ අවධානය යොමු කරවන්න.
- සංක්ෂිප්ත ව හා පැහැදිලි ව අදාළ කාරණය සටහන් කිරීම
- අක්ෂර වින්‍යාස රීති අනුගමනය කිරීම
  එසේ නොමැති විට අර්ථය වෙනස් වන බවත් පැහැදිලි කරන්න.
- විශේෂයෙන් ම ටෙලිමේල් පණිවිඩය යවන වේලාව නිවැරැදි ව සටහන් විය යුතු ය.
  එසේ ම ටෙලිමේල් පණිවිඩය යවන්නේ කවුරුන් ද යන්න පැහැදිලි ව සටහන් කළ යුතු බව පැහැදිලි කරන්න.
- ටෙලිමේල් පණිවිඩ ආකෘති පත්‍රයක් ලබා දී එය සම්පූර්ණ කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.


**ගුණාත්මක යෙදවුම්**

- රාජකාරි ලිපියක ආකෘති දක්වෙන පත්‍රිකාවක්
- රාජකාරි ලිපි කිහිපයක්
- ටෙලිමේල් ආකෘතිය දක්වෙන පත්‍රිකාවක්
- ටෙලිමේල් පණිවිඩ කිහිපයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- රාජකාරි ලිපියක ආකෘතිය හඳුනා ගෙන ඉදිරිපත් කිරීම
- රාජකාරි ලිපිවල අවශ්‍යතාව පැහැදිලි කිරීම
- ලිපි ලිවීමේ ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් රාජකාරි ලිපි ලිවීම
- ටෙලිමේල් පණිවිඩයක ආකෘතිය හඳුනා ගෙන ඉදිරිපත් කිරීම
- ටෙලිමේල් පණිවිඩ යැවීමේ අවශ්‍යතාව පැහැදිලි කිරීම
- ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් ටෙලිමේල් ආකෘති පත්‍රයක් සම්පූර්ණ කිරීම

රාජකාරි ලිපියක ආකෘතිය I



- ඔබ සංවිධායක කමිටුවේ ලේකම් යයි සිතා අධ්‍යාපන චාරිකාවක් යාම සඳහා ඩිපෝ කළමනාකරුගෙන් බස් රථ දෙකක් ලබා දෙන ලෙස ඉල්ලා රාජකාරි ලිපියක් සකස් කරන්න.

- පරිසර සංගමයේ ලේකම් යැයි සිතා ඩෙංගු මර්දනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහනක් පිරිවෙනේ පැවැත්වීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා ප්‍රාදේශීය ලේකම්තුමාට යවන රාජකාරි ලිපියක් සකසන්න.

- හදිසි අසනීප තත්වයක් නිසා පිරිවෙනට පැමිණීමට නොහැකි බව දන්වා යවන ටෙලිමේල් පණිවිඩයක් සකස් කරන්න.

**ඇමුණුම 01**

රාජකාරි ලිපියක ආකෘතිය II

| |
|---|
| යවන්නාගේ නම තනතුර හා ලිපිනය<br><br>දිනය<br><br>ලබන්නාගේ තනතුර හා ලිපිනය<br><br>ආමන්ත්‍රණය |
| මාතෘකාව |
| |
| අන්තර්ගත කළ යුතු කරුණු |
| |
| අවසානය |

TM-1

යවන්නා විසින් මුද්දර පසු පිටෙහි ඇලවිය යුතුයි.
அனுப்புபவர் முத்திரைகளை மறுபக்கத்தில் ஒட்டுதல் வேண்டும்.
Stamp to be affixed by the sender overleaf.

පැමිණිල්ලක් කළ යුතුවු විට මෙම ලදුපත ඉදිරිපත් කරන්න.
முறையீடு செய்யும்போது இப்பற்றுச்சீட்டைச் சமர்ப்பிக்கவும்.
Attach this receipt when making a complaint.

ටෙලිමේල් ලදුපත
ரெலிமெயில் பற்றுச்சீட்டு / Receipt for Telemail

| අංකය<br>இல<br>No. | දිනය<br>திகதி<br>Date | මුදල<br>தொகை<br>Amount<br>රු/ரூ /Rs ශ/ச / C |
|---|---|---|
| | | |

---

TM-1

දින මුද්‍රාව
திகதி முத்திரை
Date Stamp

# ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව
# ටෙලිමේල් පණිවුඩ සේවාව - දේශීය
# இலங்கை அஞ்சல் திணைக்களம்
# 'ரெலிமெயில்' செய்திச் சேவை - உள்நாடு
# Department of Posts - Sri Lanka
# Telemail Service - Local

අංකය
இல
No.

A. යවන්නා විසින් පිරවීම සඳහා පමණි/ அனு[illegible] நிரப்பப்படுதல் வேண்டும்./ To be filled by the sender only.

| යවන්නාගේ නම සහ ලිපිනය/அனுப்புபவரின் பெயரும் விலாசமும்<br>Name and Address of the sender. | ලබන්නගේ නම සහ ලිපිනය / பெறுபவரின் பெயரும் விலாசமும் / Name and Address of the Recipient |
|---|---|
| | |
| | |
| | |

පණිවුඩය /செய்தி /Message

| |
|---|
| |
| |
| |
| |
| |

| ටෙලිමේල් සේවාව පිළිබඳ පසුපිට උපදෙස් හා කොන්දේසි වලට එකඟ වෙමි.<br>பின்பக்கத்தில் கொடுக்கப்பட்டுள்ள, ரெலிமெயில் சேவை தொடர்பான அறிவுரைகளுக்கும், நிபந்தனைகளுக்கும் உடன்படுகிறேன்.<br>I agree with the instructions and conditions of the Telemail Service mentioned overleaf.<br>.......................................<br>අත්සන/ஒப்பம்/Signature | බෙදීම සනාථ කිරීමේ තොරතුරු අවශ්‍ය ද?<br>ஒப்படைத்தமையை உறுதிப்படுத்த வேண்டுமா?<br>Whether confirmation of Delivery is necessary?<br>☐ ඔව්/ஆம் /Yes ☐ නැත/இல்லை/No |
|---|---|

B. කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි / அலுவலக உபயோகத்திற்கு மாத்திரம்/ For office use only.

| වර්ගය<br>வகை<br>Category | භාරගත් වේලාව<br>பாரமெடுத்த நேரம்<br>Time of Acceptance | ආරම්භක කාර්යාලය<br>ஆரம்பக் காரியாலயம்<br>Office of Origin | දිනය<br>திகதி<br>Date | සේවා උපදෙස්<br>சேவை அறிவுறுத்தல்<br>Service Instructions | වචන ගණන சொற்கள் No. of words } ගාස්තුව கட்டணம் Charges } ____<br>ස්ථාවර ගාස්තුව/ நிரந்தரக் கட்டணம்/ Fixed Fee } ____ |
|---|---|---|---|---|---|
| ටෙලිමේල්<br>ரெலிமெயில்<br>Telemail | | | | | බෙදීම සනාථ කිරීමේ ගාස්තුව/ ஒப்படைத்தமையை உறுதிப்படுத்தும் கட்டணம்/ Delivery Confirmation Fee } ____<br>මුළු ගාස්තුව /மொத்தக் கட்டணம்/ Total Charges } ____ |

| | | | |
|---|---|---|---|
| යැවූ වේලාව<br>அனுப்பிய நேரம்<br>Sent at: | | යැවූ කාර්යාලය/<br>அனுப்பிய காரியாலயம்<br>Sent to: | |
| දුරකථන අංකය<br>தொலைபேசி இலக்கம்<br>Telephone No. | | නිලධාරියාගේ අත්සන/<br>உத்தியோகத்தரின் ஒப்பம்<br>Signature of the Officer | |

TM-2

ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව
ටෙලිමේල් පණිවුඩ සේවාව - දේශීය
இலங்கை அஞ்சல் திணைக்களம்
'ரெலிமெயில்' செய்திச் சேவை - உள்நாடு
Department of Posts - Sri Lanka
Telemail Service - Local

තැපැල් කාර්යාලය
அஞ்சல் காரியாலயம்
Post Office ____________

ලබන්නාගේ නම සහ ලිපිනය
பெறுபவரின் பெயரும் விலாசமும்
Name and Address of the Recipient

දින මුද්‍රාව
திகதி முத்திரை
Date Stamp

Date Stamp

| වර්ගය<br>வகை<br>Category | භාරගත් වේලාව<br>பாரமெடுத்த நேரம்<br>Time of Acceptance | ආරම්භක කාර්යාලය<br>ஆரம்பக் காரியாலயம்<br>Office of Origin | දිනය<br>திகதி<br>Date | සේවා උපදෙස්<br>சேவை அறிவுறுத்தல்<br>Service Instructions | ලැබුණු වේලාව සහ අත්සන<br>பாரமெடுத்த நேரம் & ஒப்பம்<br>Received at & Signature |
|---|---|---|---|---|---|
| ටෙලිමේල්<br>ரெலிமெயில்<br>Telemail | | | | | |

පණිවුඩය /செய்தி /Message

**ටෙලිමේල් පණිවුඩ සේවාව සඳහා අදාළ උපදෙස් හා කොන්දේසි**

අ. ලබන අයගේ නම හා ලිපිනය පෙර පිටුවේ දකුණු ඉහළ කෙළවර ඇති කොටුවේ නිවැරදිව ලියන්න (නිවැරදිව හා ඉක්මණින් ලබාදීම සඳහා සම්පූර්ණ ලිපිනය අත්‍යවශ්‍ය වේ. )

ආ. මෙම පණිවුඩය බෙදීමේ තොරතුරු යවන්නාට අවශ්‍යනම් යවන්නාගේ නම සහ සම්පූර්ණ ලිපිනය පෙරපිට වම් ඉහළ කෙළවරේ ඇති කොටුවේ සටහන් කරන්න.

ඇ. යවන්නාගේ නම පණිවුඩය සමඟ යැවිය යුතු නම් පෙරපිට A කොටුවේ පණිවුඩයට ඇතුළත් කරන්න.

ඈ. i. කොළඹ ටෙලිමේල් මධ්‍යස්ථානයේ මහජන කවුළුව පස්වරු 6.00 දක්වා විවෘතව ඇත. බෙදීමේ කටයුතු රාත්‍රී 8 දක්වා සිදුකෙරේ.
ii. ගමනාන්ත තැපැල් කාර්යාලයක් වැසීමට පැය 2කට කලින් භාරදෙනු ලබන ටෙලිමේල් පණිවුඩ එදිනම බෙදීමට කටයුතු කරනු ලැබේ.

ඉ. ටෙලිමේල් පණිවුඩ තැපැල් හා විදුලි සංදේශ නීති රීති වලට යටත්ව ක්‍රියාත්මක කෙරේ.

ඊ. ගාස්තු අයකිරීම
i. පණිවුඩයේ පළමු වචන 10 දක්වා රු. 20.00 ක් සහ වැඩිවන සෑම වචනයක් සඳහාම රු. 1.50 කි.
ii. සෑම පණිවුඩයක් සඳහා ම රු. 10.00 ක් වූ ස්ථාවර ගාස්තුවක් අයකෙරේ.
iii. බෙදීම සහාථ කරගැනීමට අවශ්‍ය වන අවස්ථාවක රු. 15.00 ක් වූ ගාස්තුවක් ගෙවිය යුතුය.
iv. යවන්නාගේ සහ ලබන්නාගේ ලිපිනය සඳහා ගාස්තු අය කරනු නොලැබේ.

**ரெலிமெயில் செய்திச் சேவை தொடர்பான அறிவுரைகளும், நிபந்தனைகளும்**

அ. செய்தியைப் பெறுபவரின் பெயரும் முகவரியும் முன்பக்கத்தில் வலதுபக்க மேல் முலையில் சரியாக எழுதப்படல் வேண்டும். (விரைவாகவும், சரியாகவும் ஒப்படைப்பதற்குப் பூரண் விலாசம் அவசியம்.)

ஆ. இந்தச் செய்தி ஒப்படைத்தமை பற்றிய விபரங்கள் அதனை அனுப்பியவருக்குத் தேவையாயின் அனுப்பியவரின் பெயர், பூரண முகவரி என்பனவற்றை முன்பக்கத்தில் இடதுபக்க மேல் முலையில் உள்ள கூட்டில் எழுதப்படல் வேண்டும்.

இ. அனுப்புபவரின் பெயர் செய்தியுடன் அனுப்பப்படல் வேண்டுமானால் அதனை முன்பக்கத்தில் A கூட்டில் செய்தியுடன் சேர்த்து எழுதவும்.

ஈ. i. கொழும்பு 'ரெலிமெயில்' நிலையத்தில் பொதுமக்களுக்கான கருமபீடம் பிற்பகல் 6.00 மணிவரை திறந்திருக்கும். ஒப்படைப்பு வேலைகள் இரவு 8.00 மணிவரை நடைபெறும்.
ii. ஒப்படைப்பு அலுவலகம் மூடப்படுவதற்கு 2 மணித்தியாலங்களுக்கு முன்பு கையளிக்கப்படும் 'ரெலிமெயில்' செய்திகள் அன்றே ஒப்படைக்கப்படுவதற்கு நடவடிக்கை எடுக்கப்படும்.

உ. 'ரெலிமெயில்' செய்திகள் தபால், தந்திச் சட்டத்திட்டங்களுக்கு அமைவாகச் செயற்படுத்தப்படும்.

ஊ. **கட்டணம் :**
1. செய்தியில் எழுதப்படும் முதல் 10 சொற்களுக்கு ரூபா 20.00 மேலதிக ஒவ்வொரு சொல்லுக்கும் ரூபா. 1.50
2. ஒவ்வொரு செய்திக்கும் ரூபா 10.00 நிரந்தரக் கட்டணம் அறவிடப்படும்.
3. ஒப்படைத்தமையை உறுதிப்படுத்தல் தேவையெனின் அதற்கான கட்டணம் ரூபா 15.00
4. அனுப்புபவரின், பெறுபவரிள் முகவரிக்கு கட்டணம் அறவிடப்படுவதில்லை.

## Instructions and conditions regarding the Telemail Service

A. Write the name and address of the recipient correctly in the cage on the top right hand corner of the previous page. (Full address is essential to guarantee the correct and expeditious delivery.)

B. If the particulars regarding the delivery of this message is desired by the sender, name and the full address of the sender must be mentioned in the cage appearing on the left top corner in the page overleaf.

C. If the name of the sender to be transmitted with the message, it should be included in the message in cage A overleaf

D. i. Public counter of the Colombo Telemail center is open up to 6.00 p.m. Delivery is done till 8.00 p.m.
ii. Action will be taken to deliver the Telemail messages on the same day if handed in before two hours of the closing of the office of detination.

E. Telemail service is operative subject to Post and Telegraph rules and regulations.

G. **Charges.**
i. Rs.20/- for the first ten words of the message and Rs. 1.50 for each editional word.
ii. A fixed fee of Rs. 10/- is levied for each message
iii. A fee of Rs.15/- should be paid when confirmation of delivery is desired.
iv. No charges will be levied for the address of the sender and the recipient.

# 17
## උම්මග්ග ජාතකය (නිර්දිෂ්ට කෘති)

**නිපුණතාව** : 06 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනී.

**නිපුණතා මට්ටම** : **6.1** ගද්‍ය පාඨ කියවා අර්ථ පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 15යි.

**ඉගෙනුම් පල :**

- නිර්දිෂ්ට පාඨ නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව කියවයි.
- නිශ්ශබ්ද ව කියවා එහි ව්‍යංගාර්ථ හා සමස්තාර්ථය ප්‍රකාශ කරයි.
- අවස්ථෝචිත ව විවිධ ශෛලීන්ට අනුව ගද්‍ය පාඨ කියවයි.
- උම්මග්ග ජාතකය කියවා රසාස්වාදයේ යෙදෙයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- උම්මග්ග ජාතකයේ මුල සිට පරිච්ඡේද කථා අවසානය දක්වා නිවැරදි උච්චාරණ විධීන්ට අනුව අර්ථ ප්‍රකාශ වන සේ පැහැදිලි කිරීමට සූදානම් කර ගන්න.
- සියලු ම සිසුන් සතු ව උම්මග්ග ජාතකයේ නියමිත කතා කොටස් ඇතුළත් පිටපත් තිබේ දැ'යි සොයා බලන්න.
- ඒවා කියවාගෙන එන ලෙස දන්වන්න.

**ප්‍රවේශය**

- **'ආලෙ බැන්ද මාගේ රම්‍ය වන්'** - ගීත ඛණ්ඩය ගායනා කරමින් පාඩමට පිවිසෙන්න.
- මෙම ගීතය පිළිබඳ ව ඔවුන් දන්නා තොරතුරු ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙය උම්මග්ග ජාතකයේ ''දික්තලා කාළගෝළ කතාව'' ආශ්‍රයෙන් ලියන ලද්දක් බව පැහැදිලි කරන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර 1**

- උම්මග්ග ජාතකය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
- උම්මග්ග ජාතකයේ කොටසක් ගුරුවරයා විසින් සියලු ම ශිෂ්‍යයන්ට ඇසෙන සේ කියවන්න.

**පියවර 2**

- සියලු ම ශිෂ්‍යයන්ට ඡේද වශයෙන් උම්මග්ග ජාතකය කියවීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 3

- උම්මග්ග ජාතක කතාවේ එදිනෙදා කියවන කොටස්වල අර්ථ පැහැදිලි කරන්න.

පියවර 4

- සිසුන්ට ඒ ඒ අනුකතාවල ඇති අර්ථ වටහා ගැනීමට අපහසු පද වෙන ම පොතක සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
  මුල සිට පරිබණ්ඨ කතා අවසානය දක්වා පැහැදිලි කර දීමෙන් පසු සියලු සිසුන් සටහන් කරගත් දුරවබෝධ වචන සිසුන් සමග සාකච්ඡා කරමින් ගුරුවරයා මැදිහත් වී අර්ථ පැහැදිලි කරන්න.
- උම්මග්ග ජාතකයේ මුල සිට පරිබණ්ඨ කතා අවසානය දක්වා ඇති සියලු කතා වෙන වෙන ම සරල බසින් ලිවීමට සිසුන් දැනුවත් කරන්න.
- ඒ ඒ දිනවල දී පැහැදිලි කර දෙන ලද පරිකථාවල දක්නට ඇති කාව්‍යෝක්ති හා අලංකාර ඉස්මතු කරමින් සිසුන් හා සාකච්ඡාවක නිරත වෙමින් ගද්‍ය කාව්‍ය රසාස්වාදයේ යෙදෙන්න.
- පරිබණ්ඨ කතා අවසානයට පැහැදිලි කිරීමෙන් පසු කේවල ක්‍රියාකාරකමක් ලෙස සියලු කතා සරල බසින් ලිවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- එක් එක් චරිතකතා අනුව සකස් කරගත් ප්‍රශ්න
- උම්මග්ග ජාතකය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- දික්තල කාළගෝළ වේදිකා නාට්‍ය පිටපත
- දික්තල කාළගෝළ වේදිකා නාට්‍ය DVD පටය

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- නිර්දිෂ්ට පාඨ නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව කියවීම
- අර්ථාවබෝධය සඳහා නිශ්ශබ්ද ව කියවීම
- උචිත ශෛලින්ට අනුව ගද්‍ය පාඨ කියවීම
- උම්මග්ග ජාතකයේ නිර්දිෂ්ට කොටස්වලින් ගත හැකි ජීවිතාදර්ශ පැහැදිලි කිරීම
- උම්මග්ග ජාතකය කියවා රස විඳීම

# 18

## බුදුගුණ අලංකාරය (නිර්දිෂ්ට කෘති)

**නිපුණතාව** : 06 ජීවන අද්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනී.

**නිපුණතා මට්ටම** : 6.2 පද්‍ය පන්ති කියවා රස විඳියි; වනපොත් කරයි.

**කාලච්ඡේද** : 21යි.

**ඉගෙනුම් පල :**

- නිවැරදි උච්චාරණය සහිත ව හඬ පාලනයෙන් යුතු ව කියවයි.
- නිශ්ශබ්ද ව කියවා එහි ව්‍යංගාර්ථ සහ සමස්තාර්ථය ප්‍රකාශ කරයි.
- බුදුගුණ අලංකාරයේ කවි කටපාඩමෙන් කියයි.
- බුදුගුණ අලංකාරයේ කවි කියවා රසාස්වාදයේ යෙදෙයි.
- අවස්ථෝචිත ව විවිධ ශෛලීන්ට අනුව කවි ගායනා කරයි.

**පාඩම සංවර්ධනය සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- ගුරුවරයා හෝ කටහඬ මිහිරි ශිෂ්‍ය හිමි නමක සූදානම් කර ගන්න.
- බුදුගුණ අලංකාරයේ නියමිත සියලු පද්‍ය (01 සිට 50) නිවැරදි උච්චාරණ විධීන්ට අනුව ගායනා කිරීමට හා නිවැරදි ව අර්ථ ප්‍රකාශ වන සේ අර්ථාවබෝධය ලබා දීමට සූදානම් කර ගන්න.

**ප්‍රවේශය**

- ගුරුවරයා විසින් තෝරාගත් කවියක් අදාළ ශෛලියට ගායනා කර ශිෂ්‍යයන්ට අවබෝධය ලබා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර 1**

- කවි කිහිපයක් ශිෂ්‍යයන්ට ගායනා කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 2**

- බුදුගුණ අලංකාරයේ කවි 4 බැගින් කටපාඩමින් කීමට සූදානම් වී පැමිණෙන ලෙස ශිෂ්‍යයන් දැනුවත් කරන්න.

**පියවර 3**

- එදිනෙදා කියවන ලද කවිවල අර්ථ පැහැදිලි කරන්න.
- සිසුන්ට බුදුගුණ අලංකාරයේ එදිනෙදා කියවන කවිවල ඇති අර්ථය වටහා ගැනීමට අපහසු පද වෙන ම පොතක සටහන් කර ගැනීමට උපදෙස් ලබා දෙන්න.

**පියවර 4**

- බුදුගුණ අලංකාරය පොතෙහි නිර්දිෂ්ට කවි අතරින් 04 බැගින් පාඩම් කරගෙන පැමිණ පන්තියේ කට පාඩමින් කීමට අවස්ථාව ලබා දෙන්න.
- අදාළ කවි (50) පාඩම් දීමෙන් පසු සියලු සිසුන් සටහන් කරගත් දුරවබෝධ වචන, ගුරුවරයාගේ ද මැදිහත් වීමෙන් අර්ථ විවරණය කරන්න.

පියවර 5

- කාව්‍යෝක්ති හා අලංකාර ඉස්මතු කෙරෙන අයුරින් සිසුන් හා සාකච්ඡාවක නිරත වෙමින් අදාළ පද්‍ය කොටස් රසාස්වාදයේ යෙදෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස කියවීමට කවි (2) බැගින් කණ්ඩායම් දෙකකට ලබා දී ගායනා කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- බුදුගුණ අලංකාරය - - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- නිර්දිෂ්ට කවි නිවැරදි ව හා හඬ පාලනයෙන් යුතු ව කියවීම
- කවි කියවා අර්ථ පැහැදිලි කිරීම
- අදාළ කවි කට පාඩමින් කීම
- කවි කියවා රසාස්වාදයේ යෙදීම

# 19
## විෂය සමගාමී ක්‍රියාකාරකම් (විද්‍යුත් මාධ්‍ය වැඩ සටහන්වලට සවන්දීම)

**නිපුණතාව** : 07 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායී ලෙස යොදා ගනී.

**නිපුණතා මට්ටම** : 7.1 විද්‍යුත් මාධ්‍ය වැඩ සටහන්වලට සවන්දීමේ පුරුද්ද මගින් භාෂා කාර්යයන් ප්‍රායෝගික ව ඉටු කර ගනී.

**කාලච්ඡේද** : 04යි.

**ඉගෙනුම් පල :**

- ගුවන් විදුලි සාකච්ඡාවකට සවන් දී අදහස් ප්‍රකාශ කරයි.
- අවධානයෙන් යුතු ව සවන් දී වැදගත් කරුණු රැස් කර ගනියි.
- සාකච්ඡාවට සවන් දී විචාරාත්මක ව අදහස් ඉදිරිපත් කරයි.
- ගුවන් විදුලි සාකච්ඡාවලට සවන් දීමේ වැදගත්කම පැහැදිලි කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- සුදුසු ක්‍රමයක් භාවිත කරමින් ගුවන් විදුලි සාකච්ඡාවක් ශිෂ්‍යයන්ට සවන්දීම සඳහා සූදානම් කරගන්න.

**ප්‍රවේශය**

- ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන් විසින් රචනා කරන ලද පහත සඳහන් ගීතය ගායනා කරන්න.
  **වැලිතල අතරේ .....................**
  මෙම ගීතය කවුරුන් විසින් රචනා කරන ලද දැ'යි ශිෂ්‍යයන්ගෙන් විමසමින් සාකච්ඡාවක නිරත වන්න.

පියවර 1
- මානවසිංහයන්ගේ ගුවන් විදුලි සාකච්ඡාවකට සවන් දීමට සූදානම් වන ලෙස ශිෂ්‍යයන් දැනුවත් කරන්න.

පියවර 2
- සිසුන් දෙදෙනකු යොදා ගෙන ඇමුණුම 1හි ඇතුළත් ගුවන් විදුලි සාකච්ඡාව පන්තියේ ඉදිරිපත් කරවන්න.

පියවර 3
- එම සාකච්ඡාවේ වැදගත් තොරතුරු සටහන් කරගන්නා ලෙස උපදෙස් ලබා දෙන්න.

පියවර 4
- ප්‍රශ්න අසමින් එම සාකච්ඡාව අවබෝධ කර ගත්තේ දැ'යි මැන බැලීම සඳහා තක්සේරුකරණයක යෙදෙන්න.
- ඇමුණුමෙහි අන්තර්ගතය, භාෂා භාවිතය හා ගත හැකි ආදර්ශ පිළිබඳ සාකච්ඡාවක යෙදෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 1හි ඇතුළත් සාකච්ඡාව

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- ගුවන් විදුලි සාකච්ඡාවකට සවන්දීමේ වැදගත්කම පැහැදිලි කිරීම
- සාකච්ඡාවේ අන්තර්ගත වැදගත් කරුණු ගොනු කර ගැනීම
- සාකච්ඡාවේ දී මතු වූ කරුණු පිළිබඳ විචාරශීලී ව අදහස් ඉදිරිපත් කිරීම
- සාකච්ඡාවට සවන් දී තම සිත්ගත් කරුණු ඉදිරිපත් කිරීම

ඇමුණුම 01

ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන් සමග කළ ගුවන් විදුලි පිළිසඳරක්

**පසුබිමින්**

**ඉරහඳ පායන ලෝකේ**
**අලෝකය අතරේ .............**
**(ගීතයේ හඬ කෙමෙන් මැකී යයි)**

**නිවේදනය :**
ඒ සුමිහිරි ගීතය ''සිකුරු තරුව'' චිත්‍රපටයෙන්. මෙවැනි රසවත් ගීත හා පද්‍ය රැසක් ජාතියට දායාද කළ සංගීතවේදියෙකු සමගයි අද අප ''උදා ගිරෙන්'' ඔබ හමුවන්නේ. මටසිලිටි පද මාලාවකින් යුත් පිරිපුන් බසක් ඇතුළත් පැදි නිර්මාණය කරන මානවසිංහයාණන් අද අප ඉදිරියේ. ආයුබෝවන් මැතිතුමනි.

| | | |
|---|---|---|
| මානවසිංහ | : | ආයුබෝවන් ! |
| නිවේදක | : | ඔබතුමන් පිළිබඳ ව තොරතුරු දැනගන්න අපේ ශ්‍රාවක ජනයා මහත් කැමැත්තෙන් සිටිනවා. |
| මානවසිංහ | : | ඔබට බොහොම ස්තුතියි ! දැන ගන්න ඕනෑ තොරතුරු ? |
| නිවේදක | : | මුලින් ම ඔබතුමන්ගේ ජීවන තොරතුරු බිඳක් අපට හෙළි කළොත් |
| මානවසිංහ | : | මම උපන්නේ 1913 ජූනි මස දහනව වෙනි දා |
| | | රුහුණු ප්‍රදේශයේ බෙලිඅත්තේ, පුවක්දණ්ඩාව කියන ගමේ. මගේ පියා ගම්මුලැදෑනියෙක්. මව නම් රස්සාවක් කළේ නෑ. |
| මානවසිංහ | : | මම මූලික අධ්‍යාපනය ලැබුවේ බෙලිඅත්ත නගරයේ වූ පඤ්ඤානන්ද බෞද්ධ විදුහලෙන්. අපේ ගමේ පුරාණ විහාරස්ථානය විවිධ භාෂා ශාස්ත්‍ර දන්නා නැණ නුවණින් පිරි ගිහි පැවිදි උගතුන් ගැවසුණු ස්ථානයක්. මම ඒ වියතුන්ගෙන් බොහෝ දේ ඉගෙන ගත්තා. |
| නිවේදක | : | එයින් පස්සෙ |

මානවසිංහ : මම එහි දී සංස්කෘත, පාලි, සිංහල හැදෑරුවා. සැබැවින් ම ගිහි හා පැවිදි සමාජයේ කීර්තිමත් හිමි නමක් වූ පුවක්දණ්ඩාවේ සාරානන්ද හිමියන්ගෙන් තමයි මම බොහෝ ශිල්ප ශාස්ත්‍ර ප්‍රගුණ කළේ.

නිවේදක : ඔබතුමා පුවත්පත් කලාවට, ලේඛනයට නැඹුරු වූ ආකාරය පැහැදිලි කළොත්

මානවසිංහ : ඇත්ත වශයෙන් ම සිංහල ජාතියට, සිංහල භාෂාවට හා බුද්ධාගම විෂයයන්ට මා තුළ ඇත්තේ දැඩි භක්තියක්, ආදරයක්.

නිවේදක : ඔබතුමා ලංකාදීප කර්තෘ මණ්ඩලයට බැඳුණු බව ශ්‍රාවකයෝ දන්නවා

මානවසිංහ : සැබැවින් ම මගේ නිර්මාණ හැකියාව රටට ප්‍රකාශ වුණේ ඒ අවධියේ තමයි.

නිවේදක : ඔබ ප්‍රතිභාපූර්ණ නිර්මාණශීලී කලාකරුවෙක්. ඔබතුමන් නිර්මාණය කළ ගීත නාටක  අපූරු රසයක් ලබා දුන්නා.

මානවසිංහ : ඔව්. ඒ වගේ ම මම ලංකාදීප පුවත්පතට විචාරලිපි ලිව්වා.

නිවේදක : 'චන්ද්‍රගුප්ත'' නමින් ඔබතුමා විචාර ලිපි ලියූ බව ප්‍රකට යි.

මානවසිංහ : ඔබ නිවැරදි යි.

නිවේදක : ගැමි පරිසරයේ හැදී - වැඩී, ගැමි සංස්කෘතියෙන්, උදාරගති පැවතුම්වලින් පෝෂණය වූ කෙනෙක්. ඒ සිතුම් - පැතුම් කවියට නැගූ කෙනෙක්.

මානවසිංහ : ඔව්, මගේ නිර්මාණ ලෙස ''සිනා රැල්ල'' කැටිවුණු මිහිර'' ''රස පෙම් මදිරා'' යන කාව්‍ය නම් කළ හැකි යි.

නිවේදක : අපි දැන් ඔබතුමාගේ නිර්මාණ දෙසට යොමු වෙමු. ඔබ නිර්මාණය කළ ''සිනා රැල්ල'' පද්‍ය පන්තිය සුලලිත, සුකොමළ, නව ආරක වදන් වැලක ස්වරූපය හෙළි පෙහෙළි කරනවා.
අපි එයට සවන් දෙමු
(පසු බිමින්)
සිලිලාරෙක හෙල් මැලී
පෙති අතරින් සැලි සැලී .....................

නිවේදක : ඔබතුමා ලියූ ''නැගෙනහිර රුහුණේ දී'' යන පද්‍ය පන්තියෙන් උපුටාගත් පද්‍යයක් මා දැන් කියනවා.
සිංහලෙයිනි යමු පෙරට ම යමු පෙරට ම යම්
යන හඬ ජය සක් රණ බෙර ගොස හා පටලම්
ගැමුණු සෙනඟ පතුල් තැබූ හඬ කළ පිළිරැව්
ඇඹරී යයි සුළඟ පහර වන හිස කැළඹෙව්

මේ කවිවලින් ඔබ ජාතියට ජීවයක් ලබා දෙනවා කියා මා සිතනවා.

මානවසිංහ : බොහොම ස්තුතියි.

නිවේදක : ඔබතුමා ළමාවියේ සිතුම්-පැතුම් ගැන, ළමා ලෝකයේ විසිතුරු බව ගැන කියා පාන පැදි නිර්මාණය කර තිබෙනවා.

මානවසිංහ : ඔව්. ''අකුරට යනවයි කියලා'' යන ගීතය එවැනි එකක්.

නිවේදක : අපි ඒ ගීතයට සවන් දෙමු.
අකුරට යනවයි කියලා
ටිකිරි අයිය බැදිවලමයි ...........................

නිවේදක : මේ සාකච්ඡාවේ දී ඔබතුමන් පිළිබඳ ව අපේ ශ්‍රාවකයන්ට බොහෝ කරුණු දැන ගන්නට පුළුවන් වුණා කියලා මම හිතනවා. ඔබතුමන්ගේ නිර්මාණයක් වූ ''වෙසක් මිහිර'' ඉතා ම රසවත්, ශ්‍රාවකයා ඉතා ම රුචිකත්වයක් දක්වන පැදි පෙළක්. අපි එහි කොටසක් ශ්‍රවණය කරමු.
(පසුබිමින්)
මොනව ද අම්මේ අකුරු ජාතියක්
මල්පෙතිවල කවුදෝ ලියලා ...........

මානවසිංහ : මමත් එය ශ්‍රවණය කිරීමෙන්
ලොකු සතුටක් ලැබුවා.

නිවේදක : ''මහ බෝ වන්නම'' ඔබතුමා රචනා කළ පද්‍යයක්. එය ගීත මාධුර්යයෙන් යුතු ව අමරදේවයන් ගායනා කරනවා.

මානවසිංහ : ඔව්. අමරදේවයන් ඒ පද්‍යයට අපූරු සුන්දරත්වයක් එක් කළා.

නිවේදක : සිංහල චිත්‍රපට රාශියකටත් ඔබතුමා රචනා කළ ගීත ඇතුළත් වුණා නේද?

මානවසිංහ : ඔබ නිවැරදියි.

නිවේදක : මම හිතනවා ඔබතුමන් හා ඔබතුමාගේ නිර්මාණ පිළිබඳ ව අපේ ශ්‍රාවකයන් බොහෝ කරුණු දැන ගත්තා කියා. සොඳුරු මිනිසෙකු වූ ඔබ මේ ආ ගමනේ දී අපේ ශ්‍රාවක ජනයාට දෙන පණිවිඩය කුමක් ද?

මානවසිංහ : මිනිසා තුළ පුදුම හැකියාවක් සැඟවී තිබෙනවා. ඒවා මතුකරගත යුතු යි. සමාජයට දායාද කළ යුතු යි. කලාකරුවෙක් හැටිය මා තෘප්තිමත්.

නිවේදක : බොහොම ස්තුතියි! අපි ඔබ තුමන්ට සුබ පතනවා, ආයුබෝවන්!

මානවසිංහ : ඔබටත් ''උදාගිර'' වැඩ සටහන සංවිධායක මණ්ඩලයටත් බොහෝම ස්තුතියි! ආයුබෝවන්!

# 20
## විෂය සමගාමී ක්‍රියාකාරම් (සාකච්ඡාවකට සවන්දීම)

**නිපුණතාව** : 07 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායී ලෙස යොදා ගනී.

**නිපුණතා මට්ටම** : 7.2 දේශන, සාකච්ඡා ආදියට සවන්දීමේ පුරුද්ද මගින් විචාරශීලී ව භාෂාව හසුරුවයි.

කාලච්ඡේද : 04යි.

**ඉගෙනුම් පල :**

- දේශන හා සාකච්ඡාවලට සවන් දී අදහස් ප්‍රකාශ කරයි.
- දේශන හා සාකච්ඡාවලට සවන් දී වැදගත් කරුණු ගොනු කර ගනියි.
- දේශන හා සාකච්ඡාවලට සවන් දී විචාරශීලී ව අදහස් ප්‍රකාශ කරයි.
- දේශන හා සාකච්ඡාවලට සවන් දීමේ වැදගත්කම පැහැදිලි කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- සාකච්ඡාවක හඬ පටයක් සූදානම් කර ගන්න.
- ශිෂ්‍යයන් දෙදෙනකු සාකච්ඡාවක නිරත වන අවස්ථාවක් යොදා ගන්න.

**ප්‍රවේශය**

- සිසුන් දෙදෙනකු සාකච්ඡාවක යෙදී සිටින විට එය ම ප්‍රවේශයට යොදා ගන්න.

**පාඩම සංවර්ධනය**

පියවර 1

- සාකච්ඡාවක් යනු කුමක් ද'යි සිසුන්ගෙන් විමසන්න.
- සාකච්ඡාවල වැදගත්කම පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක නිරත වන්න.
- සාකච්ඡාවලට සවන්දීමේ දී අවධානයෙන් හා අවබෝධයෙන් සවන්දිය යුතු බව පැහැදිලි කරන්න.

පියවර 2

- සාකච්ඡාවලට සවන්දීමේ දී එහි වැදගත් කරුණු සටහන් කර ගන්නා ලෙස උපදෙස් දෙන්න.

පියවර 3

- ඇමුණුම අංක 01හි සඳහන් සාකච්ඡාව ශිෂ්‍යයන් දෙදෙනකු යොදා ගනිමින් ඉදිරිපත් කරවන්න. (මෙය භූමිකා රංගනයක් මගින් ද ඉදිරිපත් කළ හැකි ය.)

පියවර 4

- ඇමුණුමේ ඇති දෙබස් කොටස ශිෂ්‍යයන් ලවා ඉදිරිපත් කරවන්න.

පියවර 5

- සාකච්ඡාවට අවධානයෙන් සවන් දුන්නේ ද'යි මැන බැලීම සඳහා ශිෂ්‍යයන්ගෙන් ප්‍රශ්න කීපයක් අසන්න.
- සාකච්ඡාවේ අන්තර්ගතය කුමක් ශයි ශිෂ්‍යයන්ගෙන් විමසන්න.
- සවන් දුන් සාකච්ඡාවෙන් ශිෂ්‍යයන්ට ලබා ගත හැකි ආදර්ශ මොනවා ද'යි ශිෂ්‍යයන්ගෙන් විමසමින් සාකච්ඡා කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සාකච්ඡාවක හඬ පටයක් යොදා ගැනීම

**මූලික වදන් සංකල්ප**

දුරවබෝධ වචන

| | | |
|---|---|---|
| ප්‍රස්තාව | - | ඉම |
| ඇස්කීසිය | - | ගෙවීම් පැහැර හැරීම හේතුකොට ගෙන ණයකරුගේ දේපාළ හෝ ශරීරය අල්ලා ගැනීම. |
| බීරුසන් | - | භයානක |
| එළිපත්ත | - | ගෙයකට ඇතුළුවන හෝ ඉන් පිටවන හෝ තැන බිම සවිකළ උළුවහු පඩිය |
| ප්‍රතිරාවය | - | රැව් පිළිරැව් |
| කුලප්පුවීම | - | කලබල වීම, ඇවිස්සීම |
| රත් යවටක් | - | රත් වූ ගිනියම් වූ ලෝහ ගුලිය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- දේශන හා සාකච්ඡාවලට සවන් දෙමින් වැදගත් කරුණු රැස්කර ගැනීම
- දේශන හා සාකච්ඡාවලට සවන් දී විචාරශීලී ව අදහස් ඉදිරිපත් කිරීම
- දේශන හා සාකච්ඡාවල අන්තර්ගතය පැහැදිලි කිරීම
- දේශන හා සාකච්ඡාවලට සවන් දීමේ වැදගත්කම විස්තර කිරීම

ඇමුණුම 1

## අප්පුසිඤ්ඤෝ ධර්මපාලතුමා හමුවීමට යාම

නිති පන්සිල් රැකි ධර්මපාලතුමා තමා හමුවෙන්නට පැමිණි කවරෙකුගෙන් වුව ද අසන මුල්ම ප්‍රශ්නය නම්

''උඹ පන්සිල් ගන්නවා ද'' යන්න යි. නිති පුවත්පත් කියවූ එතුමා තමා දැක ගන්නට එන කවරෙකුගෙන් වුව ද පළමු කොට අසන්නේ ''ඔබ සිංහල බෞද්ධයා කියනවා ද'' යන්නයි.

එක මොහොතක් ''නිකම්''නොසිටි එතුමාගෙන් උදව්වක් පතාගෙන ආ මොන යම් කෙනෙකුගෙන් වුව ද පළමු කොට ම ඇසුවේ

''උඹ කරන රක්ෂාව කුමක් ද? යනුයි. දුප්පත්කම කියාගෙන නැති බැරි අඳෝනාව නගාගෙන තමන් හමුවට එන කවරෙකුගෙන් වුව ද එතුමා ඇසුවේ ''උඹ කසාද බැඳල ද? උඹට ළමයි කී දෙනා ද? යනු යි. නිසි රැකියාවක් නැතුව කාලකණ්ණිකමට පවුල් කෑම පමණක් කළ අවාසනාවන්තයින්ගේ මෝඩකම් බලා එතුමා කීවේ ''හිඟන්නන් බෝ කිරීමේ'' ආදීනවයි.

කලක් තමන්ගේ සේවකයෙකුව සිට පසු කාලයේ එතුමාගෙන් සමුගෙන ගමරට බලාගොස් පරස්තාවක් කරගත් නමුත් පරස්තාවෙන් පසු රස්සාව නැති කරගත් ''අප්පුසිඤ්ඤෝහට උදාවූයේ උන්හිටි ඉඩම ණයට පොලියට සින්න වී මහ මගට බසින අවදානමකි. අවාසනාවකි. ගමේ මුදලාලිගෙන් ණයට ගත් රුපියල් දෙසීය හාරසීයක් වූයෙන් සති කීපයක් තුළ ඔහු ගෙයින් එළියට ඇද දැමීමේ ඇස්කීසිය රැගෙන මුදලාලි එළිපත්ත මත අඩිය තබා බීරුසන් දෙන සැටි දූන් ඔහුට හීනෙන් පෙනේ.

''ඔහේ ඉතින් උඩ බලා ඉන්නේ නැතුව ගිහිල්ලා ධර්මපාල හාමුදුරුවන්ටවත් කියනවා ඔහේගෙ දුක''

යනුවෙන් අප්පුසිඤ්ඤෝගේ බිරින්දෑ වරක් යෝජනා කළා ය.

මෙබසින් උත්සාහවන්ත වූ මිනිසා දිනක් ධර්මපාලතුමා බැහැ දකින්නට පැමිණියේ සිරිත් පරිදි බුලත් අතකුත් රැගෙන ය. එය සිය පැරණි ස්වාමියාට පිළිගැන් වූ අප්පු සිඤ්ඤෝ තමාගේ අමාරුව කියා රුපියල් හාරසීයේ විත්තිය ද මතක් කොට බැගෑපත් ස්වරයෙන් පිහිට ඉල්ලා සිටියේය.

''රුපියල් හාරසීයක්'' යනුවෙන් ප්‍රතිරාවය කළ ධර්මපාලතුමා

''හොඳයි උඹ අටසිල් ගන්නවා ද?

''නැහැ !

''පන්සිල් ?

''නැහැ !

''පෝයදාට උඹ පන්සල් යනව ද?''

''කොයින්ද හාමුදුරුවනේ ඕවට වෙලාවක් ?

''උඹ මල් පූජා කරන ගාථාව දන්නවා ද?

ඉස්සර නම් මතක තිබුණා. වයසට යනකොට ඕව මතක නැති වෙනවනේ හාමුදුරුවනේ !

''මොකක් ද උඹට මතක නැති නොවෙන එක. ඇත්ත කියපන් මට !

යයි නියම කළ ධර්මපාලතුමා මොහොතක් කල්පනා කර තවත් ප්‍රශ්නයක් ඇසුවේ ය. එය පුද්ගලික ප්‍රශ්නයකි.

''හොඳයි උඹට දරුවෝ කී දෙනෙක් ද?

''දාහතරයි හාමුදුරුවනේ !

අප්පු සිඤ්ඤෝගේ මේ පිළිතුරෙන් හාම් පුතාණෝ කුලප්පු වූහ. දෙනෙත් රත් යවටක් ලෙසින් දිලිහුණේ ය.

වල් අලියා! ගොන්තඩියා! අටසිල් ගන්නත් එපා පන්සිල් ගන්නත් එපා. රෑට නිදාගන්න කොට ගාථාවක් කියන්නත් එපා ................

කාලකන්නියා පල මගේ දැහැට නොපෙනී! යනුවෙන් ධර්මපාලතුමා පුපුරා හැළෙන ගිනි කන්දක් මෙන් ගුගුරන්නටත් පුපුරන්නටත් පටන් ගත්හ.

දුප්පතා හෙමින් හෙමින් යයි. ධර්මපාලතුමා නැවතත් කථා කළේ ය.

ආ ඉඳා මේ රුපියල් පන්සීය හාරසීයකින් ණය ගෙවා ඉතිරි රුපියල් සීයෙන් පටන් ගනින් වෙළඳාමක්. ඒක කළා ඇති. දැන් ඉතින් මේක කර මනුස්සයෙක් වෙන්න බලපන් !"

# 21
## විෂය සමගාමී ක්‍රියාකාරකම්

**නිපුණතාව** : 07 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායී ලෙස යොදා ගනී.

**නිපුණතා මට්ටම** : 7.3 විවිධ ප්‍රවෘත්ති හා විස්තර ප්‍රකාශවලට සවන් දී වැදගත් කරුණු ඉදිරිපත් කරයි.

කාලච්ඡේද : 04යි.

**ඉගෙනුම් පල :**

- විවිධ ප්‍රවෘත්ති ප්‍රකාශ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ප්‍රවෘත්ති ප්‍රකාශයකට සාවධාන ව සවන් දී ප්‍රතිචාර දක්වයි.
- ප්‍රවෘත්ති ප්‍රාකාශයක ඇතුළත් වැදගත් තොරතුරු මතකයෙන් ප්‍රකාශ කරයි.
- අසන ලද ප්‍රවෘත්තියේ මූලික අදහස පැහැදිලි කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම**

- ප්‍රවෘත්ති ප්‍රකාශයක හඬ පටයක් සූදානම් කර ගන්න.
- ශිෂ්‍යයන් දෙදෙනකු සාකච්ඡාවක නිරතවන අවස්ථාවක් යොදා ගන්න.

**ප්‍රවේශය**

- ක්‍රීඩා හෝ කාලගුණය පිළිබඳ ප්‍රවෘත්තියක් කියමින් පාඩම සඳහා ප්‍රවේශ වන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර 1**

- ප්‍රවෘත්ති යනු මොනවා ද’යි ශිෂ්‍යයන්ගෙන් විමසන්න.
- ප්‍රවෘත්ති වර්ග පිළිබඳ සාකච්ඡා කරන්න.

**පියවර 2**

- ප්‍රවෘත්තිවල ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

**පියවර 3**

- බොහෝ ප්‍රවෘත්ති එක් දිනක පමණක් ප්‍රකාශ කරන හෙයින් නිසිලෙස ග්‍රහණය කර ගත යුතු බව අවධාරණය කරන්න.
- ප්‍රවෘත්තිවලට සවන් දීමේ දී විශේෂ අවධානයෙන් යුතු ව සවන්දිය යුතු බව පැහැදිලි කරන්න.

**පියවර 4**

- ඇමුණුම අංක 01හි ඇති ප්‍රවෘත්තිය සියලු ම ශිෂ්‍යයන්ට ඇසෙන සේ කියවන්න.
- ප්‍රවෘත්ති ඉදිරිපත් කරන ආකාරයෙන් ඇමුණුමේ ඇති ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයින්ට අවස්ථාව ලබා දෙන්න.
- ප්‍රවෘත්තියේ ඇතුළත් තොරතුරු ආශ්‍රයෙන් ශිෂ්‍යයන්ගෙන් ප්‍රශ්න අසා පිළිතුරු ලබා ගන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ගුවන් විදුලියෙන් හෝ රූපවාහිනියෙන් විකාශය වූ ප්‍රවෘත්තියක හඬ පටයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- විවිධ ප්‍රවෘත්ති ප්‍රකාශ හඳුනා ගෙන ඉදිරිපත් කිරීම
- ප්‍රවෘත්තිවලට සවන් දී වැදගත් තොරතුරු ප්‍රකාශ කිරීම
- ප්‍රවෘත්තියක මුඛ්‍යාර්ථය පැහැදිලි කිරීම
- ප්‍රවෘත්තියක් ප්‍රකාශ කිරීමේ අභ්‍යාස

ඇමුණුම

## ප්‍රවෘත්ති

ගාල්ල ඇල්පිටිය ආනන්ද මහා විද්‍යාලයේ වාර්ෂික ව පැවැත්වෙන ත්‍යාග ප්‍රදානෝත්සවය විද්‍යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත් විණි. විවිධ දක්ෂතා දැක් වූ ශිෂ්‍ය-ශිෂ්‍යාවෝ මෙහි දී ඇගයීමට ලක් කෙරුණහ. අලංකාර නර්තනාංගයන්ගෙන් හා ගායනාංගවලින් උලෙළ වර්ණවත් වුණා. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, ප්‍රදේශයේ පාසල්වල විදුහල්පතිවරුන්, ආචාර්ය මණ්ඩල ඇතුළු විශාල පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියා.

අම්බලන්ගොඩ සියබස් විද්‍යාලයේ 2016 - 17 වර්ෂයන්හි ත්‍යාග ප්‍රදානෝත්සවය හා සම්මාන උලෙළ විද්‍යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත්විණ. විෂය හා විෂය සමගාමී අංශයන්ගෙන් දක්ෂතා දැක් වූ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් (147) දෙනෙකුට මෙහි දී ත්‍යාග හා සම්මාන පිරිනැමුණා. විද්‍යාලයේ නර්තන හා සංගීත අංශයේ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් ඉදිරිපත් කළ ගීත හා නර්තනාංගයන්ගෙන් උලෙළ වර්ණවත් කෙරුණා. උලෙළ පැවැත්වුණේ පොලිස් අධිකාරි සිසිල ප්‍රේමරත්න මහතාගේ ප්‍රධානත්වයෙනි. විදුහල්පති ජගත් සේනාරත්න මහතාගේ අධීක්ෂණයෙන් ආචාර්ය මණ්ඩලය විසින් මෙය සංවිධානය කෙරිණ.

මාවනැල්ල වැගන්තලේ මහා විද්‍යාලයට වසර 08ක් පිරීම නිමිත්තෙන් පරිත්‍රාණ ධර්ම දේශනයක් සහ සංඝගත දක්ෂිණාවක් පවත්වනු ලැබුවා. ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආගමික ලැදියාව වර්ධනය කිරීමේ අරමුණින් මෙය සංවිධානය කර තිබුණේ විද්‍යාලය ආරම්භ කිරීමට ඉඩමක් පරිත්‍යාග කළ ජී. බී. රත්නායක මහතාට සහ ආරම්භයේ සිට පාසලට සේවය කරන විදුහල්පතිවරුන්ට ආචාර්යවරුන්ට පින් අනුමෝදන් කිරීම සඳහා යි. විදුහල්පති එල්. කේ. හෙට්ටිආරච්චි මහතාගේ මෙහෙයවීමෙන් මෙම වැඩ සටහන සංවිධානය කර තිබුණා.

මීළඟට විදෙස් පුවත් බලාපොරොත්තු වන්න.

නාසා ආයතනයේ ඉන්ෆ්ලයිට් යානය අඟහරු ග්‍රහයා වෙත ගොඩ බස්වනු ලැබුවා. එහි ප්‍රථම ඡායාරූපය ද පෘථිවිය වෙතට ලැබී තිබෙනවා. ඉන්ෆ්ලයිට් අභ්‍යවකාශ රොබෝයානය අඟහරු දක්වා සැතපුම් මිලියන තුන්සියක දුරක් ගමන් කිරීමට මාස හයක කාලයක් ගත කළා. අඟහරු මෙහෙයුම් බොහෝ සෙයින් අසාර්ථක වීමට හේතුවන අවසාන විනාඩි හත පිළිබඳ ව විද්‍යාඥයින්ගේ දැඩි උනන්දුවක් පැවතුණා. මීට පෙර යානා කීපයක් ම එම කාලය තුළ දී අසාර්ථක වී ඇත.

මෙවර මෙහෙයුම සාර්ථක වූ අතර ගොඩ බැසීමෙන් අමතර ව ඉතාමත් ඉක්මනින් පෘථිවියට ඡායා රූපයක් එවීමට ද සමත් වුණා. මෙම යානය රාත්තල් 880ක් පමණ බරකින් යුක්ත යි. රොබෝ මගින් ග්‍රහයාගේ අභ්‍යන්තරය පිළිබඳ ප්‍රධාන වශයෙන් පරීක්ෂණ පැවැත්වෙනවා. එහි දී අඟහරු ග්‍රහයාගේ බාහිර හා අභ්‍යන්තර උෂ්ණත්වය පිළිබඳ සැලකිල්ලක් දක්වනු ඇත.

**ක්‍රීඩා පුවත්**

මුලටියන අධ්‍යාපන කලාපය විසින් සංවිධානය කරන ක්‍රීඩා උලෙළ තිහගොඩ යටියන ක්‍රීඩාංගනයේ දී පැවැත්වුණා. ශිෂ්‍ය ශිෂ්‍යාවන් ක්‍රීඩාවට යොමු කිරීම, ඔවුන් තුළ ඇති ක්‍රීඩා කුසලතාවන් හඳුනා ගැනීම තුළින් ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහි කිරීම මෙහි අරමුණ යි. මේ සඳහා මුලටියන කලාපයේ පාසල් අනූ තුනක ශිෂ්‍ය ශිෂ්‍යාවන් එක් දහස් පන්සියයක් පමණ සහභාගි වුණා. ජයග්‍රාහකයින්ට ත්‍යාග ප්‍රදානය ද මීට සමගාමී ව කෙරුණා. මුලටියන අධ්‍යාපන කලාපයේ ප්‍රාථමික අංශභාර අධ්‍යක්ෂ එම්. ජයමාන මහත්මිය, කඹුරුපිටිය උපාලි විජයවර්ධන විද්‍යාලයේ ආචාර්ය ජනක සංජීව මහතා ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට එක් වී සිටියා.

# 22
## විෂය සමගාමී ක්‍රියාකාරකම් (උත්සව අවස්ථාවක කතාවක්)

**නිපුණතාව** : 08 තම අදහස් අර්ථවත් ව හා තර්කානුකූල ව ඉදිරිපත් කිරීමට අවශ්‍ය ශක්‍යතාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** : 8.1 කරුණු සංවිධානය කර ගනිමින් නිවැරදි ව බස හසුරුවමින් කථනයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 04යි.

**ඉගෙනුම් පල :**

- සබකෝලයෙන් තොර ව කතා කරයි.
- කරුණු සංවිධානය කරමින්, අන්‍යයන්ගේ අවධානය දිනා ගනිමින් කතා කරයි.
- නිරවුල් ව හා නිවැරදි ව අදහස් ඉදිරිපත් කරයි.
- මාතෘකාවට අදාළ ව සංයමයෙන් කතා කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය**

- **'උත්සව අවස්ථාවක කෙරෙන පිළිගැනීමේ කතාවක්' ඉදිරිපත් කරමින් පාඩම සඳහා ප්‍රවේශ වන්න.**

**පාඩම සංවර්ධනය**

**පියවර 1**

- මෙම කතාව කුමක් ද'යි විමසමින් සිසුන් සමග සාකච්ඡාවක නිරත වන්න.
- පිරිවෙනේ විවිධ උත්සව අවස්ථාවල දී සිදු කෙරෙන කතා පිළිබඳ ව ශිෂ්‍යයන්ගෙන් විමසන්න.

**පියවර 2**

- විවිධ උත්සව අවස්ථාවල සිදු කෙරෙන කතාවල දී එහි ගුණාත්මක බව රැක ගැනීම සඳහා ඇතුළත් විය යුතු ගුණාංග පිළිබඳ පහත සඳහන් කරුණු ඔස්සේ සාකච්ඡා කරන්න.
  - නිවැරදි ව භාෂාව භාවිත කිරීම
  - සිදු කරනු ලබන කතාව පැහැදිලි වීම
  - අර්ථවත් ව හඬ පාලනයෙන් යුතු ව කතා කිරීම
  - සංයමයෙන් කතා කිරීම

**පියවර 3**

- අන්තර්ගතය පිළිබඳ අවබෝධයෙන් යුතු ව අවස්ථෝචිත ව කතා කිරීම.
  - උත්සවයක දී
  - ආගමික කටයුත්තක දී
  - ක්‍රීඩා තරගයක දී
  - කනගාටුදායක අවස්ථාවක දී
- ඉහත සඳහන් අවස්ථා අනුව සිය කතාවේ ස්වරූපය ද වෙනස් විය යුතු බව පැහැදිලි කරන්න.

**පියවර 4**

- ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඉහත දක්වා ඇති අවස්ථාවලින් එකක් එක් කණ්ඩායමට තෝරා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 5

- තෝරාගත් මාතෘකාවට අදාළ ව තොරතුරු රැස් කරගෙන කතා කිරීමට සූදානම් වන ලෙස ශිෂ්‍යයන්ට උපදෙස් ලබා දෙන්න.
- එක්රැස්කරගත් කරුණු ආශ්‍රයෙන් කෙටි කතාවක් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- සෑම ශිෂ්‍යයකුට ම කතා කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- විවිධ අවස්ථාවල කෙරෙන කතා කිහිපයක් ඇතුළත් හඬ පටයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- විවිධ උත්සව අවස්ථාවල කෙරෙන කතා හඳුනා ගෙන ඉදිරිපත් කිරීම
- මාතෘකාවට අදාළ ව සංයමයෙන් කතා කිරීම
- කරුණු සංවිධානය කර ගනිමින් නිවැරදි ව අදහස් ඉදිරිපත් කිරීම
- හඬ පාලනයෙන් යුතු ව අන්‍යයන්ගේ ආකර්ෂණය දිනා ගනිමින් භාෂාව හැසිරවීම

# 23

## සාහිත්‍ය රසාස්වාදය

**නිපුණතාව** : 09 සාහිත්‍ය රසාස්වාදයට හා විචාරයට අදාළ මූලික ඉගැන්වීම් අවබෝධයෙන් යුතු ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : **9.1** රසාස්වාදයේ මූලධර්ම හඳුනා ගනිමින් ගද්‍ය හා පද්‍ය රසාස්වාදයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 09යි.

**ඉගෙනුම් පල :**

- සාහිත්‍ය රසාස්වාදයේ මූලධර්ම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රසාස්වාදයේ යෙදෙයි.
- ගද්‍ය හා පද්‍ය නිර්මාණවලට සවන් දී විචාර මූලධර්මවලට අනුව රසාස්වාදයේ යෙදෙයි.
- විවිධ මාතෘකා යටතේ සරල ගද්‍ය හා පද්‍ය නිර්මාණය කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- පෙළ පොතේ 14 වැනි පාඩමේ ඇතුළත් බුත්සරණේ අදාළ කොටස කියවා අර්ථ පැහැදිලි කරමින් රසාස්වාදයේ යෙදීමට සූදානම් වන්න.

**ප්‍රවේශය**

- බුත්සරණේ අදාළ ඡේදය රසවත් ලෙස කියවමින් පාඩම සඳහා ප්‍රවේශ වන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර 1**

- නිර්දිෂ්ට ගද්‍ය පාඨ සියලු ම ශිෂ්‍යයන්ට ඇසෙන සේ කියවන්න.
- පෙළ පොතේ ඇති ගද්‍ය පාඨ ශිෂ්‍යයන්ට කියවීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ඡේදය රස ජනනය වන අයුරින් නිර්මාණය කර ඇති ආකාරයත් දෙවන ඡේදය වාර්තාමය ස්වරූපයෙන් ඉදිරිපත් කර ඇති ආකාරයත් ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.

**පියවර 2**

- නිර්දිෂ්ට නිර්මාණවල නිර්මාණකරුවාගේ අරමුණ හා ඒ සඳහා භාවිත කළ උපක්‍රම පිළිබඳ ව පැහැදිලි කරන්න.
- සාහිත්‍ය ප්‍රභේද හඳුන්වා දෙන්න.
  (ගද්‍ය, පද්‍ය සහ චම්පු කාව්‍ය පිළිබඳ ව)

**පියවර 3**

- පද්‍ය නිර්මාණ රස වින්දනයේ දී උපමා, රූපක හා දීපක ආදි අලංකාර පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න. ඒවා වෙන් වෙන් ව හඳුන්වා දෙන්න.
- නිර්දිෂ්ට පද්‍ය කොටස් ගායනා කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- නිර්දිෂ්ට පද්‍යවල ඇති අලංකාර ඉස්මතු කර දක්වන්න.
- ක්‍රියාකාරකම් සඳහා ලබා දී ඇති පද්‍ය නිර්මාණ රස විඳීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.

පියවර 4

- ගද්‍ය හා පද්‍ය නිර්මාණකරණය සඳහා සුදුසු මාතෘකා ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න. (අම්මා, වනයක අසිරිය, සුන්දර ශ්‍රී ලංකා, මගේ රට, සිංහල අලුත් අවුරුද්ද)
- ගද්‍ය හා පද්‍ය නිර්මාණකරණය සඳහා ශිෂ්‍යයන්ට උචිත මාතෘකා ලබා දෙන්න.
- තෝරාගත් මාතෘකා යටතේ නිර්මාණකරණයේ යොදවන්න.

**මූලික වදන් හා සංකල්ප :**

**සාහිත්‍ය ප්‍රභේද තුනකි.**

- ගද්‍ය කාව්‍යය
- පද්‍ය කාව්‍යය
- චම්පු කාව්‍යය (ගද්‍ය හා පද්‍ය මිශ්‍ර කාව්‍ය විශේෂයකි.)

**සාහිත්‍ය අලංකාර**

- උපමා
- රූපක
- දීපක

**ගුණාත්මක යෙදවුම්**

- **පෙළ පොතේ 14 වැනි පාඩම**
- උපමා, රූපක සහ දීපක පැහැදිලි කිරීම සඳහා යොදා ගත හැකි උදාහරණ කීපයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- සාහිත්‍ය රසාස්වාදයේ මූලධර්ම හඳුනා ගෙන ඉදිරිපත් කිරීම
- සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රසාස්වාදයේ යෙදීම
- විචාර මූලධර්මවලට අනුගත ව ගද්‍ය පද්‍ය සහ නිර්මාණ රසාස්වාදයේ යෙදීම
- ගද්‍ය පද්‍ය නිර්මාණ සඳහා සුදුසු මාතෘකා ඉදිරිපත් කිරීම
- ගද්‍ය පද නිර්මාණයේ යෙදීම

පරිශීලනීය ග්‍රන්ථ

- සාහිත්‍ය විද්‍යාව - එදිරිවීර සරච්චන්ද්‍ර
- කල්පනා ලෝකය - - එදිරිවීර සරච්චන්ද්‍ර

# 24

## වනකතා (නිර්දිෂ්ට කෘති)

**නිපුණතාව** : 10 භාෂා සාහිත්‍ය පරිශීලනයෙන් සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගෙන ජාතිකාභිමානය, දේශමාමකත්වය හා සහජීවනය ගොඩනගා ගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම** : 10.1 සංස්කෘතික හරපද්ධතීන් අගය කරමින් කියවයි.

**කාලච්ඡේද** : 12යි.

**ඉගෙනුම් පල :**

- නිර්දිෂ්ට සාහිත්‍ය කෘති කියවා සංස්කෘතික වටිනාකම් පැහැදිලි කරයි.
- වනකතා කෘතිය කියවා රස විඳියි.
- උසස් නිර්මාණ පරිශීලනයෙන් ගත හැකි ජීවිතාදර්ශ පැහැදිලි කරයි.
- සංස්කෘතික හරපද්ධතීන් ඇගයීමට ලක් කරමින් ඒවා චරිතායනය කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- වනකතා පොත හොඳින් කියවා ගන්න.
- සිසුන්ගේ අවබෝධය මැන බැලිය හැකි ප්‍රශ්න සකස් කර ගන්න.
- සියලු ම සිසුන්ට වන කතා පොත් තිබේදැ'යි සොයා බලන්න.

**ප්‍රවේශය**

- වනකතා පොතේ කතාවක කොටසක් මතකයෙන් කියමින් පාඩමට ප්‍රවේශ වන්න.

**පාඩම සංවර්ධනය**

**පියවර 1**

- මෙම කතාව කුමක් දැ'යි විමසමින් සාකච්ඡාවක නිරත වන්න.
- වනකතා පොතේ මුල් කතාවේ කොටසක් ගුරුවරයා සියලු ම ශිෂ්‍යයන්ට ඇසෙන සේ කියවන්න.

**පියවර 2**

- ඡේද වශයෙන් සියලු ම ශිෂ්‍යයන්ට එම කතාව කියවීමට උපදෙස් දෙන්න.
- වනකතා සඳහා සත්ත්ව චරිත යොදා ගත්ත ද ඉන් දෙන පණිවිඩය මානව සමාජයට අදාළ බව පැහැදිලි කරන්න.

**පියවර 3**

- වනකතා පොතේ කතා සිසුන් සමග කියවන්න.
- නිවැරදි උච්චාරණ විධීන්ට අනුව කියවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- කියවන කතාව ඇසුරු කරගෙන සිසුන්ගේ අවබෝධය මනින්න.

**පියවර 4**

- කතාවක් නිශ්ශබ්ද ව හා ශබ්ද නගා කියවිය යුත්තේ ඇයි දැ'යි පෙන්වා දෙන්න.

**පියවර 5**

- ඒ ඒ සිසුන්ගේ කියවීමේ මට්ටම් අනුව කියවීමේ හැකියාව මැන ගන්න.
- ප්‍රශ්න ඇසීම හා පිළිතුරු දීම කණ්ඩායම් ක්‍රමයට පිළියෙල කරගන්න.
- කතාවල සරල අර්ථ පැහැදිලි කරන්න.

**පියවර 6**

- වනකතාවල එන සත්ත්ව චරිත උපයෝගී කරගෙන කතු හිමියන් සමාජය තුළ ඇති දුර්ගුණ උපහාසයට ලක්කර ඇති අයුරු පෙන්වා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- එක් එක් කතා පුවතට අදාළ ව සකස්කර ගත් ප්‍රශ්නාවලියක්
- වනකතා - යක්කඩුවේ ප්‍රඥාරාම හිමි

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- නිර්දිෂ්ට වන කතා කෘතියේ ඇති සංස්කෘතික වටිනාකම් පැහැදිලි කිරීම
- වන කතා කෘතිය කියවා රස විඳීම
- සංස්කෘතික හරපද්ධතීන් ඇගයීමට ලක් කරමින් චරිත සංවර්ධනය සඳහා යොදා ගත හැකි ආකාරය විස්තර කිරීම
- වනකතා කෘතියෙන් ගත හැකි ජීවිතාදර්ශ පැහැදිලි කිරීම
- උසස් නිර්මාණ ඇසුරු කළයුතු බව පිළිගනිමින් පැහැදිලි කිරීම

# 25
## විෂය සමගාමී ක්‍රියාකාරකම් (දේශාභිමානි ගී)

**නිපුණතාව** : 10 භාෂා සාහිත්‍ය පරිශීලනයෙන් සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගෙන ජාතිකාභිමානය, දේශමාමකත්වය හා සහජීවනය ගොඩනගා ගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම** : **10.2** දේශාභිමානී හැඟීම් දනවන නිර්මාණ පරිශීලනය කරයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- දේශාභිමානී හැඟීම් දනවන අයුරින් තාලානුකූල ව ගීත ගායනා කරයි.
- ගීතයේ ඇති විශේෂ යෙදුම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ගීතය රස විඳිමින් අදහස් ප්‍රකාශ කරයි.
- ගීතයෙන් ධ්වනිත වන දේශාභිමානී හැඟීම් අගය කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- ඇමුණුම 1හි ඇති දේශාභිමානී ගීතය සුදුසු ක්‍රමවේදයක් මගින් ශිෂ්‍යයන්ට සවන්දීම සඳහා සූදානම් කර ගන්න.

**ප්‍රවේශය**

- **''මේ රට මගෙ රට මා ඉපදුණ රට**
  **හැදෙන වැඩෙන රට මගේ ම මවු රට''** යන ගීතය ගායනා කරමින් පාඩම සඳහා ප්‍රවේශ වන්න.'

**පාඩම සංවර්ධනය**

**පියවර 1**

- ගුරුවරයා විසින් ගායනා කරන ලද ගීතය කුමන ගීතයක් දැ'යි විමසමින් දේශාභිමානය පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක නිරත වන්න.
- දේශාභිමානය දනවීම සඳහා සාහිත්‍ය යොදා ගෙන ඇති ආකාරය ඇමුණුම 1හි ඇතුළත් ගීතය ඇසුරින් පැහැදිලි කරන්න.

**පියවර 2**

- ඇමුණුම 1හි ඇතුළත් ගීතය සියලු ශිෂ්‍යයන්ට සවන් දීමට අවස්ථාව ලබා දෙන්න.
- ගීතය පිළිබඳ ශිෂ්‍යයන්ගෙන් අදහස් විමසමින් සාකච්ඡාවක නිරත වන්න.
- ශිෂ්‍යයන්ට ද ගීතය ගායනා කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 3**

- ගීතය නැවත සවන්දීමට සලස්වා ගීතයෙන් ධ්වනිත වන අදහස් ඉස්මතු කරමින් රසාස්වාදය කරන්න. වස්තු විෂය, අත්දැකීම් සහ අලංකාරවත් භාෂාව යොදා ගෙන ඇති ආකාරය.

**පියවර 4**

- දේශාභිමානී හැඟීම් දනවන වෙනත් ගීත පිළිබඳ ශිෂ්‍යයන්ගෙන් විමසා එවැනි ගීත රසාස්වාදය කිරීමට යොමු කරන්න.

පියවර 5

- දේශාභිමානී හැඟීම් දනවන කවි,ගීත එක්රැස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරවන්න.

පියවර 6

- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කර ගන්න.
- එම නිර්ණායකවලට අදාළ ව ශිෂ්‍යයන් තක්සේරුකරණයට ලක් කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ ශිෂ්‍යයන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න. හැකිතාක් ක්‍රියාකාරකම්වල යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- දේශාභිමානී ගී කිහිපයක්
- දේශාභිමානී ගී ඇතුළත් සංයුක්ත තැටියක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- දේශාභිමානී ගී යනු මොනවා දැ'යි හඳුනා ගෙන ඉදිරිපත් කිරීම
- දේශාභිමානී හැඟීම් දනවන යෙදුම් ප්‍රකාශ කිරීම
- දේශාභිමානී ගී අගය කිරීම
- දේශාභිමානී ගීත එක්රැස් කිරීම

ඇමුණුම 01

## ලක් වැසියන් කෙරෙහි නැමී

ගායනය : සුනිල් එදිරිසිංහ
සංගීතය : රෝහණ වීරසිංහ
පද රචනය : එස්. මහින්ද හිමි

ලක් වැසියන් කෙරෙහි නැමී
අරහත් මහ මිහිඳු හිමි
පෙව්වෙ උතුම් සදහම් මී
පුත නුඹටත් පොවමි එමී
ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ
එය රැකගන්නට මෙලොවේ
සමත් වෙතොත් පුත නුඹ වේ ...

මෙබඳු උතුම් ලංකාවේ
දසතින් දුසිරිත් බෝවේ
මේ ගැන වැඩ කොළොත් ලොවේ
නුඹෙත් මගෙත් නම කියැවේ
ඉටු කොට කළ යුතු යුතුකම්
ලැබුණත් ලෝකෙන් ගැරහුම්
ඉවසන්නට පුළුවන්නම්
නුඹයි මගේ පුතා උතුම් ...

තමන් ලැබූ දිවි පෙවෙතේ
කොටසක් රට සමය වෙතේ
පුද නොකොළොත් නුඹෙන් පුතේ
මෙලොවට කිසි පලක් නැතේ
මේ ගැන වැඩ කොට ඉමහත්
ලැබෙන දුකක් හිරිහැරයක්
නිවනට සරිකොට සිතතොත්
නුඹයි මගේ පුතා සමත් ...

කාටත් හිමි පොදු දේ නම්
නැති බැරි හිග අවහිරකම්
මේ දේ මැඩගෙන දස්කම්
පෑම තමයි සුරුවිරුකම්
උස් තැන් දැක හැකිළෙන්නේ
මිටි තැන් දැක පුප්පන්නේ
නිවටුන් බව සිතමින්නේ
මගේ පුතා ලොකු වෙන්නේ ...